# එළවළු වගාව



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශණයකි

25

163

# එළවළු වගාව

DEPT. OF AGRICULTURE
CENTRAL
15 NOV 2012
LIBRARY
PERADENIYA

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම අමාත්‍යාංශය

නැවත මුද්‍රණය - 2012

**ප්‍රකාශක**

අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු අංශය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය, ශ්‍රී ලංකාව

දුරකථනය: 081 - 2388098
081 - 2388388

E-mail directoretc@gmail.com
Web www.agridept.gov.lk

| | | | | |
|---|---|---|---|---|
| පළමු | මුද්‍රණය | 2006 | පිටපත් | 5,000 |
| දෙවන | මුද්‍රණය | 2007 | පිටපත් | 7,500 |
| තෙවන | මුද්‍රණය | 2008 | පිටපත් | 20,000 |
| සිව්වන | මුද්‍රණය | 2009 | පිටපත් | 5,000 |
| පස්වන | මුද්‍රණය | 2010 | පිටපත් | 10,000 |
| හයවන | මුද්‍රණය | 2011 | පිටපත් | 5,000 |
| හත්වන | මුද්‍රණය | 2011 | පිටපත් | 10,000 |
| අටවන | මුද්‍රණය | 2012 | පිටපත් | 10,000 |

කෘෂිකර්ම මුද්‍රණාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - පේරාදෙණිය 2012/04 J 68/B 10,000 (S) (RP)

## විෂය දායකත්වය

| | |
|---|---|
| වම්බටු | ජී. පාලමකුඹුර |
| වැටකොළු | ඩී.පී.එස්. රත්නපාල |
| පතෝල | ඩී. සිරිවර්ධන |
| කරවිල | එන්. පරරාජසිංගම් |
| පිපිඤ්ඤා | වී. ශන්මුගනාදන් |
| වට්ටක්කා | ඩී. වීරසේකර |
| බණ්ඩක්කා | ජී.එස්.යූ. ලියනගේ |
| මෑ කරල් | ඩී.පී.එස්. රත්නපාල |
| දඹල | ආර්. රාධක්‍රිෂ්ණන් |
| තක්කාලි | රංජනී පීරිස් |
| බෝංචි | ආචාර්ය එච්.එම්. ආරියරත්න |
| රාබු | පී. මාලතී |
| කැරට් | ඩී.එම්. ගුණසේකර |
| බීට් | ජී.පී.සී. බාබු |
| ලීක්ස් | එස්. රිස්වරපච්චම් |
| මාළුමිරිස් | එස්. බණ්ඩාර |
| ගෝවා | ටී.එම්. බාලසුබ්‍රමනියම් |
| එළවළු තවාන් පාලනය | ඩබ්.පී.එම්.පී. දයාවංශ |
| කාබනික හා රසායනික පොහොර යෙදීම | ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන |
| එළවළු අපතේ යාම වලකා ගැනීම | ආචාර්ය කේ.එච්. සාරානන්ද |

## සංස්කරණය

කේ.එන්. මාන්කෝට්ටේ

## සැකසුම

ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය. ගන්නෝරුව

ඩබ්.ජී.පී සිසිරකුමාර

එම්.කේ.ඩී.එම් ශ්‍රියන්තා මැණිකේ

## පරිගණක කටයුතු

මාලා පෙරේරා

දේවිකා විනෝදනී

ලසන්තා වීරසිංහ

## චිත්‍ර

ධම්මිකා විජේසුන්දර

ඉන්ද්‍රානි හිනටිගල

නිශාන්ත ජයසිංහ

ලලිත් කුමාර

ජයසිරිලාල් ප්‍රනාන්දු

# පටුන


| | |
|---|---|
| වම්බටු | 1 |
| වැටකොළු | 4 |
| පතෝල | 6 |
| කරවිල | 9 |
| පිපිඤ්ඤා | 12 |
| වට්ටක්කා | 15 |
| බණ්ඩක්කා | 17 |
| මෑ කරල් | 20 |
| දඹල | 23 |
| තක්කාලි | 25 |
| බෝංචි | 31 |
| රාබු | 38 |
| කැරට් | 36 |
| බීට් | 30 |
| ලීක්ස් | 40 |
| මාළුමිරිස් | 42 |
| ගෝවා | 45 |
| එළවළු තවාන් පාලනය | 48 |
| කාබනික හා රසායනික පොහොර භාවිතයේ වැදගත්කම | 56 |
| එළවළු අපතේ යාම වලකා ගැනීම | 62 |

# වම්බටු

**සොලනම් මෙලන්ජිනා**

*Solanum melongena*

**කුලය - සොලනේසී**



## දේශගුණික අවශ්‍යතා

මුහුදු මට්ටමේ සිට මීටර් 1300 පමණ උස්වූ ප්‍රදේශ දක්වා වම්බටු වගා කල හැකිය. පහතරට තෙත්, අතරමැද හා වියළි කලාපවලද මැදරට තෙත් හා අතරමැද කලාපයේද, උඩරට අතරමැද කලාපයේද මෙම බෝගය ඉතා සාර්ථකව වගා කෙරේ.

## පස

හොඳින් ජලවහනය සිදුවන සැහැල්ලු පස් වම්බටු වගාවට සුදුසුය. පසෙහි පී.එච් අගය 5.5-5.8 පැවැතීම වඩා යෝග්‍යය.

## බිම් සකස් කිරීම

උදැල්ලකින් හෝ ට්‍රැක්ටරයක් මාර්ගයෙන් හෝ බිම පෙරලා, මට්ටම් කරන්න. වම්බටු මිරිස් වැනි සොලනේසී කුලයේ බෝග කන්න දෙකක්වත් වගා නොකල බිමක් වීම විශේෂයෙන් වැදගත්ය.

## නිර්දේශිත ප්‍රභේද

### එස්.එම්. 164

මෙම ප්‍රභේදය බැක්ටීරියා හිටුමැරීමට ඔරොත්තු දෙන, දම් වර්ණයෙන් යුතු ඵල ලබා දෙන ප්‍රභේදයකි. ඵල මධ්‍යම ප්‍රමාණයෙන් යුක්තවන අතර, හැඩයෙන් සිලින්ඩරාකාරය. පුෂ්ප දම් වර්ණයෙන් යුක්තය. මෙම ප්‍රභේදය තෙත්, වියළි හා අතරමැදි කලාපවලට සුදුසුය. ජල සම්පාදනය සහිතව වගා කිරීමෙන් හෙක්ටයාරයකට ටොන් 15-18 දක්වා අස්වැන්නක් ලබාගත හැකිය.

### තින්නවේලි දම්

මෙම ප්‍රභේදයේ ඵල තද දම්පාට දිලිසෙන ස්වභාවයකින් හා දිගටි හැඩයකින් යුතුය. පුෂ්ප, කඳ හා පත්‍ර නාරටි ද දම්පාටය. වැඩි වියලි දේශගුණයක් සහිත උතුරු ප්‍රදේශයට වඩා සුදුසුය.

### පාදාගොඩ

මෙම ප්‍රභේදයේ ඵල, දම්පාට ඉරි සහිතය. තරමක් පිම්බුනු සිලින්ඩරාකාර හැඩයක් ඇත. කඳ හා පත්‍ර නාරටි කොලපාටය. මල් ලා දම්පාටක් ගනී. බැක්ටීරියා අංගමාරයට ඔරොත්තු දෙන ප්‍රභේදයකි. තෙත් හා අතර මැදි කලාපවලට යෝග්‍යය.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයට ග්‍රෑම් 350

## තවාන් පිළියෙල කිරීම




වම්බටු සඳහා හොඳින් හිරුඑළිය ලැබෙන ස්ථානයක සැකසූ උස් තවාන් සුදුසුවන අතර, බීජ සිටුවීමට පෙර තවාන් පාත්ති පීවානුහරණය කල යුතුය. පාත්ති මතුපිට යොදන ලද පස්, ගොම 1 : 1 තුනී තට්ටුව මතුපිට අඟල් 6 පරතරය ඇතිව පේලි දිගේ බීජ දමා සියුම් පස් වලින් වසා, පිදුරු තට්ටුවකින් තවාන් ආවරණය කරන්න. මීටර් 1 පළල, මීටර් 3 දිග තවාන් පාත්තියක් බටු බීජ ග්‍රෑම් 30 සඳහා සෑහේ. දින 25-30 ගතවූ පසු, පැල ක්ෂේත්‍රයේ සිටුවීමට යෝග්‍ය තත්වයට පත් වේ.

යල කන්නයේදී වර්ෂාව ලැබීමත් සමග හා මහ කන්නයේ අධික වර්ෂාවෙන් පසු පැල සිටුවන්න.

## පරතරය

සෙන්ටිමීටර් 90×60 පරතරය ඇතිව සෙන්ටිමීටර් 30×30×30 ප්‍රමාණයට පිළියෙල කරගත් වලවල්වලට කාබනික පොහොර යොදා දින 25 - 30 වූ බීජ පැල, එක් වලක එක බැගින් සිටුවන්න.

ඉන්පසු ජල සම්පාදනය කොට, හිරු රශ්මිය අධිකව ඇත්නම් කොළ අතුවලින් ආවරණය කරන්න. සවස් වරුවේ පැල සිටුවීම වඩා යෝග්‍යය.

## පොහොර යෙදීම

වම්බටු වගාවේදී බීජ පැල සිටුවීම සඳහා පිළියෙලකල වලවල්වලට කාබනික පොහොර අවම වශයෙන් දෝනක් (ග්‍රෑම් 250-300) පමණවත් යෙදීමකල යුතුය. පැල සිටුවීමට දින 2 කට පෙර, මූලික පොහොර ලෙස යෙදිය යුතු රසායනික පෙහොර ප්‍රමාණයද වලවල්වලට යොදා පස් සමග කලවම් කරන්න.

## රසායනික පොහොර

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්වසුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක් | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| පැල සිටුවීමට පෙර | 75 | 325 | 85 |
| සති 4 දී | 75 | - | - |
| සති 8 දී | 75 | - | 85 |

## ජල සම්පාදනය

වියලි කලාපයේ වර්ෂා ජලයෙන්ද වම්බටු වගාකල හැකිය. සාර්ථක අස්වැන්නක් ලබාගැනීමට හා ලාභදායි වගාවක් ලෙස පවත්වා ගැනීම සඳහා ජල සම්පාදනයකල යුතුය. වියළි කාලගුණයක් ඇතිවිට අවම වශයෙන් දින 5 කට වරක් ජල සම්පාදනය කරන්න.

## වල් පැලෑටි පාලනය

වම්බටු පැල සිටුවා සති 2, 4, 7, 9, 12 යන අවස්ථාවලදී වල් පැල ඉවත් කිරීමකල යුතුයි.

## රෝග පාලනය

### බැක්ටීරියා හිටුමැරීම



බටු වගාවට හානිදායක ප්‍රධානතම රෝගය බැක්ටීරියා හිටුමැරීමයි. පොළවේ ජීවත්වන බැක්ටීරියාවක් මාර්ගයෙන් වැළදෙන මෙම රෝගය නිසා පළමුවෙන්ම පැල මලානික වීමත්, පසුව පැල මිය යැමත් සිදුවේ. මෙම රෝග පාලනය සඳහා ඔරොත්තු දෙන ප්‍රභේදයක් වගා කිරීම හා බෝග මාරුවක් අනුගමනය කිරීම වැදගත්ය.

# කෘමි පාලනය

## කරටි හා ගෙඩි විදින පණුවා

දිගින් දිගටම එකම කෙෂත්‍රයක බටු වගා කිරීමේදී මෙන්ම බටු වගාවෙන් පසු ශාක කොටස් නිදැල්ලේ භූමියේ දිරායැමට සැලැස්වීමෙන් ඊළඟ කන්නයේදී මෙම හානිය උත්සන්න වීමට ඉඩ ඇත.



### පාලනය

වගාකර ඇති ශාකවල කරටිවල මෙම හානිය පළමුවෙන්ම දක්නට ලැබුනු විට එම කරටි කොටස් ශාකයෙන් කඩා ඉවත්කර විනාශකර දමන්න.

කරටි විදින පණුවාගේ හානිය වැඩි වශයෙන් දක්නට ලැබෙන භූමියක බටු වගාකරන විට බටු පැල සිටුවන අවස්ථාවේදී සකසාගත් වලවල්වලට කාබොෆියුරාන් ස්වල්පයක් බැගින් යොදන්න.

මල් හා ගෙඩි හටගත් අවස්ථාවේදී සුදුසු කෘමි නාශකයක් ඉසීමෙන් මෙම හානිය පාලනයකර ගත හැකිය. නිර්දේශිත කෘමිනාශකයක් යොදා අවම වශයෙන් දින 7-10 ගතවූ පසු පමණක් අස්වැන්න නෙලන්න.

මෙයට අමතරව මයිටාවන් හා පත්‍ර කීඩෑවන් නිසාද බටු වගාවට හානි ඇතිවිය හැකිය.

# අස්වැන්න නෙලීම

වගාකර ඇති ප්‍රභේදය හා පාරිසරික තත්ව අනුව පැල සිටුවා සති 10-12 අතර දී පළමු අස්වැන්න නෙලා ගත හැකිය. මින්පසුව දින 7 කට වරක් බැගින් නැවත අස්වැන්න නෙලිය හැකිය. පිහියකින් නටුව කපා කරල් වෙන්කර ගන්න.

### අස්වැන්න

බටු වගාවක අස්වැන්න, ප්‍රභේදය හා වගා පාලනය මත වෙනස් වේ. ජල සම්පාදනය කොට නිර්දේශිත ප්‍රභේදයක් වගා කිරීමෙන් හෙක්ටයාර් එකකට ටොන් 15-18 දක්වා අස්වැන්නක් ලබාගත හැකිය. මෙම අස්වැන්න නෙලීම් වාර 8-10 මගින් ලබාගත හැකිය.

# පසු අස්වනු කටයුතු

නරක්වූ හා කෘමි හානිවලට ලක්වූ ගෙඩි ඉවත් කරන්න.

# වැටකොළු

**ලූෆා ඇකියුටැන්ගියුලා**

*Luffa acutangula*

**කුලය - කුකර්බිටේසී**



වැටකොළු ඉතා ජනප්‍රිය එළවළු බෝගයකි. එය පහතරට වියළි, අතරමැද හා තෙත් කලාපවලද, මැදරට තෙත් හා අතර මැද කළාපයන්හිද ආර්ථික බෝගයක් වශයෙන් වගාවේ.

## දේශගුණික අවශ්‍යතා

උෂ්ණ දේශගුණික තත්ව ප්‍රියකරන බෝගයකි. මුහුදු මට්ටමේ සිට මීටර් 500 පමණ උස් වූ ප්‍රදේශ දක්වා සාර්ථකව වැටකොළු වගාකළ හැකිය. තද වර්ෂාව සහිත කාලගුණික තත්ව වගාවට හිතකර නොවේ.

## පස

ඉතා හොඳින් ජලය බැස යන කාබනික ද්‍රව්‍ය අඩංගු වැලි ලෝම් පසක් වගාවට වඩා සුදුසුය. පසෙහි පී.එච් අගය 5.5 - 7.5 පමණ වීම යෝග්‍ය වේ.

## වගා කාලය

තෙත් කලාපයේ වසර පුරාම ද, වියළි කලාපයේ මහ කන්නයේදී ද ප්‍රධාන වශයෙන් වැටකොළු වගා වේ. යල් කන්නයේ ජල සම්පාදනය යටතේ වියළි කලාපීය ප්‍රදේශවල මෙම බෝගය සාර්ථකව වගාකළ හැකිය. කෙසේ වුවද තද වර්ෂාව සහිත කාලගුණික තත්ව පවතින කාල සීමාවන් මගහරවා වගාකල යුතුය.

## බිම් සැකසීම

බිම පෙරළා කැට පොඩිකර ගන්න. ඉන්පසු සෙන්ටි මීටර් 30×30×30 ප්‍රමාණයේ වලවල් නියමිත පරතරයට සකසා ගන්න. වගාව තුල අනවශ්‍ය පරිදි ජලය රඳා සිටීම වලකා ගැනීම සඳහා ගැඹුරු කානු කිහිපයක්ද සකස්කර ගන්න.

## නිර්දේශිත ප්‍රභේද

### එල්. ඒ. 33

අඳුරු තද කොල පැහැති දිගටි කරල් හටගන්නා ප්‍රභේදයකි.

### ආසිරි

මෙය නව නිර්දේශිත වැටකොළු ප්‍රභේදයයි. සෙන්ටි මීටර් 30 පමණ දිගකින් යුත් කරල් හටගනී. දැනට නිර්දේශිත එල්.ඒ. 33 වැටකොළු ප්‍රභේදයට වඩා වැඩි පාරිභෝගික රුචියක් මෙම ප්‍රභේදයට තිබේ. හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 8 පමණ සාමාන්‍ය අස්වැන්නක් ලබාගත හැකිය.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 3

## පරතරය

මීටර් 1.5 × 1.5

## බීජ සිටුවීම

සකසාගත් වලවල්වලට හොඳින් දිරාපත්වූ කාබනික පොහොර කූඩයක් පමණ බැගින් දමා මතුපිට පස් සමග කළවම් කරන්න. බීජ සිටුවීමට දින 2 - 3 පෙර නියමිත පරිදි මූලික පොහොරද වලට යොදා පසට මිශ්‍ර කරන්න.

එක් වලක එකිනෙකට තරමක් දුරින් බීජ 3-4 පමණ සෙන්ටි මීටර් 2 - 3 ගැඹුරින් සිටුවන්න. ඉන්පසු සිටවූ බීජවලට හොඳින් ජලය සපයන්න.

## පැල තුනී කිරීම

බීජ පැලවී සති 2 පමණ ගතවූ පසුව එක් ස්ථානයක පැල 2 පමණක් ඉතිරිකර සෙසු පැල ගලවා දමන්න.

## වැල් පුහුණු කිරීම

වැටකොළු වගාවකින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මීටර් 2 පමණ උස පන්දලමකට වැල් යොමුකළ යුතුයි. මේ සඳහා මීටර් 3 පමණ පරතරයට ශක්තිමත් කණු සිටුවා ඒ මත ලණුවලින් හෝ කම්බිවලින් පන්දලම සකසා ගත හැකිය. පන්දලම දක්වා වැලෙහි ප්‍රධාන කඳෙන් හට ගන්නා අංකුර ඉවත් කරන්න.

ගෙවතුවල වැටකොළු වගාකරන විට කම්බි වැටකට වුවද වැල් යැවීමකළ හැකිය.

## පොහොර යෙදීම

බීජ සිටුවීම සඳහා සකසා ගත් වලවල්වලට යෙදිය යුතු කාබනික පොහොරවලට අමතරව පහත සඳහන් අන්දමට රසායනික පොහොරද යොදන්න.

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්වසුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක් | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක් |
|---|---|---|---|
| මූලික පොහොර | 75 | 200 | 60 |
| පැල මතුවී සති 4 | 75 | - | 60 |
| පැල මතුවී සති 8 | 75 | - | 60 |

## වල් පැළෑටි පාලනය

වැටකොළුවලට ඇත්තේ නොගැඹුරු මූල පද්ධතියකි. එනිසා වල් පැළෑටි පාලනය කිරීමේදී මුල්වලට හානි නොවන පරිදි කටයුතු කිරීමට වගබලා ගන්න.

## කෘමි හා රෝග පාලනය

### ඉල් මැස්සා



පළතුරු මැස්සාගේ කීටයින් විසින් වැටකොළු කරල තුළ සිදුකරන හානිය නිසා කරල් කුණුවී යයි. මෙම හානිය වලකා ගැනීමට කෘමිනාශක යෙදීම අත්‍යාවශ්‍ය නොවේ. සෙන්ටි මීටර් 15 පළල හා සෙන්ටි මීටර් 40 පමණ දිග දෙපැත්තෙන්ම විවෘත වූ පොලිතින් කැබලිවලින් ලපටි කරල් ආවරණය කරන්න. මෙම පොලිතින් කැබලි ගෝනි ලණුවලින් නටුවට හෝ වැලට ගැටගසන්න. එමගින් ඵල ආරක්ෂා වේ.

### අවුලකපෝරා කෘමියා



බෝගය ලපටි අවධියේදී පත්‍රවලට හානි කරයි. කාබරිල් වැනි කෘමි නාශකයක් මේ සඳහා යෙදිය හැකිය.

පසෙහි දිගු කාලයක් ජලය රඳා පැවතුනහොත් පාමුල ප්‍රදේශය දිලීර වර්ග නිසා කුණුවීමකට භාජනය විය හැකිය. නිර්දේශිත දිලීර නාශකයක් වැල පාමුල ප්‍රදේශයට යෙදීම හා පසෙහි ජලවහනය දියුණු කිරීම මගින් මෙම තත්වය මග හරවා ගත හැකිය.

## අස්වැන්න නෙලීම

මේරීමට ප්‍රථම කරල් නෙලාගන්න. බෝගයේ වයස දින 60 - 70 දී පළමු අස්වැන්න ලබාගත හැකිය. ඉන්පසු දින 4 පමණ වරක් බැගින් මාස 1 1/2 -2 පමණ කාලයක් තුළදී අස්වනු වාර 10 - 15 පමණ නෙලාගැනීමට පිළිවන.

### අස්වැන්න සැකසීම

නෙලාගත් කරල් මතට තද හිරු රැස් වැටීමෙන් වලකාගන්න. කරල්වලට හානි නොවන සේ හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි කූඩවල අසුරන්න.

# පතෝල

**ට්‍රයිකොසැන්තස් කියුකමෙරිනා**

*Trichosanthes cucumerina*

**කුලය - කුකර්බිටේසී**



ශ්‍රී ලාංකිකයන් අතර ජනප්‍රිය එළවළු බෝගයක් වන පතෝල සම්භවය වී ඇත්තේ නිවර්තන ආසියාවේය. මාතලේ, නුවර, රත්නපුර, හම්බන්තොට, කුරුණෑගල වැනි දිස්ත්‍රික්කවල විශාල වශයෙන් මෙම බෝගය වගාවේ.

## දේශගුණික අවශ්‍යතා

උණුසුම් දේශගුණික තත්ව ප්‍රියකරන බෝගයකි. මුහුදු මට්ටමේ සිට මීටර් 500 පමණ උසක් දක්වා වූ ප්‍රදේශවල මෙය සාර්ථකව වගාකළ හැකිය. වියළි කලාපයේ යල් කන්නයේදී ද, තෙත් කලාපයේ වසර පුරාම ද පතෝල වගා කළ හැකිය. කෙසේ වුවද තද වර්ෂා කාල මග හැර වගා කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගත හැකිය.

## පස

කාබනික ද්‍රව්‍ය මැනවින් අඩංගු හොඳින් ජලය බැසයන පසක් වගාව සඳහා වඩා සුදුසුය. පසෙහි තිබිය යුතු පී.එච් අගය 5.5 - 7.5 පමණ වේ.

## බිම් සැකසීම

ඉඩම හොඳින් සී සා කැට පොඩිකර ගන්න. නියමිත පරතරයට සෙන්ටි මීටර් 30×30×30 ප්‍රමාණයේ වලවල් සකසා ගන්න.

## නිර්දේශිත ප්‍රභේද

### ටී.ජ්. 2

මීටරයකට වඩා දිග කරල් අළු සුදු පාටය. මේරීමත් සමග කරල්වල තද කොළ පාට ඉරි ඇති වේ.

### එම්.අයි. (කෙටි)

අළු සුදු පැහැති කරල මීටර් 1/2 පමණ දිගය.

### තින්නවේලි

කරලක දිග මීටර් 3/4 පමණ වේ. මාංසල බවින් වැඩි මෙම කරල් අළු-සුදු පාටය. මේරීමත් සමග කරලේ සුදු පැහැති ඉරි ඇතිවේ.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට - කිලෝ ග්‍රෑම් 4 කි.

## පරතරය

මීටර් 1.5×1.5 කි.

## සිටුවීම

දිරාපත්වූ කාබනික ද්‍රව්‍ය සහ මතුපිට පස් මිශ්‍රකර වල පුරවාගන්න. බීජ සිටුවීමට දින 2 - 3 පෙර එක් වලකට මූලික පොහොර ලෙස නිර්දේශිත රසායනික පොහාර ප්‍රමාණය යොදන්න.

සකසාගත් වලෙහි එකිනෙකට තරමක් දුරින් බීජ 3 පමණ සෙන්ටි මීටර් 2-3 පමණ ගැඹුරින් සිටුවා හොඳින් ජලය සපයන්න. දින 5-8 දී බීජ ප්‍රරෝහනය වේ.

## පැල තුනී කිරීම

බීජ පැල වී සති 2 පමණ ගතවූවිට එක් වලක නිරෝගී පැල 2 පමණක් ඉතිරිකර වැඩි පැල ගලවා දමන්න.

## වැල් පුහුණු කිරීම

මීටර් 2 පමණ උස ශක්තිමත් පන්දලමකට වැල් යොමු කරන්න. පන්දලමට පහතින් වැලෙහි ප්‍රධාන කඳෙන් හටගන්නා පාර්ශ්වික අතු ඉවත් කරන්න.

## පොහොර යෙදීම

පහත සඳහන් අන්දමට රසායනික පොහොර යොදා වගාවෙන් වැඩි අස්වැන්නක් ලබාගන්න.

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 75 | 200 | 60 |
| පැල මතුවී සති 4 | 75 | - | 60 |
| පැල මතුවී සති 8 | 75 | - | 60 |

## වල් පැලෑටි පාලනය

බෝගයේ මුල් අවස්ථාවේදී වල්පැල පාලනය පිළිබඳව සැලකිලිමත් වන්න. වැල් හොඳින් වැඩී මැස්ස ආවරණය කරගත් පසුව වල් පැලෑටි පාලනය එතරම් ගැටළුවක් නොවේ.

## ජල සම්පාදනය

බීජ ප්‍රරෝහනයවන තෙක් දිනපතාම පාහේ ජලය සපයන්න. ඉන්පසු අවශ්‍යතාවය අනුව වරින් වර ජලය සපයන්න. වැල් වටා වසුනක් යෙදීමෙන් වියළි කාලගුණික තත්ව පවතිනවිට පස වියළී යාම අඩුකර ගත හැකිය.



# කෘමි හා රෝග පාලනය

## ඉල් මැස්සා



කරල් තුල ඉල් මැස්සාගේ කීටයා විසින් සිදුකරන හානිය නිසා කරල් කුණුවේ. කුඩා අවධියේදීම පොලිතින් කවර යොදා කරල් ආවරණය කරන්න. දරුණු හානියක් පවතිනවිට ෆෙන්තියෝන් වැනි නිර්දේශිත කෘමිනාශකයක් වගාවට යොදන්න.

මෙයට අමතරව අවුලකපෝරා කුරුමිණියන්, හබල්පාද මකුණන් හා එපිලැග්නා කුරුමිණියන් නිසාද වගාවට හානි ඇති විය හැකිය.

මුල ගැටිති වටපණුවන් පාලනය කිරීම සඳහා බෝග මාරුව හා කාබනික පොහොර මැනවින් වගාවට යෙදීමකළ හැකිය. එසේම 3% කාබොෆියුරාන් කැට ග්‍රෑම් 2 පමණ බීජ සිටුවන අවස්ථාවේදී සෑම වලකටම යෙදීමද කල හැකිය.

පතෝල වගාවන් සඳහා යටිපුස් රෝගය හා පිටි පුස් රෝගය දරුණු ලෙස වැළඳිය හැකිය. එවිට නිර්දේශිත දිලීර නාශකයක් පත්‍රවලට යොදන්න. මෑදු කුණුවීම නිසා වැලෙහි පාදස්ථ කොටසට හානි ඇතිවුවහොත් පසෙහි ජලවහනය දියුණු කරන්න. පස බුරුල්කර වාතනය දියුණු කරන්න.

# අස්වනු නෙලීම

සිටුවා දින 60 - 75 දී අස්වනු නෙලීම ආරම්භකළ හැකිය. දින 4 කට වරක් පමණ බැගින් අස්වනු නෙලාගත හැකිය.

## අස්වැන්න

උසස් වගා පාලන තත්ව යටතේ හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 20,000 පමණ අස්වැන්නක් ලබාගත හැකිය.

## අස්වනු පරිහරණය



නෙලාගත් කරල්වලට තුවාලවීම වලකා ගැනීම සඳහා ලණු පැදුරු හෝ පොල් අතුවලින් ආවරණයකර මිටි බඳින්න. හොඳින් පරිහරණය කරන ලද කරල් දින 7-10 පමණ ගුණාත්මය පහත නොවැටී තබාගත හැකිය.

# කරවිල

**මොමෝඩිකා බාරන්ටියා**

*Momordica charantia*

**කුලය - කුකර්බිටේසී**



කරවිල අප රටෙහි ඉතා ජනප්‍රිය එළවළුවකි. එහි පවතින ඖෂධීය ගුණ නිසා කරවිල ආහාරයට ගැනීම පිළිබඳව මෑතක සිට විශේෂ උනන්දුවක් ඇති වී තිබේ.

## වගාවට සුදුසු ප්‍රදේශ

මුහුදු මට්ටමේ සිට මීටර් 1200 පමණ උස් වූ ප්‍රදේශ දක්වා මෙය සාර්ථකව වගාකළ හැකිය.

## පස

කාබනික ද්‍රව්‍ය බහුල, හොඳින් ජලය බැසයන පස් වඩා සුදුසුය. පසෙහි තිබිය යුතු පී.එච්.අගය 5.5 - 7.5 කි.

## නිර්දේශිත ප්‍රභේද

### එම්.සී. 43

මධ්‍යම ප්‍රමාණයේ ලා කොළ පැහැති කරල් මතුපිට දත් වැනි නෙරුම් පිහිටා ඇත.

### තින්නවේලි සුදු

තරමක් විශාල කරල් සුදු-කොළ පැහැතිය. කරල් මතුපිට, දිග අතට අඛණ්ඩව විහිදුන නෙරුම් ඇත.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 6 කි.

## පරතරය

මීටර් 1.5 × මීටර් 1කි.

## බිම් සැකසීම

සෙන්ටිමීටර් 20 - 30 පමණ ගැඹුරට පස පෙරලා කැට පොඩිකර ගන්න. සෙන්ටිමීටර් 30×30×30 ප්‍රමාණයේ වලවල් නිසි පරතරයට සකසා දිරාපත් වූ කාබනික පොහොර හා මතුපිට පස්වලින් පුරවන්න.

## සිටුවීම

මහ - ඔක්තෝම්බර් - නොවැම්බර්
යල - අප්‍රේල් - මැයි
එක් වලක බීජ 3 බැගින් සෙ.මී. 2 - 3 ගැඹුරින් සිටුවන්න.

මෙම බීජ අතර තරමක පරතරයක් තිබිය යුතුය. බීජ පැලවී සති 2 ගතවූ පසු එක් වලක පැල 2 බැගින් ඉතිරිකර ඉතිරි පැලය ගලවා දමන්න. බීජ සිටුවීමට පෙර රැයක් ජලයේ පෙගවීමෙන් ප්‍රරෝහණය ඉක්මන් වේ.

මෙයට අමතරව කුඩා පොලිතින් බඳුන්වල බීජ සිටුවා සකසා ගන්නා පැල සිටුවීම ද කළ හැකිය. මෙමගින් අයහපත් කාලගුණික තත්ව යටතේ බීජ සිටුවීමෙන් සිදුවිය හැකි හානි වලකී.

## වැල් පුහුණු කිරීම

බීජ සිටුවා සති 3 පමණ ගතවූ පසුව මීටර් 2 පමණ උස ශක්තිමත් මැස්සක් (පන්දලමක්) වෙත වැල් යොමු කරන්න. පන්දලමට පහළින් වැලෙහි හටගන්නා පාර්ශ්වික අංකුර කපා දමන්න.

## පොහොර යෙදීම

වලවල් සැකසීමේදී යෙදූ කාබනික පොහොරවලට අමතරව පහත සඳහන් අන්දමට රසායනික පොහොර ද වගාවට යොදන්න.

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ්පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 75 | 200 | 60 |
| පැල මතුවී සති 2 පසු | 75 | - | 60 |
| පැල මතුවී සති 5 පසු | 75 | - | 60 |

## ජල සම්පාදනය

වගාවට ප්‍රමාණවත්වන පරිදි පසෙහි තෙතමනය නිසි ලෙස පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී ජල සම්පාදනය කරන්න. පසෙහි අනවශ්‍ය පරිදි ජලය එක් රැස්වීම වගාවට අහිතකරය. වියළි කාලවලදී වැල් අවට වසුනක් යෙදීමෙන් පස ඉක්මණින් වියළී යාම වලකී.

## වල් පැළෑටි පාලනය

පැල කුඩා කාලයේදී වලවල් අසල වල් පැල උදුරා දමන්න. වගාවේ පසු කාලයේදී මුල්වලට හානි නොවන පරිදි වල් පැල උදළු ගා ඉවත් කරන්න.

## කෘමි පාලනය

### ඉල් මැස්සා



කරලේ වර්ධනයේ ඕනෑම අවස්ථාවකදී මෙම හානිය ඇතිවිය හැකිය. පළතුරු මැස්සාගේ කීටයින් කරවිල කරල තුළ සිදුකරන හානිය නිසා කරල් කුණු වී වැටී යයි.

#### පාලනය

වැල් අවට පොළව රේක්කයකින් ඇවිස්සීමෙන් පිළා අවස්ථාව විනාශ වේ. හානි වූ කරල් වගාවෙන් ඉවත්කර විනාශකර දමන්න. තුනී පොලිතිනයකින් හෝ ඝනකම් කඩදාසියකින් කුඩා අවස්ථාවේ සිට කරල් ආවරණය කරන්න.

ඇතුලත උෂ්ණත්වය වැඩි වී කරලට හානිවීම වලකා ගැනීම සඳහා ආවරණය කිරීමට යොදාගන්නා පොලිතිනයේ හෝ කඩදාසියෙහි පහළ කෙළවර විවෘතව තබන්න.

මෙම හානිය පාලනය කිරීම සඳහා කෘමි නාශකයක් යොදන්නේ නම් ෆෙන්තියෝන් 50% ඊසී හෙක්ටයාරයකට මිලි ලීටර් 1050 - 1400ක් මල් හටගන්නා අවස්ථාවේ සිට යොදන්න. ජලය සමග කෘමි නාශකය කළවම්කර යොදා ගන්නා මිශ්‍රණයේ සෑම ලීටරයකටම සීනි ග්‍රෑම් 25ක් ද කළවම් කරන්න. මෙම කෘමිනාශක යොදා දින 14 ගතවන තෙක් අස්වනු නෙලීම නොකරන්න.

## ගඩු මැස්සා

මෙම කෘමියාගේ කීටයා කරවිල වැල තුල සිට සිදුකරන හානිය නිසා එහි වැඩීම බාල වී කුරු වේ. කීටයා හානි කරන ස්ථානයෙහි වැල ප්‍රවේශමෙන් දෙකට පලා කීටයා ඉවත් කරන්න. හානිය දරුණුවේයැයි තීරණය කළහොත් කාබරිල් 85% කෘමි නාශකයෙන් ග්‍රෑම් 4.5 ජලය ලීටරයක බැගින් මිශ්‍රකර වගාවට යොදන්න.

# රෝග පාලනය

## යටිපුස් රෝගය

පත්‍ර මත කහ පැහැති කෝණාකාර පුල්ලි හටගනී. මෙම පුල්ලි පසුව දුඹුරු පැහැ වේ. අළු - සුදු පැහැති දිලීර බීජාණු පත්‍රයේ යටි පැත්තේ හටගනී. නිර්දේශිත දිලීර නාශකයක් මේ සඳහා යොදන්න.

## විචිත්‍ර වෛරස් රෝගය

කොළ හා කහ පැහැති විචිත්‍රයක් පත්‍ර මත ඇති වේ. රෝගී පත්‍ර විකෘති වේ. වැල්වල වර්ධනය බාල වේ. රෝගී වැල් දුටු විගස ගලවා විනාශ කරන්න.

# අස්වැන්න නෙලීම

හොඳින් වැඩී මෝරා ඇති අවස්ථාවේ කරල් නෙලාගන්න. වගාවට දින 60 - 75 වූ විට පළමු අස්වැන්න ලැබේ. ඉන්පසු දින 4 පමණ වරක් බැගින් අස්වනු වාර 10 - 14 පමණ ලබාගත හැකිය.

## අස්වැන්න

හෙක්ටයාරයකට ටොන් 20 පමණ අස්වැන්නක් ලබාගත හැකිය. කරල්වලට හානි නොවන පරිදි අසුරා වෙළඳ පොලට යවන්න.



# පිපිඤ්ඤා

**කියුකුම්ස් සැටයිවස්**

*Cucumis sativus*

**කුලය - කුකර්බිටේසී**



ඉතා ජනප්‍රිය එළවළු බෝගයකි. සම්ප්‍රදායික ලෙස පිසගත් ආහාරයක් වශයෙන් හා සලාද ආකාරයට ආහාරයට ගනු ලැබේ.

## දේශගුණික අවශ්‍යතා

තෙත් කලාපයේ වසර පුරාම ද, වියළි කලාපයේ මහ කන්නයේදී ද වගාකල හැකිය. මෙම බෝගය මුහුදු මට්ටමේ සිට මීටර් 1000 පමණ උස් වූ ප්‍රදේශ දක්වා වගාකල හැකිය. උෂ්ණ පරිසර තත්ව ප්‍රිය කරන බෝගයකි. බෝගයේ වර්ධනය සාර්ථක වීම සඳහා පැවතිය යුතු ප්‍රශස්ථ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් $30^0$ පමණ වේ.

## පස

විවිධ ආකාරයේ පස් වර්ග පවතින ඉඩම්වල පිපිඤ්ඤා වගාකල හැකිය. කාබනික ද්‍රව්‍ය මැනවින් අඩංගු හොඳින් ජලවහනයවන පස වගාව සඳහා වඩා සුදුසුය. පසෙහි දිගු කාලයක් ජලය රැඳ පැවතීමේ තත්වයට බෝගය ඉතා සංවේදීය. සුදුසු පී.එච්. අගය 5.5 - 7.5 වේ.

## බිම් සැකසීම

ඉඩමේ වල්පැල ඉවත්කර සෙන්ටි මීටර් 30 x 30 x 30 ප්‍රමාණයේ වලවල් නියමිත පරතයට සකසන්න.

දිරාපත්වූ කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 3 පමණ, මතුපිට පස් සමග කළවම්කර වලවල් පුරවා ගන්න. පොළව මට්ටමේ සිට සෙන්ටි මීටර් 10 පමණ උසට සිටින සේ මෙම මිශ්‍රණයෙන් වලවල් මුදුන්කර ගන්න.

# නිර්දේශිත ප්‍රභේද

## එල්.වයි. 58

ගෙඩිය කහපාටය. කළුපැහැති නෙරුම් ඇත. මධ්‍යම විශාලත්වයක් සහිත ගෙඩි සිලින්ඩරාකාරය.

# බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1 කි.
ග්‍රෑමයක බීජ 30 - 40 අඩංගු වේ.

# පරතරය

තනි වගාවක් සඳහා මීටර් 1 × මීටර් 1කි. බණ්ඩක්කා සමග මිශ්‍ර වගාවක් ලෙස ද පිපිඤ්ඤා වගාකළ හැකිය. එවිට ලබාදිය යුතු පරතරය සෙන්ටි මීටර් 120 × 90 කි. එකම වලෙහි බෝග දෙකටම අයත් බීජ සිටුවන්න.




# පැල තුනී කිරීම

එක වලක පැල 2 පමණක් ඉතිරිවන ලෙස සති 2 දී වැඩි පැල ගලවා දමන්න.

# පොහොර යෙදීම

| යෙදියයුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්වසුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 75 | 200 | 60 |
| පැල මතුවී සති 2 පසු | 75 | - | 60 |
| පැල මතුවී සති 5 පසු | 75 | - | 60 |

# වල් පැල පාලනය

බෝගය විසින් පොළව වසාගන්නා තෙක් වගාවේ වල් පැල පාලනය කිරීම පිළිබඳව සැලකිලිමත් වන්න. පිදුරු හෝ වියලි තණකොළ වැනි වසුන් යෙදීමෙන් ද වල් පැලවල වර්ධනය පාලනය කරගත හැකිය.

# ජල සම්පාදනය

බෝගයට අනවශ්‍ය පරිදි ජලය සැපයීම සුදුසු නැත පසෙහි තෙතමනය වැඩි වූ විට වැල් හා ගෙඩි කුණුවී යා හැකිය. එනිසා වගාව යටවන පරිදි ජලය හැරවීම නොකරන්න.

වැල පාමුලට අතින් ජලය ලබාදීම හෝ කානු දිගේ වගාවට ජලය ලබාදී සෙමින් පසට උරාගැනීමට සැලැස්වීම හෝ කරන්න. වගාවේ පිදුරු වැනි වසුනක් යෙදීමෙන් පස වියළීයාම අඩුකර ගත හැකිය.

# පරාගනය

මල් පරාගනය වන්නේ ප්‍රධාන වශයෙන් මී මැස්සන් මගිනි. ගෙඩි හටගන්නා මල් ඇතිවන්නේ පිරිමි මල් හටගැනීම ආරම්භ වූවාට පසුවය. වැඩි උෂ්ණත්වය සහ දිගු දිවාකාල පැවතීම මගින් ගෙඩි හටගන්නා මල් ඇතිවීම ප්‍රමාද කරයි.

# කෘමි පාලනය

## අවුලකපෝරා කුරුමිණියා



වැඩුන කුරුමිණියා විසින් පත්‍ර හා මල් ආදිය ආහාරයට ගනී. එමගින් ලපටි පැල සම්පූර්ණයෙන්ම විනාශ විය හැකිය. එසේම පැල ලපටි කාලයේදී, කීටයින්ගේ හානියට ද ගොදුරු විය හැකිය.

කාබරිල් 85% වැනි නිර්දේශිත කෘමිනාශකයක් අවශ්‍ය විට, සති 2 කට වරක් බැගින් යොදන්න

## එපිලැග්නා කුරුමිණියා



වැඩුන කෘමියා සහ කීටයා පත්‍ර ආහාරයට ගනී. ට්‍රයික්ලෝෆෝන් (ඩිප්ටරෙක්ස් 50%) නිර්දේශිත අන්දමට වගාවට යොදන්න.

## ඉල් මැස්සා



කීටයින් විසින් ගෙඩි ඇතුලත සිදුකරන හානිය නිසා ගෙඩි කුණුවී වැටී යයි.

පිලා අවධිය විනාශ කිරීමට පස අවුස්සන්න. හානිවු ගෙඩි වගාවෙන් ඉවත්කර විනාශකර දමන්න. ෆෙන්තියෝන් 50% කෘමිනාශකය මල් හටගන්නා අවස්ථාවේ සිට සති 2 වරක් වගාවට යොදන්න. ජලය සමග මිශ්‍රකරගත් කෘමිනාශක මිශ්‍රණයේ සෑම ලීටරයකටම සීනි ග්‍රෑම් 25 බැගින් කළවම්කර යෙදීම වඩා සුදුසුය.

## රතු මයිටාවන්

යුෂ උරාබීම නිසා පත්‍රවල කොළ පැහැය අඩුවී, දුඹුරු පැහැවී, පහසුවෙන් කැඩෙන සුළු ස්වභාවයකට පත් වේ. ඩයිමෙතොඒට් 40% නිර්දේශිත පරිදි යොදන්න.

## කුඩිත්තා හා සුදු මැස්සා

විචිත්‍ර වෛරස් රෝගය පතුරවන වාහකයන් වේ. රෝගී ශාක ගලවා විනාශකර දමන්න. ඩයිමෙතොඒට් 40% කෘමිනාශක සති 2 වරක් බැගින් යොදන්න.

# රෝග පාලනය

## යටි පුස් රෝගය

වර්ෂාකාලවලදී වැළඳිය හැකි දරුණුම රෝගයයි. රෝගය දරුණුවත්ම පත්‍ර හැලී යයි. පළමුව කහපැහැති කෝණාකාර පුල්ලි හටගත් පසුව දුඹුරුපාට වේ.

පත්‍රයේ යටි පැත්තේ අළු පැහැති බීජාණු දැකිය හැකිය. ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) කැප්ටාන්, මැන්කොසෙබ්, මැනෙබ් වැනි දිලීර නාශකයක් සති 2 වරක් බැගින් වගාවට යොදන්න.

## පිටිපුස් රෝගය

වැඩි පරිසර උෂ්ණත්වයක් පවතින අවස්ථාවලදී වැළඳිය හැකි රෝගයකි.

රෝගී පත්‍ර කහපාට වේ. පත්‍රයේ දෙපසම සුදු පැහැති බීජාණු දැකගත හැකිය. ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) වැනි දිලීර නාශකයක් රෝගය දරුණු අවස්ථාවලදී සතිපතා යොදන්න.

## මෘදු කුණුවීම

කඳෙහි පාමුල සහ පොළව සමග ස්පර්ශ වී ඇති ගෙඩිවල මෘදු කුණුවීමක් ඇති වේ. වගාව තුළ ජලවහනය දියුණු කරන්න.

## ඇන්ත්‍රැක්නෝස් රෝගය

බෝගයේ සියළුම වායව කොටස්වලට වැළඳිය හැකිය. පත්‍රවල පළමුවෙන් කුඩා කහපාට පුල්ලි හෝ තෙත් පැල්ලම් ඇතිවී පසුව ක්‍රමයෙන් විශාල වේ. විශාල පුල්ලිවල මැද සිදුරුවේ. ගෙඩිවල ගිළුනු තෙත් පැල්ලම් හටගනී.

ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) වැනි දිලීර නාශකයක් නිර්දේශිත අන්දමට යොදන්න.

# අස්වැන්න නෙලීම

ගෙඩි කහ පැහැවී ඇතිවිට නෙලාගන්න. පිහියක් වැනි ආයුධයකින් ගෙඩියේ නටුව කපාගන්න. වැල්වල පාර්ශ්වික ශාක සියල්ල වැඩීමට ඉඩ හැරියවිට හටගන්නා ගෙඩි, ප්‍රමාණයෙන් කුඩාවේ. අස්වනු නෙලන වාර ගණන වැඩිකළවිට වැඩි අස්වැන්නක් ලබාගත හැකිය.

## අස්වැන්න

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 20,000 - 25,000 කි.

## අස්වැන්න සැකසීම

නෙලාගත් ගෙඩිවල ගුණාත්මය අඩු නොවී සතියක් පමණ කාලයක් තබාගත හැකිය. මෙයට වඩා කල් ගතවූ ගෙඩි හැකිලීමට පටන්ගන්නා අතර අප්‍රසන්න රසයක්ද ඇති කරයි.

# වට්ටක්කා

**කියුකබිටා මැක්සිමා**

*Cucurbita maxima*

**කුලය - කුකර්බිටේසී**



ශ්‍රී ලාංකිකයන් අතර ඉතා ජනප්‍රිය එළවළු බෝගයකි. මෙය විවිධ ආකාරයට ආහාර සඳහා සකසා ගත හැකිය. අඩු වියදමකින් වැඩි ආදායමක් ලබාගත හැකි වීමත්, හොඳින් මේරූ ගෙඩි සෑහෙන කාලයක් සාර්ථකව ගබඩාකරගත හැකිවීමත් මෙම බෝගයේ විශේෂ ලක්ෂණ වශයෙන් සැලකිය හැකිය.

## දේශගුණික අවශ්‍යතා

මුහුදු මට්ටමේ සිට මීටර් 500 දක්වා වූ ප්‍රදේශවල වියලි හා අතරමැදි කලාපයේ වගාකල හැකි බෝගයකි.

## පස

හොඳින් ජලය බැස යන කාබනික ද්‍රව්‍ය අඩංගු පසක හොඳින් වැවේ. යෝග්‍ය පී.එච්. පරාසය 5.5 - 7.5 වේ.

## බිම් සැකසීම

සෙන්ටි මීටර් 20-30 ගැඹුරට පස පෙරලා තරමක් රළු වයනයක් ඇතිවන පරිදි කැට පොඩිකර ගන්න. දිග පළල හා ගැඹුර සෙන්ටි මීටර් 30 බැගින්වන පරිදි වලවල් සකස්කර ගන්න.

දිරූ කාබනික ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 05 ක් එක් වලකට එකතුකර මතුපිට පස සමග මිශ්‍ර කරන්න. ඒ මිශ්‍රණයෙන් පොළොව මටටමේ සිට සෙන්ටි මීටර් 10 ක් උසට වල පුරවන්න.

## නිර්දේශිත ප්‍රභේද

### ඒ.එන්.කේ.රුහුණු

ගෙඩි ඒකාකාරී හැඩයකින් යුක්තය. ප්‍රමාණයෙන් කුඩාය. (කිලෝ ග්‍රෑම් 2-2 1/2) කෙටිකාලීන ප්‍රභේදයකි. (මාස 2-2 1/2) කෙටි වර්ෂා කාලයක් වගා කිරීමට යෝග්‍යයි. කුඹුරු ඉඩම්වල, කන්න අතර කාලයේ ද වගාවට සුදුසුය. පිට පොත්ත ඝනය, මදය කහ පාටය. ප්‍රවාහනය කිරීමට ඉතා යෝග්‍ය වේ.

### දේශීය වර්ග

හැඩය හා ප්‍රමාණය විවිධාකාරය.
වර්ෂා ජලයෙන් නම්, කන්නයට පමණක් වගාකල හැකිය.
මදයේ පැහැය, කහ සිට තැඹිලි දක්වා වෙනස් වේ.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට බීජ කිලෝ ග්‍රෑම් 01 යි.

## සිටුවීමේ කාලය

### රුහුණු වර්ගය

ජලය සැපයීමකල හැකිනම් ඕනෑම කාලයක සිටුවීමකල හැක.

### දේශීය වර්ග

නියම කන්නයට වගා කිරීම වඩා සාර්ථකය.

## බීජ සිටුවීම

යල - මැයි මසදී
මහ - ඔක්තෝම්බර් මසදී

## පරතරය

ඒ.එන්.කේ. රුහුණු - මීටර් 2.5 × 2.5
දේශිය වර්ග - මීටර් 3 × 3

## පොහොර යෙදීම

| යෙදියයුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්වසුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 75 | 200 | 60 |
| පැල මතුවී සති 4 පසු | 75 | - | 60 |
| පැල මතුවී සති 8 පසු | 75 | - | 60 |

## ජල සම්පාදනය

බීජ පැලවී අවසන්වන තෙක් දිනපතා ජලය යොදන්න. පසුව දින 5-7 ට වරක් ජලය යෙදීම සෑහේ.

## වල් පැළෑටි පාලනය

පැලවී සති 03 කින් වල් නෙලීමකර (අතින් වල් නෙලීම වඩා සුදුසුයි) වසුනක් ලෙස පිදුරු යොදන්න.

## රෝග පාලනය

### යටි පුස් රෝගය

මෙම දිලීර රෝගය නිසා පත්‍ර මත කහ පැහැති කෝණාකාර පුල්ලි ඇති වේ. පත්‍ර දුඹුරුපැහැ ගැන්වී හැකිලී යයි. පත්‍ර යටි පැත්තේ අලු පැහැති බීජානු සමූහ දක්නට ලැබේ.

### පිටි පුස් රෝගය

දිලීරයක් මගින් ඇති වේ. පත්‍ර කහ පැහැ වේ. පත්‍රවල දෙපැත්තේම සුදු පැහැති බීජානු සමූහ දිස් වේ.

#### පාලනය

ධාරක පැළෑටි හා කුකර්බිටේසී කුලයට අයත් වල් පැළෑටි වර්ග විනාශ කිරීම.
නිර්දේශිත දිලීර නාශකයක් භාවිතා කිරීම.

### මෘදු කුණුවීමේ රෝගය (පිතියම් විශේෂ)

දිලීරයක් මගින් ඇති වේ. කඳෙහි පාමුල හා, එල මතුපිට මෘදු කුණුවීමක් හට ගනී.

#### පාලනය

අධික තෙතමන හා ආර්ද්‍රතාවය මග හැරීම.
පස බුරුල්කර වාතාශ්‍රය දියුණු කිරීම.
නිර්දේශිත දිලීර නාශකයක් යෙදීම.

### විචිත්‍ර වෛරසය

පත්‍ර මත කොළ හා කහ පැහැති පුල්ලි ඇතිවේ. පත්‍ර බොකුටු වී රැලි වැටී, පැල්ලම් ද ඇතිවේ.

#### පාලනය

රෝගී පැල උදුරා විනාශ කරන්න.
කෘමිනාශක යොදා සුදුමැස්සන් වැනි රෝග වාහකයන් මර්දනය කරන්න.

## කෘමි පාලනය

### ඉල් මැස්සා



මෙම මැස්සාගේ ගැහැණු සතා කුඩා ගෙඩි වල පොත්ත විද බිත්තර දැමීම නිසා ඇතිවන කීටයන් (පනුවන්) ඇතුලත කොටස් කා දැමීමෙන් ගැට හා මල් හැලීම හා ගෙඩි කුණුවී යාම සිදුවේ.

#### හානිය වලක්වා ගැනීම හා මර්දනය

පිදුරු ස්වල්පයකින් එල ආවරණය කිරීම.
ෆෙරමෝන් උගුල් භාවිතය.
ආසාදිත ගෙඩි කඩා විනාශකර දැමීම.

#### ඇම තැබීම

පෙන්තියෝන් කෘමි නාශකය සමග සීනි මිශ්‍රකර, පිපිඤ්ඤා කුලයේ ගෙඩි කැබලි එම ද්‍රාවනයේ විනාඩි 10 ක් පමණ ගිල්වා තබා වගාව තුල තැනින් තැන තබන්න.

#### කෘමිනාශක භාවිතය

පෙන්තියෝන් නිර්දේශිත ප්‍රමාණය ජලයේ මිශ්‍රකර එයින් ලීටර් 1 ට සීනි ග්‍රෑම් 25 ක් මිශ්‍රකර ඉසින්න. මල් පිපෙන අවස්ථාවේ සිට සති 02 කට වරක් යෙදීම කළයුතුය.

## අස්වැන්න නෙලීම

ගෙඩි මත පිටිමය ස්වභාවයක් දිස්වන විට නෙලා ගන්න.

ජ්.එන්.කේ. රුහුණු - මල් පිපී දින 40
දේශීය වර්ග - මල් පිපී දින 60

### අස්වැන්න

සෑම වර්ගයකම අස්වැන්න හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 15000-25000 පමණ වේ.

### පසු අස්වනු කටයුතු

හොඳින් මෝරන ලද ගෙඩි වියළි ස්ථානයක මාස 6-8 ක කාලයක් ගබඩාකර තබාගත හැක.

# බණ්ඩක්කා

**ඇබෙල්මොස්චස් එස්කියුලැන්ටස්**

*Abelmoschus esculantus*

**කුලය - මැල්වේසී**



ශ්‍රී ලංකාවේ, උඩරට තෙත් කලාපය හැර අනෙක් ඕනෑම දේශගුණික කලාපයක වගාකළ හැකි එළවළු බෝගයකි. පහසුවෙන් වගා කිරීමට හැකි වීමත්, වර්ෂය පුරාම අස්වනු ලබාදීමේ හැකියාවත් නිසා බොහෝ එළවළු ගොවීන් අතර බණ්ඩක්කා බෝගය ප්‍රචලිත වෙමින් පවතී. දැනට හම්බන්තොට, කුරුණෑගල, රත්නපුර සහ මාතලේ දිස්ත්‍රික්කවල එය සාර්ථකව වගා කරන අතර, අනුරාධපුර, පුත්තලම, මාතර, බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි ද එය ව්‍යාප්ත වෙමින් තිබේ.

මෙහි ප්‍රධාන වශයෙන්ම ආහාරයට ගනු ලබන්නේ ලපටි කරල් වේ. නමුත් ඉන්දියාව, අප්‍රිකාව වැනි රටවල බණ්ඩක්කා කොළද ජනප්‍රිය එළවළුවක් ලෙස ආහාරයට ගැනේ.

විවිධ ආකාරයට ආහාර සඳහා සකස්කර ගත හැකි වීමත්, එහි පෝෂණ ගුණයත් නිසා පාරිභෝගිකයන් අතර බණ්ඩක්කා සඳහා හොඳ ඉල්ලුමක් තිබේ. ලපටි කරල්වල ප්‍රෝටීන, කෙඳි වර්ග, ඛණිජ, මේද සහ විටමින අඩංගු වේ. ඛණිජ අතරින් කැල්සියම් හා අයඩින් ප්‍රධාන තැනක් ගනී. එනිසා අයඩින් ඌණතාවය නිසා ඇතිවන ගලගණ්ඩය වැනි රෝග වලක්වා ගැනීමේදී මෙය වැදගත් මෙහෙයක් ඉටු කරයි.

## පස

ආම්ලික හෝ ක්ෂාරීය නොවන මනා ජල වහනයක් සහිත පසක් බෝගයේ සාර්ථක වර්ධනය සඳහා යෝග්‍ය වේ.

## නිර්දේශිත ප්‍රභේද

### එම්.අයි - 5

වියලි කලාපයේ මාස් කන්නය සඳහා ද අනෙක් කලාපවල යල, මහ දෙකන්නයටම ද යෝග්‍ය වේ. කරල් ලා කොල පැහැයට හුරුය. පත්‍ර විචිත්‍ර වෛරස් රෝගයට පාත්‍ර වේ. දින 55-60 කදී පළමු අස්වැන්න නෙලා ගත හැක.

### එම්.අයි - 7

වියළි කලාපයේ යල් කන්නය සඳහා ද, අනෙකුත් කලාපවල යල, මහ දෙකන්නයටම ද යෝග්‍ය වේ. කරල් ලා කහ පැහැතිය. පත්‍ර විචිත්‍ර වෛරස් රෝගයට පාත්‍ර වේ. දින 55-60 කදී පළමු අස්වැන්න නෙලා ගත හැක.

### හරිත

තෙත් කලාපයට වඩා වියළි කලාපයේදී වඩාත් හොඳ වර්ධනයක් පෙන්වයි. යල මහ දෙකන්නයටම යෝග්‍ය වේ. කරල් කොල පැහැතිය. පත්‍ර විචිත්‍ර වෛරස් රෝගයට ඔරොත්තු දේ. දින 50 කදී පමණ පළමු අස්වැන්න නෙලා ගත හැකිය.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4.5 කි

## සිටුවන කාලය

මහ කන්නයේදී සැප්තැම්බර් මස මුල සිට ඔක්තෝබර් මස මුල දක්වාත්, යල කන්නයේදී අප්‍රේල් මස සිට මැයි මස මුල දක්වාත් වගාව ඇරඹීම සඳහා සුදුසුය.

## සිටුවීම හා පරතරය

සෙන්ටි මීටර් 90×60 පරතරයට සෙන්ටි මීටර් 30 ක් පමණ උස, පළල හා ගැඹුර ඇති වලවල් සකස්කර ඒවා දිරාපත්වූ ගොම පොහොර හෝ කොම්පෝස්ට් වලින් පුරවා ගැනීමෙන් පසු බීජ 3-4 ක් බැගින් එක වලක සිටුවන්න. බීජ ප්‍රරෝහණය වේගවත් කිරීම සඳහාත්, ඒකාකාරී වගාවක් ලබා ගැනීම සඳහාත් බීජ සිටුවීමට පෙර පැය 24 ක කාලයක් ජලයේ පොගවන්න. බීජ සිටුවා සති 2 කට පසු එක් වලක නිරෝගී ශක්තිමත් පැල දෙකක් බැගින් ඉතිරිවන සේ වැඩි පැල ඉවත් කරන්න.

## පොහොර යෙදීම

| යෙදිය යුතු කාලය | යූරියා හෙ/කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ/කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ/කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 100 | 200 | 50 |
| පැල මතුවී සති 4 | 100 | - | 50 |
| පැල මතුවී සති 8 | 100 | - | 50 |

## වල් පැලෑටි පාලනය

බීජ සිටුවා සති 2-4 දීත්, මල් හටගැනීම ආරම්භ වූ අවධියේදීත් වල් මර්දනයකළ යුතුවේ.

## කෘමි පාලනය

### පත්‍ර කීඩෑවන්

වගාවේ වයස සති 2-3 සිට කීඩෑ උවදුරට පාත්‍ර විය හැක. රෝගය බරපතල නම් නිර්දේශිත කෘමිනාශක යොදන්න.

### කරටි සහ කරල් විදින්නා

ලපටි පැලවල කරටි විදීම හා කරල් මත සිදුරු ඇති කරයි. හානිය අධික නම් නිර්දේශිත කාමිනාශක යොදන්න.

### කොල හකුලන දළඹුවා

පත්‍ර හැකිලීම සිදු කරයි. හානි වූ පත්‍ර විනාශ කිරීම මගින් රෝගය වලක්වා ගත හැක. හානිය අධික නම් පමණක් නිර්දේශිත කෘමිනාශක යොදන්න.

## රෝග පාලනය

### පිටිපුස් රෝගය

පත්‍ර මතු පිට සුදු පැහැති පැල්ලම් දැකිය හැකිය. හානිය අධික නම් නිර්දේශිත දිලීර නාශකයක් යොදන්න.

### විචිත්‍ර වෛරස් රෝගය

බෝගයේ මුල් වර්ධන අවධියේදී මෙය වැලඳුනහොත් අස්වැන්න 80% ක් පමණ අඩු වේ.



රෝගය වලක්වා ගැනීම සඳහා නිර්දේශිත කාලයේදී බීජ සිටුවීම, වාහක කෘමීන් විනාශ කිරීම, ධාරක ශාක විනාශ කිරීම, රෝගයට පාත්‍ර වූ පැල ගලවා විනාශ කිරීමකළ යුතුය. නමුත්, වඩාත් සාර්ථක වන්නේ ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීමයි.

## අස්වනු නෙලීම



බීජ සිටුවා දින 50 සිට 100 දක්වා කාලය තුළ වාර කිහිපයක් අස්වනු නෙලිය හැක. ගුණාත්මය පවත්වා ගැනීම සඳහා දිනක් හැර දිනක් ලපටි කරල්වල නටුව පිහියකින් කපා නෙලා ගන්න.

### අස්වැන්න

දේශගුණික කලාපය, කන්නය හා ප්‍රභේද අනුව අස්වනු ප්‍රමාණයන් වෙනස් වේ. සාමාන්‍යයෙන් හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 10-15 ක් පමණ අස්වැන්නක් ලබාගත හැකිය.

### අස්වැන්න සැකසීම

කරල් නෙලාගත් පසුව තද සූර්යාලෝකයට නිරාවරණය නොකරන්න. රෝග හා කෘමි හානිවලට ලක්වූ කරල්, විකෘති හැඩයක් සහිත හා මේරූ කරල් තෝරා ඉවත් කරන්න.

හොඳින් වාතාශ්‍රය ලැබෙන ඇසුරුම්වල බහා ප්‍රවේශමෙන් වෙළඳපොලට යවන්න.

# මෑ

**විග්නා අන්ගුයිකියුලාටා**

*Vigna unguiculata*

**කුලය - ෆැබේසී**



ශ්‍රී ලාංකිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය එලවළු බෝගයක් ලෙස මෑ හැඳින්විය හැක. මෑ වගී ඉතා හොඳින් වගාකළ හැකි වන්නේ පහත රට තෙත්, අතරමැද හා වියළි කලාපීය ප්‍රදේශවලය.

## පස

වැලි ලෝම් පස් වගාව සඳහා වඩා සුදුසුය. පසෙහි තිබිය යුතු යෝග්‍යතම පී.එච්. අගය 5.6 - 7 වේ. ජල වහනය දුර්වල ස්ථානවල සහ මැටි අධික පස්වල වගා නොකළ යුතුය.

## බිම් සැකසීම

සෙන්ටි මීටර් 15-20 පමණ ගැඹුරකට පස පෙරළා කැට පොඩිකර ගන්න. තද වර්ෂා කාලයන්හි ජලය රඳා සිටීමට ඉඩ ඇති ස්ථානවල උස් පාත්ති සකසන්න.

ජල සම්පාදනය යටතේ වගාකරන අවස්ථාවේදී වැටි හා කානු සකසන්න. පාත්ති නොසාද සමතලා බිමෙහි වගා කරන්නේ නම්, විශේෂයෙන් මහ කන්නයේදී ඉඩමෙහි ජලවහන කානු සැකසීම වැදගත්ය.

# නිර්දේශිත ප්‍රභේද

### හවරි මෑ

වැලක් ආකාරයට වර්ධනය වේ. ලා කොළ පැහැති දිගු කරල්වල අග කෙළවර දම් පැහැතිය. බීජ කළු පැහැතිය. දින 60 - 70 අස්වනු නෙලීම ආරම්භකළ හැකිය.

### පොළොන් මෑ

වැලක් ආකාරයට වර්ධනයවේ. තද දිග පැහැති කරල්වල දම් පැහැති පැල්ලම් ඇත. ක්‍රීම් පැහැති බීජවල බීජ ලපය ප්‍රදේශය කළුය. දින 60 - 70 දී අස්වනු නෙලීම ආරම්භකළ හැකිය.

### බුෂිටාවෝ (දේශීය)

පඳුරක් ආකාරයට වර්ධනයවේ. ලා කොළ පැහැති මධ්‍යම ප්‍රමාණයේ දිගකින් යුත් කරල් හටගනී. ක්‍රීම් පැහැති බීජවල බීජ ලපය ප්‍රදේශය දුඹුරු පැහැතිය. දින 45 - 50 දී අස්වැන්න නෙලීම ආරම්භකළ හැකිය.

### බි. එස්. 1

පඳුරක් ආකාරයට වර්ධනයවන මෙහි කරල් ලා කොළ පාටය. ක්‍රීම් පැහැති බීජවල දුඹුරු පැහැති පැල්ලම් ඇත. දින 45 - 50 දී අස්වැන්න නෙලීම ආරම්භකළ හැකිය.

### සේන

පඳුරු ආකාරයට වර්ධනයවන මෙම ප්‍රභේදයේ හටගන්නා මාංසල කරල් කොළ පැහැතිය. බීජ ක්‍රීම් පැහැතිවන අතර, බීජ ලපය රතු දුඹුරු පැහැතිය. දින 45 - 50 දී අස්වැන්න නෙලීම ආරම්භකළ හැකිය.

### පඳුරු පොළොන් මෑ

පඳුරු ආකාරයට වර්ධනයවන මෙම ප්‍රභේදයේ හටගන්නා කරල් මධ්‍යම ප්‍රමාණයේ දිගකින් යුක්තවේ. කොළ පැහැති කරල් මතුපිට දම් පැහැති පැල්ලම් දක්නට ලැබේ. ආහාරයට සකසාගත් විට සාමාන්‍ය පොළොන් මෑවල රසය ගෙනදෙයි. බීජ ක්‍රීම් පැහැතිවන අතර, බීජ ලපය කළු පැහැතිය. දින 45 - 50 දී අස්වැන්න නෙලීම ආරම්භකළ හැකිය.

## බීජ අවශ්‍යතාවය

පඳුරු ආකාරයේ වර්ග - හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 17 - 20
වැල් ආකාරයේ වර්ග - හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 16 - 20

## වගා කාලය

වියළි කලාපයේ මහ කන්නයේ දී නොවැම්බර් මස අවසාන භාගයේ දී වගාව ආරම්භ කරන්න. යල් කන්නයේ අහස් දියෙන් වගා කරන්නේ නම් මාර්තු හෝ අප්‍රේල් මාසවලදී බීජ සිටුවිය යුතුවන අතර, ජල සම්පාදනය යටතේ නම් අප්‍රේල් හෝ මැයි මාසවලදී වගාව ආරම්භකළ යුතුය.

තෙත් කලාපයේ මෙම බෝග වගාකළ යුත්තේ තද වර්ෂා කාලයට පසුවය.

## පරතරය

පඳුරු මෑ වර්ග - සෙන්ටි මීටර් 60-75 × සෙන්ටි මීටර් 20
වැල් ආකාරයේ මෑ වර්ග - සෙන්ටි මීටර් 90 × සෙන්ටි මීටර් 30
ආධාරක කෝටු වෙත වැල් වැඩීමට සලසන්න.



## පොහොර යෙදීම

බීජ සිටුවීමට පෙර දිරාපත් වූ කාබනික පොහොර යොදා පසට කළවම් කරන්න. එයට අමතරව පහත සඳහන් අන්දමට රසායනික පොහොරද වගාවට ලබා දෙන්න.

| යෙදිය යුතු කාලය | යූරියා හෙ/කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ/කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ/කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 45 | 130 | 65 |
| මාසයකට පසු | 45 | - | - |

## ජල සම්පාදනය

වගාවේ මුල් අවධියේ දී දින 4 පමණ වරක් බැගින් ද, ඉන්පසු සතියකට වරක් බැගින් ද, ජලය සපයන්න. පසෙහි තෙතමනය වැඩිවීම නිසා පාමුල කුණුවීමේ රෝගය වැළදීමට ඉඩ තිබේ.

## වල් පැළෑටි පාලනය

සති 2 සහ 4 දී වගාවේ වල් පැළෑටි ඉවත් කරන්න.

## කෘමි පාලනය

කිහිප වර්ගයකට අයත් කරල් විදින දළඹුවන්, පත්‍ර කිඩැවන්, කුඩිත්තන් සහ පිටි මකුණන් නිසා මෑ වගාවලට හානි සිදුවිය හැකිය. දරුණු මට්ටමේ හානියක් පවතින අවස්ථාවලදී පමණක් නිර්දේශිත කෘමිනාශක යොදා එකී කෘමීන් පාලනය කිරීමට කටයුතු කරන්න.

කෘමිනාශක යෙදීමට පෙර සුදුසු අවස්ථාවට පත්වී ඇති කරල් නෙලා ගැනීමට කටයුතු කරන්න. කෘමි නාශක ලේබලයේ සඳහන් පෙර අස්වනු කාලය ගත වීමට පෙර, නැවත අස්වැන්න නෙලීම පාරිභෝගික සෞඛ්‍යයට අහිතකරය.

## රෝග පාලනය

### පාමුල කුණුවීම

පත්‍ර කහ පාටවන අතර, රෝගී පැල මැලවී යයි. කඳ පාමුල ප්‍රදේශයෙන් දුඹුරු පැහැති දූර්වර්ණවීමක් ඇති වී එය ක්‍රමයෙන් ඉහළ ප්‍රදේශය දක්වා වර්ධනයවේ.

බෝග මාරුව පසෙහි අධික තෙතමන තත්වයක් ඇති නොවීමට වග බලා ගැනීම හා වැඩිපුර නයිට්‍රජන් අඩංගු රසායනික පොහොර නොයෙදීම ආදිය කෙරෙහි වැඩි අවධානයක් යෙදීමෙන් රෝගය පාලනයකර ගත හැකිය. රෝගය දරුණු තත්වයට පත්වී ඇත්නම් නිර්දේශිත දිලීර නාශකයකින් පස තෙත්කළ යුතුය.

### අළු පැහැති කඳ අංගමාරය

මෙය තෙත් කලාපයේ වගාවන් සඳහා බහුල වශයෙන් වැළදිය හැකි රෝගයකි. රෝගය ඇතිවන්නේ මැක්‍රොෆෝමිනා ෆේසියෝලි නැමැති දිලීරය නිසාය.

මෙම රෝගය කුඩා පැලවලට මෙන්ම තරමක් වැඩුන පැලවලටද වැළදිය හැකිය. මූලික රෝග ලක්‍ෂණ වශයෙන් අළු දුඹුරු පැහැති ගිල්වුන ස්වභාවයක් ගන්නා වියළි පැල්ලම් කඳෙහි පාදස්ථ ප්‍රදේශයෙහි ඇති වේ. ශාකය ක්‍රමයෙන් වැඩෙත්ම, මෙම රෝග පැල්ලම් පැලෑටියේ අග්‍රස්ථ ප්‍රදේශය දක්වා ක්‍රමයෙන් විශාල වේ. එවිට ක්‍රම ක්‍රමයෙන් පැලෑටිය මැල වී පසුව මැරී යයි. රෝගී ගස්වල පත්‍ර කහපාට වී මැරියාමද සිදුවේ. රෝගය දරුණු මට්ටමින් පවතින වගාවන්හි විශාල අස්වනු හානියක් ඇතිවිය හැකිය.

පඳුරු පොළොන් මෑ ප්‍රභේදය මෙම රෝගයට හොඳින් ඔරොත්තු දෙන අතර බී.එස්. 1 ප්‍රභේදය එයට විශාල වශයෙන් ගොදුරු වේ. සේන සහ බුෂිටාවෝ දේශීය ප්‍රභේද මෙම රෝගයට මධ්‍යස්ථ මට්ටමකින් ඔරොත්තු දේ. වගාවට සති 4 පමණ වයස් වූ විට ටෙබුකොනසෝල් (ෆොලිකර්) දිලීර නාශකය යෙදීමෙන් සාර්ථකව රෝගය පාලනය කරගත හැකිය.

## අස්වැන්න නෙලීම

පඳුරු ආකාරයේ වර්ගවල සෑම දින 3 - 4 වරක් බැගින් අස්වනු වාර 7 - 12 පමණ ලබාගත හැකිය. වැල් ආකාරයේ වර්ග වලින්ද සෑම දින 3- 4 වරක් බැගින් අස්වනු වාර 15 - 16 පමණ ලබාගත හැකිය.

### අස්වැන්න

පොළොන් සහ හවරි මෑ - හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 12
බුෂිටාවෝ දේශිය - හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 10
පඳුරු පොළොන් මෑ - හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 9

# දඹල

**සොෆොකාපස් ටෙට්‍රාගොනොලෝබස්**

*Psophocarpus tetragonolobus*

**කුලය - ෆැබේසී**



මුහුදු මට්ටමේ සිට මීටර් 2000 පමණ උස් වූ ප්‍රදේශ දක්වා වගාකළ හැකි බෝගයකි. පාරම්පරිකව වගාකරන ලද දඹල ප්‍රභේදවලින් අස්වනු ලබාගත හැකිවූයේ මහ කන්නයේදී පමණකි. එයට හේතුව එම ප්‍රභේදවල මල් පිපීම සඳහා කෙටි දිවා කාල තිබිය යුතුවූ නිසාය. නමුත් වර්තමානයේදී වසර පුරාම වගාකර අස්වනු ලබාගත හැකි නව ප්‍රභේද බිහිකර තිබේ.

## පස

වැලි සහිත පස්වල මෙන්ම මැටි අධික පස්වලද වගාකළ හැකි බෝගයකි. නමුත් හොඳින් ජලය බැසයන, කාබනික ද්‍රව්‍ය මැනවින් අඩංගු, වැලි ලෝම් සහ මැටි ලෝම් පස් වගාව සඳහා වඩා සුදුසුය.

## බිම් සැකසීම

ගැඹුරට බිම පෙරළා කැට පොඩිකර ගන්න. ඉඩමෙහි ජලය රඳා සිටීමේ අවදානමක් පවතිනම් උස් පාත්ති හෝ වැටි හා කානු ආකාරයට ඉඩම සකස්කර ගන්න.

## නිර්දේශිත ප්‍රභේද

### එස්.එල්.එස්. 44

වසර පුරාම වගාකර සාර්ථක අස්වැන්නක් ලබාගත හැකි වර්ගයකි. කරල් කොල පැහැතිය. කරලක සාමාන්‍ය බර ග්‍රෑම් 15 පමණ වේ.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 21-23 කි.

## පරතරය

සෙන්ටි මීටර් 75 × සෙන්ටි මීටර් 60 කි.

## වගා කාලය

වර්ෂා කාලය ආරම්භයත් සමග බීජ සිටුවන්න. එක් වලක සෙන්ටි මීටර් 2-5 පමණ ගැඹුරින් බීජ 2-3 පමණ සිටුවිය යුතුය.

## පොහොර යෙදීම

හොඳින් දිරාපත් වූ කාබනික පොහොර, සකසාගත් වලවල්වලට යොදා පස් සමග හොඳින් කළවම් කරගන්න. මෙයට අමතරව පහත සඳහන් ආකාරයට රසායනික පොහොර ද වගාවට ලබාදෙන්න.

| යෙදිය යුතු කාලය | යූරියා හෙ/කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්ෆේට් හෙ/කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ/කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 45 | 220 | 65 |
| පැල මතුවී සති 4 | 20 | - | - |
| පැල මතුවී සති 10 | 20 | - | - |

## ආධාරක සිටුවීම

වලවල් අසලින් සිටුවාගත් ආධාරක කණු වෙත වැල් පුහුණු කරන්න.



## ජල සම්පාදනය

වියළි කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවලදී සතියකට වරක් පමණ බැගින් වගාවට ජලය සපයන්න. වැලි අධික පස් සහිත ඉඩම්වල වගාකර ඇතිවිට මෙයට වඩා අඩු කාල පරතරයකින් ජලය ලබාදීමට සිදුවනු ඇත.

## වල් පැලෑටි පාලනය

ආරම්භක අවස්ථාවේදී දඹල බෝගය ඉතා සෙමින් වර්ධනයවන නිසා මෙම කාලයේදී වල් පැලෑටි පාලනය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වන්න. බීජ ප්‍රරෝහණය වී සති 1, 3, 5, 7 සහ 12 දී වල් පැලෑටි පාලනය කිරීම විශේෂයෙන් නිර්දේශ කරනු ලැබේ.

## කෘමි හා රෝග පාලනය

දඹල වගාවට විශාල වශයෙන් හානි පමුණුවනු ලබන කෘමීන් සහ රෝග පිලිබඳ වාර්තා වී නැත. සමහර අවස්ථාවලදී පත්‍ර ආහාරයට ගන්නා දළඹුවන් හා කරල් විදින පණුවන් වැනි කෘමීන් නිසා සුළු හානි ඇතිවිය හැකිය. බැක්ටීරියා මැලවීම නිසා වැල්වලට හානි වී ඇති අවස්ථා පිළිබඳව ද කලාතුරකින් වාර්තා වී තිබේ.

## අස්වනු නෙලීම

නිර්දේශිත ප්‍රභේදයෙහි (එස්.එල්.එස්. 44) පළමු අස්වැන්න දින 75 දී පමණ ලබාගත හැකිය. නමුත් බහුල වශයෙන් වගාකරනු ලබන වෙනත් ප්‍රභේදවල මේ සඳහා දින 90-100 පමණ කාලයක් ගතවේ. එම අවස්ථාවේ සිට සති 6-7 පමණ කාලයක් තුල අස්වනු ලබාගත හැකිය. දින 3-4 වරක් බැගින් ලපටි කරල් නෙලාගන්න.

### අස්වැන්න

හෙක්ටයාරයකට ටොන් 15-20 කි.

# තක්කාලි

**ලයිකොපර්සිකන් එස්කියුලැන්ටම්**

*Lycopersicon esculentum*

**කුලය - සොලනේසී**



ලංකාවේ උඩරට තෙත් කලාපයේ හැර අනිකුත් සියලුම කෘෂි දේශගුණික කලාපවල තක්කාලි වගාකළ හැකිය. එය ගොවියාට සාර්ථක ආදායමක් උපයාදෙන, සැලකියයුතු අපනයන විභවයක් ඇති හා විටමින් ඒ, සී හා ඛනිජ පදාර්ථ අඩංගු බෝගයක් ද වේ.

## නිර්දේශිත ප්‍රභේද

### කේ.ඩබ්.ආර්. (ටී.6 2)

පඳුරු තක්කාලි ප්‍රභේදයකි. බැක්ටීරියානු හිටු මැරීමට හොඳින් ඔරොත්තු දේ. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 50 ක් පමණය.

### රෝමා

පඳුරු තක්කාලි ප්‍රභේදයකි. පහත රට වියළි කලාපයට වඩාත් සුදුසුය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 60 ක් පමණවේ. තද පොත්තක් සහිතය. බල්බාකාර හැඩැතිය.

### මාර්ග්ලෝබ්

වැල් තක්කාලි ප්‍රභේදයකි. වඩාත් සුදුසු වන්නේ උඩරට අතරමැදි කලාපයටය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 100 ක් පමණය. තද පොත්තකින් යුක්තය.

## බියන්ස් (ටී.89)

අර්ධ වශයෙන් වැල් ආකාරයට වැඩෙන තක්කාලි ප්‍රභේදයකි. උඩරට අතරමැද කලාපයට වඩාත් සුදුසුය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 100 ක් පමණවේ. තද පොත්තක් සහිතය

## ටී. 146

පදුරු තක්කාලි ප්‍රභේදයකි. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 90 ක් පමණය. තද පොත්තක් ඇත. බැක්ටීරියානු හිටුමැරීමේ රෝගයට, නෙමටෝඩාවන්ට ප්‍රතිරෝධිය. කොළ කොඩවීමේ වයිරස් රෝගයට ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමක් පෙන්වයි.

## විහාර 2

දෙමුහුම් ප්‍රභේදයකි. වර්ධන විලාශය පදුරක් වැනිය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 65 පමණ වේ. තද පොත්තක් සහිතය.

## තිළිණ

අපරිමිත වර්ධනයක් සහිත වැඩි අස්වනු දෙන ප්‍රභේදයකි. දින 45 දී මල් පිපෙන අතර මාස 2 1/2 දී පළමු අස්වැන්න ලබා දේ. අවම වශයෙන් වාර 12 පමණ අස්වනු ලබාගත හැකිය. සලාද සඳහා මෙන්ම විවිධ නිෂ්පාදන සැකසීම සඳහා ද සුදුසු මෙම ප්‍රභේදයේ ගෙඩි තද ස්වභාවයකින් යුක්ත නිසා ප්‍රවාහනයේදී සිදුවන හානිවලට හොඳින් ඔරොත්තු දේ. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 85-95 පමණ වේ. ඉදුණු ගෙඩි තැඹිලි රතු පාටය. ගෙඩියක් තුළ අඩංගු බීජ ප්‍රමාණය වෙනත් බොහෝ වර්ගවලට වඩා අඩුය.

## රවි

වැඩි පරිසර උෂ්ණත්වයක් පවතින ප්‍රදේශ සඳහා විශේෂයෙන් ගැලපෙන ප්‍රභේදයකි. පරිමිත වර්ධනයක් සහිතයි. ඉදුණු ගෙඩි තැඹිලි-රතු පාටය. පසු අස්වනු හානි අඩුය. ගෙඩි පිපිරීමට හා හිටුමැරීමට තරමක් ඔරොත්තු දේ.

## තරිඳු

හිටුමැරීමට හොඳින් ඔරොත්තු දෙන තද රතු පැහැති මදයක් සහිත රවුම් ගෙඩි හටගන්නා වර්ගයකි. විවිධ තක්කාලි නිෂ්පාදන සැකසීම සඳහා විශේෂයෙන් සුදුසුය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 43 පමණ වේ.

## රශ්මි

දෙමුහුන් තක්කාලි ප්‍රභේදවල මෙන් විශාල ගෙඩි හටගන්නා, වැඩි අස්වැන්නක් ලබා ගත හැකි ප්‍රභේදයකි. පදුරක් ආකාරයට වැඩෙන සීමිත වර්ධනයක් ඇති ගසකි. ඉදුණු ගෙඩි තැඹිලි රතු පාටය. ග්‍රෑම් 185 ක් පමණ බරය. හිටු මැරීමේ රෝගයට මධ්‍යස්ථ මට්ටමින් ප්‍රතිරෝධිතාවයක් දක්වයි. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 25 - 28 පමණ වේ.

## රජිත

ග්‍රෑම් 80 පමණ බරකින් යුත් මෙම ප්‍රභේදයේ ගෙඩි ඉදුණු විට තැඹිලි පාටය. පදුරක් ආකාරයට වැඩෙන ශාකයෙහි සීමිත වර්ධන විලාශයක් පවතී. හිටු මැරීමේ රෝගයට මධ්‍යස්ථ මට්ටමේ ප්‍රතිරෝධිතාවයක් පෙන්වයි. ගෙඩි පැලීම සිදුවන්නේ ඉතා මද වශයෙනි. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 30 පමණ වේ.

# බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයට - ග්‍රෑම් 300-400 කි.

# තවාන් පිළියෙල කිරීම

මීටර් 1 ක් පළල, මීටර 3 ක් දිග තවාන් පාත්ති 20 ක් හෙක්ටයාරයක් සඳහා අවශ්‍යය.

පාත්ති වටා කානුව සෙන්ටි මීටර් 45 ක් පළලට සකසන්න. තවාන් පාත්ති සෙන්ටි මීටර් 18-20 පමණ උස්විය යුතුය.

මතුපිට පස් හා කොම්පෝස්ට් සම ප්‍රමාණ වලින් මිශ්‍රකර, සෙන්ටි මීටර් 5 පමණ ඝනකම තට්ටුවක් සේ පාත්තිය මත අතුරන්න.

# ජීවානුහරණය

රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් - කැප්ටාන්/තිරාම්
පිළිස්සීම මගින් - පාත්තිය හොඳින් තෙමා මාරුවෙන් මාරුවට දහයියා හා පිදුරු තට්ටු වශයෙන් දමා පුළුස්සා ගන්න.

# බීජ තවාන් දැමීම

## සුදුසු කාලය

මාර්තු මැද හෝ අගෝස්තු මස අගදී බීජ තවාන් දමන්න.
තවාන් දැමීමට පෙර බීජ ග්‍රෑම් 125 කට කැප්ටාන්/තිරාම් වැනි දිලීරනාශක ග්‍රෑම් 2 ක් මිශ්‍රකර ගන්න.
තවාණේ පේළි අතර පරතරය සෙන්ටි මීටර් 12-15 ක් වනසේ බීජ තුනීව දමන්න.

## සිටුවන ගැඹුර

සෙන්ටි මීටර් 0.5 -1.0 පමණ ගැඹුරකින් බීජ සිටුවා තුනී පස් තට්ටුවකින් වසන්න. ඉන්පසු පාත්තිය පිරිසිදු පිදුරු වැනි ද්‍රව්‍යයකින් තුනීව වසන්න. දිනපතා ජලය දමන්න.

අධික වැස්සෙන්/හිරු එළියෙන් ආරක්ෂාකර ගැනීම සඳහා තවාන ආවරණය කරන්න.

දින 7 කින් පසු වසුන ඉවත් කරන්න. දින 8 - 10 තුළදී පැල තුනී කරන්න. වල් පැළෑටි අතින් ගලවා දමන්න.

පැල ගැලවීමට දින කිහිපයකට කළින් පැල දැඩිකිරීම සඳහා තවානට ජලය අඩුවෙන් සැපයීම හා වැඩි වේලාවක් හිරුඑළියට පැල නිරාවරණය කිරීම වැදගත්ය.

## කෙෂ්ත්‍රය පිළියෙල කිරීම

පෙර කන්නයේ සොලනේසියේ කුලයේ (මිරිස්, බටු, අර්තාපල්) බෝග වගා නොකළ ඉඩමක් වගාව සඳහා තෝරා ගන්න.

ගැඹුරු පස් පෙරලීමකින් පසු පොලොව මට්ටම් කොට මනාව ජලය බැසයන පරිදි ඉඩම සකසා ගන්න.

## පරතරය

සෙන්ටි මීටර් 80 × 50 කි.

## කෙෂ්ත්‍රයේ සිටුවීම

පැල ගැලවීමට දිනකට පෙර තවාන් හොඳින් තෙත් කරන්න.

තවානේ පැල දින 14 - 21 අතරදී ගලවා සිටුවන්න. සවස් වරුවේ පැල සිටුවන්න.

පැල සිටුවන සෑම වලකටම කාබනික පොහොර යොදන්න. (හෙක්ටයාරයකට ටොන් 6 - 12) සමතලා පාත්තිවල හෝ උස් පාත්තිවල හෝ පැල සිටුවීම කරන්න. පැල සිටුවා අධික හිරු රැස් ඇති නම් පැලවල මුල් වැඩෙන තෙක් ආවරණය කොට තබන්න.

## පොහොර යෙදීම

සකසා ගත් වලවල්වලට පැල සිටුවීමට දින 2-3 පෙර කාබනික පොහොර සහ මූලික පොහොර වශයෙන් යෙදිය යුතු රසායනික පොහොර යොදා පස් සමග මිශ්‍ර කරන්න. කාබනික පොහොර වශයෙන් හෙක්ටයාරයකට ටොන් 10 පමණ කුකුල් පොහොර ද යෙදිය හැකිය.

### රසායනික පොහොර

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 65 | 325 | 65 |
| පැල මතුවී සති 3 පසු | 65 | - | - |
| පැල මතුවී සති 6 පසු | 65 | - | 65 |

බදුල්ල දිස්ත්‍රික්කය සඳහා ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 220 යොදන්න.

## ජල සම්පාදනය

බෝගයට ප්‍රමාණවත් ලෙස ජලය ලබා දෙන්න. වැඩිපුර ජලය යෙදීම සුදුසු නැත. විශේෂයෙන් වියළි කාලයකට පසු වැඩිපුර ජලය යෙදුවහොත් ගෙඩි පිපිරීමට ඉඩ තිබේ.

## වල් මර්දනය

පැල සිටුවා සති 3 දී හා 6 දී සිදු කරන්න.

## ආධාරක සිටුවීම

ගස් ඇද වැටීම වලකාගැනීම සඳහා මල් පිපීම ආරම්භ වීමට කලින් ගස් අසල සිටුවාගත් කෝටුවලට ගස් තබා ප්‍රවේශමෙන් බඳින්න.



# කෘමි පාලනය

## තක්කාලි ගෙඩි විදින පණුවා

### හානියේ ලක්ෂණ

කුඩා පනුවා කෙටි කාලයක් පත්‍ර කමින් ක්‍රමයෙන් ගෙඩි විදීමට පටන් ගනී. ගෙඩිවල සිදුරු දක්නට ලැබේ.



### පාලනය

පහත සඳහන් කෘමිනාශකවලින් එකක් වගාවට යොදන්න. ක්ලෝෆ්ලුවසුරොන් - මිලි ලිටර් 10 50 g/1 (ඇටබ්‍රොන්) බැසිලස් තුරෙන්ජිඑන්සිස් - ග්‍රෑම් 45 (බී.ටී.) ඉහත කෘමිනාශකවල නියමිත ප්‍රමාණ ජලය ලීටර 10ක බැගින් දියකර ඉසින්න.

මල් හා ගෙඩි හටගන්නා අවධියේදී කෘමිනාශක ඉසිය යුතුය. අවශ්‍ය නම් පමණක් දින 14 කට වරක් කෘමිනාශක ද, දින 10 කට වරක් බී.ටී ද යෙදීම වඩාත් සුදුසුය. අස්වැන්න නෙලීමට දින 14 කට පෙර කෘමිනාශක යෙදීම නවත්වන්න.

## කියත් පනුවා

### හානියේ ලක්ෂණ

කුඩා පැලවල කඳ කපා විනාශකර දමයි.

### පාලනය

ක්ෂේත්‍රයේ පස හොඳින් පෙරලා හිරුඑළියට නිරාවරණය කරන්න.

සිටුවන අවස්ථාවේ හෙක්ටයාර 1 කට කාබොෆියුරාන් 3% කිලෝ ග්‍රෑම් 22 - 35 අතර ප්‍රමාණයක් පසට කලවම් කරන්න.

එසේ නැතහොත්,
පහත සඳහන් කෘමිනාශකවලින් එකක් පැල සිටුවීමෙන් පසු පැලය වටා පස තෙමෙනසේ යොදන්න.

- ට්‍රයික්ලෝෆෝන්, 500 g/1 - මිලි ලිටර් 37 (ඩිප්ටෙරෙක්ස්)
- ප්‍රොෆෙනොෆොස්, 500 g/1 - මිලි ලිටර් 23 (සෙලික්‍රොන්)
- ප්‍රොතියොෆොස්, 500 g/1 - මිලි ලිටර් 30 (ටොකුතයෝන්)
- ක්ලෝෆ්ලුවසුරෝන්, 50 g/1 - මිලි ලිටර් 10 (ඇටබ්‍රෝන්)

ඉහත කෘමිනාශක ප්‍රමාණ ජලය ලිටර් 10 ක බැගින් මිශ්‍රකර යොදන්න.

# රෝග පාලනය

## තවාන් රෝග

දිලීර වර්ග කිහිපයක් නිසා දියමලන්කෑම නොහොත් පාමුල කුණුවීම ඇතිවිය හැක.

රෝගී පැලවල කඳෙහි පාමුල ප්‍රදේශය කුණුවී පැල ඇදවැටී හෝ මැලවී පසුව මැරී යයි.

### පාලනය

තවාන් පසේ රෝග ඇති කරන දිලීර වර්ග ඇති බැවින් තවාන් සකස් කරන විට තවාන් පාත්තිවල පස පුළුස්සා ගන්න.

එසේ නොමැති නම් පහත සඳහන් දිලීරනාශකවලින් එකක් දියකර පස හොඳින් තෙමෙන සේ මල් බාල්දියකින් පසට යොදන්න.

- කැප්ටාන් 50% - ග්‍රෑම් 6
- කැප්ටාන් 80% - ග්‍රෑම් 4
- ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) - ග්‍රෑම් 6
- තිරාම් - ග්‍රෑම් 7
- තයොෆනේට් මීතයිල් (ටොප්සින්) - ග්‍රෑම් 3

ඉහත දිලීරනාශක ප්‍රමාණ ජලය ලීටර 5 ක දියකර වර්ග මීටර 2 කට යොදන්න. නැතහොත් පහත සඳහන් දිලීරනාශක සමග මිශ්‍රකර බීජ සිටුවන්න.

- කැප්ටාන් 50% - ග්‍රෑම් 6
- කැප්ටාන් 80% - ග්‍රෑම් 4
- තිරාම් - ග්‍රෑම් 4

ඉහත ප්‍රමාණය බීජ කිලෝ 1 කට සෑහේ.

## දිලීර මැලවීම

දිලීර වර්ග කිහිපයක් නිසා ඇති වේ.

### රෝග ලක්ෂණ

ගස මැලවී යයි. ගසේ පාමුල හා මුල් කුණුවී යයි. සමහරවිට මුල් හා පාමුල කොටසේ සුදුපාට දිලීර දැකිය හැක.

## පාලනය

කාණු ගැඹුරුකර හොඳින් ජලය බැස යාමට සලස්වන්න. ඉහත දිලීර නාශක රෝගී පැලයේ මුල් හා ඒ අවට ඇති පැලවල මුල් හොඳින් තෙමෙන සේ මල් බාල්දියකින් යොදන්න.

# බැක්ටීරියා හිටුමැරීම

පසේ ඇති බැක්ටීරියාවක් මගින් ඇති වේ.

## රෝග ලක්ෂණ

පැල මැලවීම සිදු වේ. ගසේ පාමුල හෝ මුල් කුණුවීමක් පිටතින් දක්නට නොලැබේ. පස මට්ටමට අඟලක් පමණ උඩින් කද කපා පිරිසිදු වතුර භාජනයකට දැමූවිට කිරිපාට නූල් මෙන් බැක්ටීරියා පිටතට පැමිණේ නම්, මෙය බැක්ටීරියා හිටුමැරීම බව ස්ථිරවම නිගමනයකල හැක. මේ අනුව දිලීර හිටුමැරීමෙන් මෙය වෙන්කර හඳුනාගත හැකිය.

## පාලනය

කාණු ගැඹුරුකර හොඳින් ජලවහනය ඇති කරන්න.
ප්‍රතිරෝධී වර්ග වගා කරන්න. KWR ඉතාමත් ප්‍රතිරෝධිය.
T-146 තරමක් මෙයට ප්‍රතිරෝධීවේ.
පසට කාබනික පොහොර යොදන්න.

# අංගමාරය

## රෝග ලක්ෂණ

කොළවල හා කඳේ දුඹුරු හෝ කළුපාට පුල්ලි ඇති වේ. ඒවා වැසි හෝ මීදුම සහිත කාලගුණයේදී ඉක්මණින් විශාල වී කුණුවී යයි. පුල්ලිවලට උඩින් ඇති ගසේ කොටස් කඩාවැටීම හෝ මැලවීම සිදුවේ. මෙම පුල්ලි ගසේ ඕනෑම තැනක ඇතිවිය හැක. ගෙඩිවලද එම පුල්ලි ඇතිවී ගෙඩිද කුණුවී යයි.

## පාලනය

වැසි සහිත කාලගුණයක් ඇතිවිටදී රෝගය ඉක්මනින් පැතිරී ගස් සියල්ලම විනාශ වී යා හැකි බැවින් රෝග ලක්ෂණ දුටුවහාම පහත දිලීරනාශකවලින් දෙකක් තෝරාගෙන මාරුවෙන් මාරුවට සති 2 කට වරක් යොදන්න.

- ක්ලෝරෝතැලොනිල් (ඩැකොනිල්) - මිලි ලීටර් 30
- ප්‍රෙපිනෙබ් (ඇන්ට්‍රකෝල්) - මිලි ලීටර් 20
- මැන්කොසෙබ් - මිලි ලීටර් 20
- මැනෙබ් - මිලි ලීටර් 25
- ප්‍රොපමොකාබ් (ප්‍රෙවිකර්) - මිලි ලීටර් 35

ඉහත දිලීර නාශක ප්‍රමාණය ජලය ලීටර 10 ක දියකර ගස් හොඳින් තෙමෙන සේ යොදන්න.

නිර්දේශිත ආකාරයට පොහොර මිශ්‍රණ යොදන්න. වැඩියෙන් යූරියා පොහොර නොයොදන්න. රෝගී ගස් හා ගෙඩි කෙෂ්ත්‍රයෙන් ඉවත්කර විනාශකර දමන්න.

# පිටිපුස් රෝගය

## රෝග ලක්ෂණ

සුදුපාට පිටි වැනි දිලීරයේ කොටස් කොළවල යටි පැත්තේ මුලින්ම ඇති වේ. මේ නිසා කොළවල උඩ පැත්ත කහපාට වේ.

## පාලනය

රෝග ලක්ෂණ දුටු වහාම සල්ෆර් කුඩු ග්‍රෑම් 50 ජලය ලීටර 10 ක දියකර ඉසින්න. අවශ්‍ය නම් නැවත සතියකින් ඉසින්න.

# ඇන්ත්‍රැක්නෝස් රෝගය

## රෝග ලක්ෂණ

ගෙඩි කුණුවීම හා කඳ ඉහළ සිට කුණුවීම, මල් හැලීයාම සිදු වේ. වැසි සහිත කාලගුණයේදී රෝගය දරුණු වේ.

## පාලනය

පහත සඳහන් දිලීරනාශකවලින් එකක් යොදන්න.

- ක්ලෝතැලොනිල් (ඩැකොනිල්) - ග්‍රෑම් 20
- මැන්කොසෙබ් - ග්‍රෑම් 20
- මැනෙබ් - ග්‍රෑම් 20
- කාබන්ඩසිම් (බැවිස්ටින්) - ග්‍රෑම් 7

ඉහත දිලීර නාශක ප්‍රමාණ ජලය ලීටර 10 ක දියකර ඉසින්න.

# ගෙඩිවල යට කුණුවීම

මෙය බෝගයකට ලැබෙන ජල ප්‍රමාණය වැඩිවීම හෝ අඩුවීම නිසා ඇතිවන්නකි.

## රෝග ලක්ෂණ

ගෙඩියේ යටි පැත්ත කුණුවී යයි.

## පාලනය

වතුර වැඩි කාලවලදී කාණු ගැඹුරුකර වතුර බැස යාමට සලස්වන්න. වතුර හිඟ කාලවලදී වතුර සපයන්න.

තෙතමනය ඒකාකාරීව පවත්වා ගැනීමට පිදුරු, කොළ වර්ග ආදිය යොදා පැල අවට වසුන් කරන්න.

# වෛරස් රෝග

ලංකාවේ තක්කාලි වගාවට බලපාන වෛරස් රෝග කිහිපයකි.

- පිපිඤ්ඤා විචිත්‍ර වෛරසය (CMV)
- දුම්කොළ විචිත්‍ර වෛරසය (TMV)
- ටොමැටෝ ස්පොටඩ් විල්ට් වෛරසය (TSWV)
- තක්කාලි කහපැහැ කොළ කොඩවීමේ වෛරසය (TYLCV)
- කර්ලි ටොප් වෛරසය (CT)

DEPT. OF AGRIC. CENTRAL 15 NOV 2012 LIBRARY PERADENIYA

## CWV රෝග ලක්ෂණ

ශාක කුරුවීම, පත්‍ර කහවීම, පත්‍ර සිහින්වීම ගෙඩි කුඩාවීම, අඩුවීම හා ප්‍රමාද වී මේරීම

### බෝවීම

කුඩිත්තන් මගින්, රෝගී ශාකවල යුෂ නිරෝගී ශාකවල තැවරීමෙන්, වල් පැලෑටි බීජ මගින්

### පාලනය

වල් පැලෑටි විනාශ කිරීම.
පිපිඤ්ඤා කුලයේ හා සොලනේසී කුලයේ බෝග සමග තක්කාලි මිශ්‍ර වගාවක් ලෙස වගා නොකිරීම.
රෝගී පැල ඉවත් කිරීම.
රෝග වාහකයාගේ ගහනය අඩුකර ගැනීමට නිර්දේශිත කෘමිනාශක යෙදීම.

## TMV රෝග ලක්ෂණ

- ශාක කුරුවීම
- පත්‍ර, මීවන පත්‍ර මෙන් සිහින්ව දික්වීම.
- පත්‍ර විචිත්‍රය හා පත්‍ර රැලි ගැසීම.
- ගෙඩි ඉදීම ඒකාකාරව සිදුනොවීම

### බෝවීම

- රෝගී ශාකවලින් ලබාගත් බීජ මගින්
- රෝගී වගාවන්හි පස් හා මුල් මගින්
- රෝගී ශාක කොටස්වලින්

### පාලනය

ආසාදිත ශාක පුළුස්සා දැමීම, පිරිසිදු බීජ භාවිතය, බීජ ප්‍රතිකාරක යෙදීම, ට්‍රයිසෝඩියම් ඩීකෝ පොස්පේට් ද්‍රාවණයේ විනාඩි 15 ක් බීජ තබා ජලයෙන් සෝදා බීජ වේලීම.

## TSWV රෝග ලක්ෂණ

- පත්‍රවල තඹ පැහැයක් ඇති වේ.
- ලපටි පත්‍ර මත තද පැල්ලම් හටගනී.
- අග්‍රස්ථය මියයාම හා ශාක කඳ මත ඉරි ඇතිවේ.
- අතු මැලවී කඩා වැටේ. ගෙඩි මත රවුම් පැල්ලම් ඇති වේ.

### බෝවීම

පැල මැක්කන් මගින්, බීජ මගින්, ශාක යුෂ මගින්.

### පාලනය

වල් පැලෑටි විනාශ කිරීම, රෝගී පැල ඉවත් කිරීම, නිරෝගී බීජ භාවිතය, වාහකයාගේ ගහණය අඩුකිරීම, නිර්දේශිත කෘමිනාශක යෙදීම.

## TYLCV රෝග ලක්ෂණ

- කඳෙහි අග්‍රස්ථ සෘජුව තිබීම හා පසුව කෙටිවීම.
- පත්‍ර කුඩාවීම.
- පත්‍ර උඩට හෝ යටට හැකිලීම.
- වර්ධනය බාලවීම.

### බෝවීම

සුදුමැස්සා මගින් බෝවේ. නමුත් බීජ හා ශාක යුෂ මගින් මෙම රෝගය බෝ නොවේ.

### පාලනය

සුදුමැස්සා පාලනයට නිර්දේශිත කෘමිනාශක යෙදීම. රෝගී ශාක ඉවත්කිරීම, වල්පැලෑටි විනාශ කිරීම.

## CT රෝග ලක්ෂණ

කුඩා කළ රෝග ශාක වියළී මිය යයි, ශාක කුරු වේ, පත්‍ර නටු පහතට කඩා වැටේ. පත්‍ර උඩ අතට හැකිලේ, පත්‍ර දුඹුරු පැහැවී නාරටි දම් පැහැවේ. ගෙඩි මත දුඹුරු පැහැති පැල්ලම් හටගනී.

### බෝවීම

කොළපාට කීඩෑවන් මගින් බෝවන මෙම රෝගය ශාක යුෂ මගින් ව්‍යාප්ත නොවේ.

### පාලනය

වල්පැලෑටි පාලනය, නිර්දේශිත කෘමිනාශක යොදා වාහකයා පාලනය. රෝගී ශාක ඉවත් කිරීම, බිට් හා තක්කාලි මිශ්‍ර බෝග ලෙස වගා නොකිරීම.

# අස්වැන්න

හොඳින් නඩත්තුකළ වගාවකින් හෙක්ටයාරයකට ටොන් 20-30 පමණ අස්වැන්නක් ලබාගත හැකිය.

## අස්වනු නෙලීම

ගෙඩි කොළ පැහැයේ සිට කහ පැයට හැරෙන අවස්ථාවේදී නෙලාගන්න. අස්වනු නෙලීම 10-12 වරකට පමණ කළ යුතුය

## අස්වැන්න සකසා ගැනීම

නෙලාගත් ගෙඩි, ප්‍රමාණය අනුව වර්ගීකර, හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි ලී පෙට්ටිවල අසුරා වෙළඳපොලට යවන්න.

# බෝංචි

**ෆැසිඕලස් වුල්ගාරිස්**

*Phaseolus vulgaris*

**කුලය - ෆැබේසී**



## දේශගුණික අවශ්‍යතා

බදුල්ල, නුවරඑළිය, මාතලේ හා මහනුවර දිස්ත්‍රික්කවල දැනට බෝංචි බහුලව වගා කෙරේ. උෂ්ණත්වය ඉතා වැඩි හා තද වර්ෂාව සහිත කාලගුණික තත්ව පවතින ප්‍රදේශ බෝංචි වගාවට සුදුසු නැත. මල් හටගන්නා අවධියේදී උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 30 ට වඩා අඩුවිය යුතුයි. උඩරට තෙත් කලාපය ද බෝංචි වගාවට සුදුසු නොවේ.

## පස

මනා ජල වහනයක් ඇති ලෝම් පස් හා වැලි ලොම් පස් සුදුසුය. රතු කහ පොඩ්සොලික් පස බෝංචි වගාව සඳහා වඩාත් උචිත පස් වර්ගයකි. පී.එච්. අගය 6.5 සිට 7.5 අතර ඇති පසක් වගාවට වඩාත් හිතකර වේ.

## බිම් සැකසීම

අඩියක් පමණ ගැඹුරට පස පෙරලා හොඳින් කැට පොඩිකර ගන්න.

## නිර්දේශිත ප්‍රභේද

ප්‍රධාන වශයෙන් පඳුරු හා වැල් බෝංචි ලෙස ආරයන් දෙකකි.

## වැල් බෝංචි ප්‍රභේද

### කෙන්ටකි වන්ඩර් ග්‍රීන් (K.W.G.)

කොළපැහැති, මධ්‍යම ප්‍රමාණයේ, කෙඳි සහිත, නැමුණු අග සහිත කරල්වලින් යුක්තය.

### කැප්පෙටිපොල නිල්

සෙ.මී 18-20 පමණ දිග කොළ පැහැති කරල් සහිත වැල් බෝංචි ප්‍රභේදයකි. පළමු අස්වැන්න දින 60-65 දී ලබාගත හැකි අතර, අස්වනු නෙලීම වාර 6-8 කළ හැකිය. එක් වැලක සාමාන්‍යයෙන් කරල් 46 ක පමණ සංඛ්‍යාවක් හටගනී. බණ්ඩාරවෙල ප්‍රදේශයේ ගොවීන්ගේ ක්ෂේත්‍රවල සාමාන්‍යයෙන් හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 17-18 පමණ අස්වැන්නක් ලබාගත හැකිය. මෙම ප්‍රභේදය මලකඩ, ඇන්ත්‍රැක්නෝස් සහ බීජ පැල කුඩා අවධියේදී වැළදෙන මුල් කුණුවීමේ රෝගයට ඔරොත්තු දේ. බීජ තද දුඹු පාටය.

### බලංගොඩ නිල්

සෙන්ටි මීටර් 14 ක් පමණ දිගැති රවුම්, කොළ පැහැති කරල් හට ගන්නා වැල් බෝංචි ප්‍රභේදයකි. බීජ දුඹුරු පැහැතිය. වැලෙහි ඒකාකාරීව පැතිර කරල් හට ගනී. මලකඩ හා මුල් කුණු වීමේ රෝගවලට ඔරොත්තු දේ. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 12 - 14 පමණ ලබා ගත හැකිය.

### ලංකා බටර්

සෙන්ටි මීටර් 16 - 17 පමණ දිගකින් යුත් කහ පැහැති, රවුම් කරල් හටගන්නා වැල් බෝංචි ප්‍රභේදයකි. බීජ කළු පැහැතිය. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 16 පමණ වේ. මුල් කුණු වීම, ඇන්ත්‍රැක්නෝස් හා මලකඩ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාවක් ද මෙම ප්‍රභේදය සතුය.

දේශීය ප්‍රභේද ද ගොවීන් අතර ජනප්‍රිය වේ.
උදා: පීස් බටර්, කටුගස්තොට.

## පඳුරු බෝංචි ප්‍රභේද

### වේඩ්

තදකොළ, රවුම්, මාංශල, කෙඳි රහිත, මධ්‍යම ප්‍රමාණයේ කරල් හටගනී.

### ටොප් ක්‍රොප්

කරල් ලා කොළ, රවුම්, කෙඳි සහිත හා මධ්‍යම ප්‍රමාණයේ විශාලත්වයකින් යුක්තයි.

### වෙරොකි වැක්ස්

පැතලි ඕවලාකාර, කෙඳි සහිත කරල් කහපාටට හුරුය.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට වැල් බෝංචි බීජ කිලෝග්‍රෑම් 50 ක් පමණද, පඳුරු බෝංචි බීජ කිලෝග්‍රෑම් 75 ක් පමණද අවශ්‍ය වේ.

## බීජ සිටුවිය යුතු කාලය

බදුල්ල දිස්ත්‍රික්කයේ මහ කන්නයේදී නොවැම්බර් දෙසැම්බර් මාසවලත්, යල කන්නයේදී මාර්තු/අප්‍රේල් මාසවලත් බීජ සිටුවීම කරනු ලැබේ.

## පරතරය

පඳුරු බෝංචි සඳහා - සෙන්ටි මීටර් 40×10
වැල් බෝංචි සඳහා - සෙන්ටි මීටර් 45×30

## පොහොර යෙදීම

හෙක්ටයාරයක් සඳහා පහත සඳහන් පොහොර ප්‍රමාණ නිර්දේශකර තිබේ.

### වැල් බෝංචි

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්වසුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 110 | 275 | 75 |
| පැල මතුවී සති 3 දී | 110 | - | 75 |

### පඳුරු බෝංචි

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්වසුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 85 | 165 | 65 |
| පැල මතුවී සති 3 දී | 85 | | 65 |

වගාවේ වයස සති 2-3 වූ විට මතුපිට පොහොර යෙදීමෙන් පසුව වැල් බෝංචි සඳහා කෝටු සිටුවීම අවශ්‍ය වේ.

## ජල සම්පාදනය

පසේ තෙතමනය උචිත අයුරින් පවත්වා ගැනීමෙන් වැඩි අස්වැන්නක් ලබාගත හැකිය. වර්ෂාපතනය අඩුවිට ජල සමපාදනයකළ යුතුය. මල් හා කරල් හටගන්නා කාලයේදී විශේෂයෙන් ජල සම්පාදනය කිරීම වැදගත්ය.

## වල් පැළෑටි පාලනය

මතුපිට පොහොර යෙදීමට පළමුව වල් මර්දනය කරන්න.

## කෘමි පාලනය

බෝංචි මැස්සා, කරල් විදින පණුවා හා පත්‍ර කනින්නා බෝංචි වගාවට හානි කරන ප්‍රධාන කෘමින්ය. බෝංචි මැස්සා සඳහා බෝංචි බීජ පැල වූ පසු ෆොමොතියෝන් හෝ මෙටසිස්ටොක්ස් අවුන්ස 01 ක් වතුර ගැලුම් 03 කට යොදා වගාවට ඉසිය යුතුය. නැවත දින 10-12 කට පසු කෘමිනාශකය නැවත යෙදීමද නිර්දේශ කරනු ලැබේ.

කරල් විදින පණුවා සඳහා, මල් පිපීම ආරම්භ වීමත් සමග සුදුසු කෘමි නාශකයක් යෙදිය යුතුයි. පත්‍ර කනින්නාගේ හානියට සුදුසු කෘමි නාශකයක් මුල් කාලයේදී යෙදිය යුතුය.

## රෝග පාලනය

ඇන්ත්‍රැක්නෝස්, මලකඩ රෝගය හා බෝංචි විචිත්‍ර වෛරස් රෝග බෝංචි වගාවේ ප්‍රධාන රෝග වේ.

ඇන්ත්‍රැක්නෝස් මර්ධනය සඳහා නිර්දේශිත දිලීර නාශකයක් යෙදීම හෝ බීජ ප්‍රතිකාර කිරීම හෝ සිදුකල හැකිය. මලකඩ රෝගය මර්ධනය සඳහා දිලීර නාශකයක් යෙදීම හා ඔරොත්තු දෙන ප්‍රභේද වගා කිරීමකල යුතුවේ.

## අස්වනු නෙලීම

පඳුරු බෝංචි දින 45 කින් පමණද, වැල් බෝංචි දින 60 කින් පමණද අස්වැන්න නෙලිය හැකියි. කරල් මේරීමට කලින් අස්වැන්න නෙලා ගත යුතුයි.

### අස්වැන්න

මනා වගා පාලන තත්ත්ව යටතේ පඳුරු බෝංචිවලින් හෙක්ටයාරයකට ටොන් 5-10 හා වැල් බෝංචිවලින් හෙක්ටයාරයකට ටොන් 10-15 ක අස්වැන්නක් ලබා ගත හැකිය.

### පසු අස්වනු කටයුතු

අස්වනු නෙලීමේදී කරල්වලට හානියක් නොවන ලෙස කළ යුතුය. ප්‍රවාහනයේදී හොඳින් වාතාශ්‍රය සහිත ඇසුරුම්වල බෝංචි කරල් ඇසිරීම වැදගත්ය.

## බීජ නිෂ්පාදනය

දේශියව බීජ නිෂ්පාදනයකළ හැකිය. රෝගවලින් තොර පැලවලින් පමණක් බීජ ලබා ගත යුතුය. පඳුරු බෝංචි හෙක්ටයාරයකින් බීජ ටොන් 01 ක් පමණද වැල් බෝංචි හෙක්ටයාරයකින් බීජ ටොන් 1 1/2 ක් පමණද ලබා ගත හැකිය. බීජ ගබඩා කිරීමට පෙර හොඳින් වියලා ගත යුතුය.

# රාබු

**රැෆනුස් සැටයිවස්**

*Raphanus sativus*

**කුලය - බ්‍රසිකේසි**



ශ්‍රී ලංකාවේ සියළුම කෘෂි දේශගුණික කලාපවල රාබු වගාකළ හැකිය. හොඳින් ජලය බැසයන පී.එච් අගය 6.0 - 7.5 අතර වූ පසක් වගාව සඳහා වඩා සුදුසුය.

## බිම් සැකසීම

සෙන්ටි මීටර් 30-40 පමණ ගැඹුරට පස පෙරළා හොඳින් කැට පොඩිකර ගන්න. උස් පාත්ති සකසා කාබනික පොහොර පස සමග කළවම් කරගන්න.

## නිර්දේශිත ප්‍රභේද

### ජපන් බෝල

සුදු පැහැති රවුම් අල නිපදවයි. පත්‍ර කණ්ඩිකාවලට බෙදී ඇති අතර මැද නාරටිය ප්‍රදේශයේ බුව සහිතය. දින 45-55 දී අස්වැන්න නෙලාගත හැකිය. මැද හා උඩරට ප්‍රදේශවලට වඩා සුදුසුය.

### බීරළු

සුදුපැහැති තර්කු හැඩති අල හටගනී. පත්‍ර බෙදී හෝ බුව සහිත ස්වභාවයක් හෝ නැත. දින 45-50 දී අස්වැන්න නෙලාගත හැකිය. පහතරට ප්‍රදේශ සඳහා වඩා සුදුසුය.

මෙයට අමතරව 'රෙඩ් රැඩිෂ්' නමින් බොහෝවිට හඳුන්වනු ලබන සලාද රාබු වර්ගයද උඩරට ප්‍රදේශවල ගොවීන් අතර ජනප්‍රියය. දින 35 - 45 දී අස්වනු නෙලාගත හැකි මෙම ප්‍රභේදයේ 'ඇට බෝල' ප්‍රමාණයේ රතුපැහැති අල හටගනී. පිසීමකින් තොරව සලාද ආකාරයට ආහාරයට ගත හැකිය.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 5 කි.

## පරතරය

පේළි අතර සෙන්ටි මීටර් 25- 30 හා පැල අතර
සෙන්ටි මීටර් 10කි.
සලාද රාබු සඳහා සෙන්ටි මීටර් 20 × 50 කි.

## සිටුවීම

බීජ සිටුවිය යුත්තේ පේළි දිගේය. බීජ පැලවී සතියක් පමණ ගත වූ පසුව වැඩි පැල උදුරා දමන්න. මල් හට ගැනීම වලක්වා ගැනීම සඳහා උඩරට ප්‍රදේශවල රාබු වගා කළ යුත්තේ මාර්තු - මැයි සහ අගෝස්තු - ඔක්තෝබර් කාලවලදීය.

## පොහොර යෙදීම

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්වසුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 90 | 110 | 65 |
| සති 3 දී | 90 | - | 65 |

## ජල සම්පාදනය

මුල් දින 4-5 දී දිනපතා ද ඉන්පසුව සෑම දින 3 - 4 වරක් බැගින් ද ජලය සපයන්න.

## වල් පැල පාලනය

එක් වරක් අතින් වල් ගැලවීම ප්‍රමාණවත්ය. උඩරට ප්‍රදේශවල සති 4 දී ද වෙනත් ප්‍රදේශවල සති 2 දී පමණද වල් ගලවා දමන්න.

## කෘමි පාලනය

පත්‍ර කන දළඹු වර්ග නිසා දරුණු හානියක් පවතින විට නිර්දේශිත කෘමි නාශකයක් යොදන්න.

### පත්‍ර කනින්නා

ග්‍රීස් තැවරූ කහ පැහැති පොලිතින් උගුල් වගාවේ යෙදීම, බෝග මාරුව, හානි වූ ශාක කොටස් විනාශ කිරීම, ඇසඩරැක්ටින් හෝ සයිරොමයිසින් වැනි කෘමි නාශකයක් යෙදීමද කළ හැකිය.

### කියත් පණුවා

කුඩා පැල කපා දමයි. නිර්දේශිත කෘමිනාශකයක් වගාවට යොදන්න. වගාවේ පස අවුස්සා, පිලා අවස්ථාව විනාශකර දමන්න.

## රෝග පාලනය

### බරවාපාද රෝගය

පැලෑටියේ වර්ධනය බාල වේ. මුල ඉදිමී විකෘති වේ. බෝගය සිටුවීමට පෙර පසට හුණු යෙදීම. ගෝවා, රාබු වැනි බෝග එකම ඉඩමේ නිතර වගා නොකිරීම හා වල් අබ නැමති පැලෑටි ඉඩමේ වැඩීමට ඉඩ නොදීම වැනි ක්‍රියා මගින් රෝගය පාලනය කරගත හැකිය.

## අස්වනු නෙලීම

නියම අවස්ථාවේදී අස්වනු නෙලන්න. අස්වැන්න ප්‍රමාද වී නෙලීම මගින් අලවල ගුණාත්මය අඩුවේ.

### අස්වැන්න

| | | |
|---|---|---|
| ජපන් බෝල | - | හෙක්ටයාරයකට ටොන් 40 - 50 |
| බීරළු | - | හෙක්ටයාරයකට ටොන් 20 - 30 |

### අස්වැන්න සැකසීම

අලවල ප්‍රමාණය අනුව අස්වැන්න ශ්‍රේණි කරන්න. වාතාශ්‍රය හොඳින් ලැබෙන පරිදි අසුරා මිටි බැඳ වෙළඳ පොලට යවන්න.

# කැරට්

**ඩෞකස් කැරෝටා**

*Daucus carota*

**කුලය - අම්බෙලිෆෙරි**



## බිම් සැකසීම

කැරට් වගාව සඳහා හොඳින් බිම සකසා ගත යුතුය. සෙන්ටි මීටර් 20-30 ගැඹුරට සී සෑමෙන් හෝ කෙටීමෙන් පසු සියුම්ව පස සකස්කර ගන්න. මීටර් 1 පමණ පළල පාත්ති සකසා ගැනීම මගින් වගා නඩත්තුව පහසුවේ.

## දේශගුණික අවශ්‍යතා

මුහුදු මට්ටමේ සිට මීටර් 1300 ට වඩා ඉහල එසේම උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ්. 15-18 පවතින ප්‍රදේශවල කැරට් බෝගය ඉතා හොඳින් වගාකල හැකිය. එසේ වුවද මීටර් 1300 වඩා පහල හා මධ්‍යම ප්‍රදේශවලද සාර්ථකව වගාකළ හැකි සමහර කැරට් වර්ග තිබේ.

## පස

කැරට් වගාව සඳහා කාබනික ද්‍රව්‍ය බහුලව අඩංගු වැලි ලෝම් පසක් වඩාත් යෝග්‍ය වේ. සැමවිටම ගල් බොරළුවලින් තොර පසක් වීම වඩාත් සුදුසුය. ලංකාවේ දක්නට ලැබෙන රතු කහ පොඩ්සොලික් පස්වල කැරට් හොඳින් වගාකල හැකිය.

## නිර්දේශිත ප්‍රභේද

### ටොප් වේට් (මාස 4)

කෝණාකාර හැඩයක් සහිත අලය තැඹිලි පැහැතිය.

### කේප් මාර්කට් (මාස 3 - 3 1/2)

සිලින්ඩරාකාර හැඩයක් ගන්නා අලය ලා කහ පැහැයක් ගනී.

### නිව් කුරෝඩා (මාස 3 - 3 1/2)

සිලින්ඩරාකාර හැඩයක් ඇති අල. තද තැඹිලි පැහැයක් ගනී.

දැනට ගොවීන් අතර වඩාත් ජනප්‍රිය වන්නේ 'නිව් කුරෝඩා' වර්ගයයි. මෙම වර්ගය උඩරට මෙන්ම පහතරට ප්‍රදේශවලද වගා කිරීමට හැකියාව තිබේ.

## බීජ අවශ්‍යතාවය

බීජ කිලෝ ග්‍රෑම් 4 ක් පමණ හෙක්ටයාර් එකක් වගා කිරීමට අවශ්‍යවේ.

## සිටුවීමේ කාලය

කැරට් බීජ එකවරම පාත්තිවල වැපිරිය යුතුය. මෙම වගාව යල සහ මහ කන්න දෙකෙහිම සිදුකල හැකිය. එසේ වුවද ජල සැපයුම සහ අනෙකුත් පහසුකම් අනුව මහ කන්නයේදී වැඩි වශයෙන් වගාවේ.

## පරතරය

කැරට් බීජ ක්ෂෙත්‍රයේ වැපිරීම ක්‍රම 2 කට සිදු වේ.

- පාත්තිවල විසුරුවා හැරීම.
- පේලි ක්‍රමයට ඉසීම. (සෙන්ටි මීටර් 25 × සෙන්ටි මීටර් 5).

බීජ පැලවී සති 3-4 කින් පැල තුනී කිරීම අවශ්‍යවන අතර, සති 8 දී නියමිත පරතරයට සිටින සේ පැල තුනීකල යුතුය. පේලි ක්‍රමයට බීජ වැපිරීම මගින් පැල තුනී කිරීම හා වගාව නඩත්තු කිරීම පහසුවේ.

## පොහොර යෙදීම

හෙක්ටයාරයකට යෙදිය යුතු රසායනික පොහොර ප්‍රමාණය පහත දක්වා තිබේ.

මීට අමතරව පාත්ති සකසා ගන්නා අවස්ථාවේදී කාබනික පොහොර (ගොම පොහොර හෝ කොම්පෝස්ට්) ටොන් 5 - 10 ක් පමණ හෙක්ටයාරයක් සඳහා යොදන්න.

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | | - | 275 |
| සති 2 දී | 110 | - | 85 |
| සති 5 දී | 110 | - | 85 |
| සති 8 දී | 110 | - | 85 |

## ජල සම්පාදනය

කැරට් පැලවල මුල් පද්ධතිය අවට මැනවින් තෙතමනය පවත්වා ගැනීමට ප්‍රමාණවත්වන ජල සැපයුමක් කල යුතුය. නියමිත ප්‍රමාණයට වඩා ජලය අඩු වුවහොත් අස්වැන්න අඩු වේ.

## වල් පැලෑටි පාලනය

අතින් වල් නෙලීම හෝ වල්නාශක භාවිතා කිරීමෙන් හෝ වල් පැල පාලනයකල හැකිය. මතුපිට පොහොර යෙදීමට කලින් වල් නෙලීමකල යුතුය.

වල්නාශක ලෙස මෙට්‍රිබියුසින් (සෙන්කර්) හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 0.35 බීජ පැලවීමට ප්‍රථමයෙන් පමණක් යෙදීමකළ හැකිය. මිශ්‍ර වගාවකදී වල්නාශක භාවිතා කිරීම නොකල යුතුය.

## රෝග හා පළිබෝධ පාලනය

කැරට් පත්‍ර අංගමාරය සහ බැක්ටීරියා මෘදු කුණුවීම සාමාන්‍යයෙන් වැළදෙන රෝග වේ. තඹ මිශ්‍ර දිලීර නාශකයක් යෙදීමෙන් අංගමාරය වලකාගත හැකිය. වැඩිපුර ජලය සැපයීමෙන් වැලකී සිටීමෙන් බැක්ටීරියා කුණුවීම වලකාගත හැක. නොයෙක් දළඹු වර්ග, මයිටාවන්, කුඩිත්තන්, වේයන් වැනි කෘමි හානි නිර්දේශිත කෘමිනාශක යෙදීමෙන් පාලනය කල හැකිය.

## අස්වනු නෙලීම

කැරට් අලවල ඉහල කොටස සෙන්ටි මීටර් 2.5 - 5.3 පමණ විශාල වූ පසු නෙලාගත හැකිය. කැරට් අලයට හානි නොවන ආකාරයෙන් ගලවාගත යුතුය.

### අස්වැන්න

ඉතා හොඳින් නඩත්තුකල වගාවකින් හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 30-35 වඩා වැඩි අස්වැන්නක් ලබාගත හැකිය.

### පසු අස්වනු කටයුතු

කැරට් අල ගැලවීමෙන් පසුව හොඳින් පිරිසිදුකල යුතුය. පිරිසිදු ජලයෙන් සෝදා වෙළඳපල වෙත යැවිය යුතුය. බැක්ටීරියා විශේෂ අලවල රැඳී සිටීමෙන් කුණුවීම සිදුවිය හැකි නිසා සැලකිලිමත් විය යුතුය.

# බීට් රූට්

**බීටා වුල්ගාරිස්**

*Beta vulgaris*

**කුලය - කීනොපෝඩියේසී**



මෙය ශීත හා උෂ්ණ දේශගුණික තත්ව දෙකටම හොඳින් අනුවර්තනය වූ බෝගයකි. එනිසා ශ්‍රී ලංකාවේ සියළුම කෘෂි දේශගුණික කලාපවලට අයත් ප්‍රදේශයන්හි සාර්ථකව බීට් වගාකළ හැකිය.

## පස

හොඳින් ජලය බැසයන කාබනික ද්‍රව්‍ය අඩංගු පස්වල බීට් සාර්ථකව වගාකළ හැකිය. පසෙහි තිබිය යුතු පී.එච්. අගය 6.3 - 7.3 වේ.

## නිර්දේශිත ප්‍රභේද

### ක්‍රිම්සන් ග්ලෝබ්

දින 70 - 90 දී අස්වනු නෙලාගත හැකිය. බීට් අලය බාහිරව රතු දම් පැහැතිවන අතර, ඇතුලතින් තද රතු දම් පැහැති වේ. අලයේ මැද කොටස ලා රතු පාට වේ.

### ඩෙට්රොයිට් ඩාක් රෙඩ්

දින 70 - 90 ගතවන මෙම ප්‍රභේදයේ අලයේ පැහැයද ක්‍රිම්සන් ග්ලොබ්වලට සමානය.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 5 - 6

## තවාන් සැකසීම හා නඩත්තුව

හොඳින් හිරුඑළිය ලැබෙන ජලය රඳා නොපවතින ස්ථානයක් මේ සඳහා තෝරාගන්න.

බිම පෙරළා මීටරයක් පළල හා සෙන්ටි මීටර් 20 පමණ උස පාත්ති සකසා ගන්න. මෙම පාත්තිවලට හොඳින් දිරාපත් වූ කාබනික පොහොර දමා පස සමග මිශ්‍ර කරන්න.

බීජ සිටුවීමට පෙර තවාන් පාත්ති ජීවානුහරණයකර ගන්න. දහයියා හා පිදුරු තට්ටු කිහිපයක් පාත්ති මත දමා සෙමින් පිළිස්සීයාමට සැලසීම, දිලීරනාශක යෙදීම හෝ තද හිරු රැස් පවතින කාලයක විනිවිද පෙනෙන පොලිතීනයකින් තවාන ආවරණයකර සති 2 පමණ තැබීම මගින් මෙය ඉටුකර ගත හැකිය.

සෙන්ටි මීටර් 10 පරතරය සහිත පේලි දිගේ බීජ සිටුවන්න. සති 4 - 6 පමණ වයසැති හා අලය තරමක් වර්ධනය වී ඇති පැල සිටුවීම සඳහා යොදා ගැනේ.

මෙයට අමතරව ක්ෂේත්‍රයේ සකසාගත් පාත්තිවල එකවරම බීජ සිටුවීමදකළ හැකිය.

## බිම් සැකසීම

වගා කිරීමට බලාපොරොත්තු වන ඉඩමේ සෙන්ටි මීටර් 20-30 ගැඹුරට පස පෙරළා මීටරයක් පමණ පළල හා සෙන්ටි මීටර් 20 පමණ උස පාත්ති සකසා ගන්න. හොඳින් දිරාපත් වූ කාබනික පොහොර හෙක්ටයාරයකට ටොන් 10 පමණ දමා පසට කළවම් කරන්න.

## පැල සිටුවීම

පැල සිටුවීමට දින 2 පමණ පෙර මූලික පොහොර වශයෙන් යෙදිය යුතු රසායනික පොහොර ප්‍රමාණය පාත්තිවලට යොදා හොඳින් කළවම් කරන්න.

සිටුවීමට සුදුසු අවස්ථාවට පත්වූ පැල ප්‍රවේශමෙන් ගලවා ඒවායේ පත්‍රවල කෙළවර ප්‍රදේශයෙන් කපා දමන්න. ඉන්පසු මුදුන් මුලද තරමක් කපා දමා පාත්තිවල සිටුවා ජලය සපයන්න.

## පරතරය

වියළි කලාපයේ

පේළි අතර - සෙන්ටි මීටර් 30
පැල අතර - සෙන්ටි මීටර් 10

උඩරට ප්‍රදේශවල

පේළි අතර - සෙන්ටි මීටර් 30
පැල අතර - සෙන්ටි මීටර් 15

## පොහොර යෙදීම

බීජ පැල වී සති 2 පමණ ගත වූ පසුව තවානෙහි වර්ග මීටර් 5 පමණ ප්‍රදේශයකට යූරියා සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර ග්‍රෑම් 5 බැගින් යොදන්න.

කාබනික පොහොර යෙදීමට අමතරව වගාවට පහත සඳහන් අන්දමට රසායනික පොහොරද යෙදීමට කටයුතු කරන්න.

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 165 | 275 | 125 |
| සිටුවා සති 4කට පසු | 165 | - | 125 |

## ජල සම්පාදනය

පසෙහි තෙතමනය සැලකිල්ලට ගනිමින් දින 3 - 4 වරක් බැගින් ජලය සපයන්න.

## වල් පැළෑටි පාලනය

වගාවේ පැල සිටුවා සති 2 දී පළමුවරට වල් පැල ගලවා දමන්න. ඉන්පසු මතුපිට පොහොර යෙදීමට පෙර, එනම් සති 4 දී පමණ නැවත වරක් වගාවේ වල් පැල ඉවත් කරන්න.

## කෘමි පාලනය

### කියත් පණුවා

පැල පාමුල ප්‍රදේශයෙන් කපා දමා විනාශ කරයි. දරුණු හානියක් පවතින විට කාබොෆියුරාන්, එටොෆෙන්ප්‍රොක්ස්, ක්ලෝරොපයිරිපොස් හෝ ප්‍රොතියොපොස් වැනි කෘමිනාශකයක් පැලවලට යොදන්න.

### දියමලන්කෑම

බීජ පැලවල වයස සති 2 පමණ වනතෙක් වැළදෙන රෝගයකි. රෝග කාරක දිලීරය මුදුන්මුලට හා බීජාධරයට හානි කිරීම නිසා කුඩා පැල මැලවී මැරියයි. මේ සඳහා තිරාම්, කැප්ටාන් වැනි දිලීර නාශකයක් තවානට යොදන්න.

## අස්වැන්න නෙලීම

පැල සිටුවා දින 75 - 90 දී අස්වැන්න නෙලාගත හැකිය.

### අස්වැන්න

හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 12 - 15 කි.

### අස්වැන්න සැකසීම

බිට් අල ගැලවීමෙන් පසුව අවශ්‍යතාවය මත මේරූ පත්‍ර පමණක් ඉවත්කර හෝ පත්‍ර සම්පූර්ණයෙන්ම කපා දමා හෝ වෙළඳපොලට ඉදිරිපත්කෙරේ.

හොඳින් වාතාශ්‍රය ලැබෙන සේ ලණු ගෝනි වැනි ඇසුරුම්වල දමා වෙළඳපොලට ඉදිරිපත්කළ යුතුය.

# ලීක්ස්

**ඇලියම් ඇම්පෙලෝප්‍රසම් කල්ටිවාර් පෝරම්**

*Allium ampeloprasum cv porrum*

**කුලය - ඇලියේසී**



ලික්ස් අයත් වන්නේ ළූණු අයත්වන ඇලියේසි කුලයටමය. නමුත් මෙම බෝගයේ ප්‍රධාන වෙනස වන්නේ එහි බල්බ නොසෑදීමයි. අප රටේ විවිධ ආකාරයට ලික්ස් ආහාරයට ගන්නා නිසා එය හැම විටම වෙළඳපොලෙහි සැලකිය යුතු මිළකට අලෙවි වේ. කෙසේ වුවද ළූණු වර්ගවල මිළ සෑහෙන ඉහළ මට්ටමක පවතින අවස්ථාවලදී, ළූණු සඳහා ආදේශකයක් ලෙසද ලික්ස් භාවිතා කිරීම ශ්‍රී ලාංකිකයන් අතර ජනප්‍රිය පුරුද්දක් වී තිබේ.

## දේශගුණික අවශ්‍යතා

ලික්ස් වගාව සඳහා වඩා සුදුසු වන්නේ අප රටේ උඩරට ප්‍රදේශයයි. උඩරට තෙත් කළාපයට හා අතර මැද කළාපයට අයත් නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල පවතින සිසිල් කාලගුණික තත්ව යටතේ මෙම බෝගය හොඳින් වර්ධනය වේ.

## පස

කාබනික ද්‍රව්‍ය බහුලව අඩංගුවන සාරවත් පස් බෝගය සඳහා වඩා සුදුසුය. පසෙහි තිබිය යුතු යෝග්‍යතම පී.එච්. අගය 5.0 - 6.0 වේ.

## නිර්දේශිත ප්‍රභේද

### ලාජ් ලෝංග් සමර්

මෙම ප්‍රභේදයේ පත්‍ර පටුය. දිගුය. ඍජුව පිහිටා ඇත. තද නිල් - කොළ පැහැතිය. කඳ ලා කොළ-සුදු පැහැතිය.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3.75 කි.

## තවාන් පාලනය

බිම පෙරළා ඉතා හොඳින් සියුම්ව පස සකසා ගන්න. හෙක්ටයාරයක් සඳහා මීටර් 3 ක් දිග. මීටරයක් පළල හා සෙන්ටි මීටර් 20 පමණ උස පාත්ති 200-225 අවශ්‍ය වේ.

මෙම පාත්තිවලට. හොඳින් දිරාපත්වූ ගොම පොහොර සැලකිය යුතු ප්‍රමාණයක්ද ත්‍රිත්ව සුපර් පොස්පේට් ස්වල්පයක්ද බැගින් දමා පස සමග කළවම් කරන්න.

පසෙහි පී.එච්. අගය 5 ට වඩා අඩු වූ විටදී නිර්දේශිත අන්දමට පසට හුණු යොදන්න. උදා: පී.එච්. අගය 4.9 වන විටදී අළු හුණු කිලෝ ග්‍රෑම් 1200 හෙක්ටයාරයට යෙදිය යුතුය. හුණු යෙදීමකළ යුත්තේ බීජ වැපිරීමට සති 03 කට පමණ පෙරදීය.

## තවාන් දැමිය යුතු කාලය

- උඩරට තෙත් කළාපය - වසර පුරාම
- උඩරට අතර මැද කළාපය - ඔක්තෝබර් නොවැම්බර්.

සියුම් මතු පිටක් සිටිනසේ සකසාගත් තවාන් පාත්තිවල එකිනෙකට සෙන්ටි මීටර් 15 පරතරයකින් වූ පේලි දිගේ බීජ දැමීම හෝ වැපිරීමකළ හැකිය. බීජ දැමීමෙන් පසු තුනී පස් තට්ටුවකින් වසන්න.

තවානට අවශ්‍යවන පරිදි තෙතමනය ලබා දෙන්න. තවාන් පැලවලට උදය පාන්දරින් පත්‍රවල පිණි සේදී යන පරිදි ජලය සපයන්න. තවානේ වල් පැල හා කෘමි රෝග ආදිය පාලනයකර ගැනීම කෙරෙහිද සැළකිලිමත් වන්න. පැල කුඩා අවධියේදී කියත් පණු හානිය වළකා ගැනීම සඳහා කාබොෆියුරාන් ස්වල්පය බැගින් පාත්තිවලට යෙදිය හැකිය. ලික්ස් පැල කුඩා කාලයේදී වැඩි අවධානයකින් යුතුව රැක බලාගත යුතුය. සිටුවීමට සුදුසු තත්වයේ ඇති පැන්සලක් පමණ කඳ මහත්වූ පැල තවානෙන් ලබා ගැනීම සඳහා මාස 2 1/2 - 3 පමණ කාලයක් ගත වේ.

## ක්ෂේත්‍රය පිළියෙල කිරීම

සෙන්ටි මීටර් 30 - 40 ගැඹුරට පස පෙරළා හොඳින් කැට පොඩිකර ගන්න. හෙක්ටයාරයකට ටොන් 10 - 20 පමණ, දිරාපත්වූ කාබනික ද්‍රව්‍ය පසට යොදන්න. පසෙහි පී.එච් අගය 5 වඩා අඩු නම් නිර්දේශිත පරිදි අවශ්‍යවන අළු හුණු ප්‍රමාණය පසට යොදන්න. මීටර් 1.2 පමණ පළල මීටර් 3 පමණ දිග පාත්ති සකසා ගන්න. මෙවැනි පාත්ති 2750 පමණ සංඛ්‍යාවක් හෙක්ටයාරයක වගාවක් සඳහා අවශ්‍ය වේ.

## පැල සිටුවීම හා පරතරය

තවානෙහි නියම ප්‍රමාණයකට වැඩී ඇති නිරෝගී පැල ප්‍රවේශමෙන් ගලවන්න. එකී පැලවල පත්‍ර හා මුල් කෙළවරින් මදක් කපා දමා සිටුවන්න

පේලි අතර සෙන්ටි මීටර් 15 සහ පේලියක පැල අතර සෙන්ටි මීටර් 10 වනසේ එක් ස්ථානයක එක පැලය බැගින් සිටුවන්න.

## පොහොර යෙදීම

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 85 | 275 | 50 |
| සති 4 දී | 85 | - | - |
| සති 8 දී | 85 | - | 50 |
| සති 12 දී | 85 | - | - |
| සති 16 දී | 85 | - | 50 |

## වල් පැළෑටි පාලනය

සති 2 දී පාත්තිවල වැඩී ඇති වල් පැල පළමු වරට ගලවා දමන්න. ඉන්පසු සෑම පොහොර යෙදීමකටම පෙර ද වල් පැල ඉවත් කරන්න. පොහොර යොදන සෑම අවස්ථාවකටම පසුව ගස් අසලට පස් එකතු කරන්න. මෙමගින් ලික්ස් ශාකයේ දණ්ඩ ඍජුව සහ සුදු පැහැතිව තබා ගැනීමටද ඉඩ ලැබේ.

## ජල සම්පාදනය

පැල සිටුවා දින 4 පමණ ගතවන තෙක් දිනපතා වගාවට ජලය සපයන්න. ඉන්පසු අවශ්‍යතාවය මත දින 3 - 4 වරක් බැගින් ජලය සපයන්න.

## මිශ්‍ර වගාවක් ලෙස

නුවරඑළිය ප්‍රදේශයේ බොහෝ ගොවීන් විසින් ලික්ස් වගා කරන්නේ එකම පාත්තියෙහි බීට්, කැරට්, සලාද වැනි බෝග සමග මිශ්‍ර වගාවක් ලෙසය. ලික්ස් වගාවෙන් අස්වැන්න ලබා ගැනීමට මාස 4 1/2 - 6 පමණ ගතවන නිසා මෙමගින් වැඩි ආදායමක් මෙන්ම භූමියෙන් වැඩි ඵලදායීතාවයක්ද ලබා ගැනීමට ඔවුනට හැකිවී තිබේ.

## කෘමි පාලනය

මෑතකදී නුවරඑළිය ප්‍රදේශයට විශාල තර්ජනයක්වූ "ලිරියොමයිසා හුඩොබ්‍රෙන්සිස්" නැමති පත්‍ර කණින්නාගේ හානිය නිසා ලික්ස් වගාවන්ට විශාල තර්ජනයක් ඇතිවී තිබේ.

ඇලෙන සුළු ද්‍රවයක් තැවරූ කහ පැහැති පොලිතීන් උගුල් යෙදීම, රෝගී ශාක කොටස් විනාශ කිරීම හා බෝග මාරුව මගින්ද නිර්දේශිත කෘමි නාශකයක් යෙදීමෙන්ද මෙම හානිය පාලනය කරගත හැකිය.

## රෝග පාලනය

### දම් පැහැ පුල්ලි රෝගය

මේරූ පත්‍රවල දම් - දුඹුරු පැහැති පැල්ලම් හට ගනී. සිටුවීමට පෙර බීජ ප්‍රතිකාර කිරීම, බෝග මාරුව හා නිර්දේශිත දිලීර නාශකයක් යෙදීමෙන් රෝගය පාලනය කරගත හැකිය.

## අස්වනු නෙලීම

සිටුවා මාස 4 1/2 දී පමණ අස්වනු නෙලීම ආරම්භකළ හැකිය. ගස්වල කදෙහි ප්‍රමාණය අනුව ශ්‍රේණිකර හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි ලණු පැදුරු වැනි ද්‍රව්‍යයකින් ආවරණයකර මිටි බැඳ වෙළඳපොලට යවන්න.

### අස්වැන්න

හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 19 - 24 කි.

# මාළු මිරිස්

**කැප්සිකම් අන්නුම්**

*Capsicum annuum*

**කුලය - සොලනේසී**



## දේශගුණික අවශ්‍යතා

ශ්‍රී ලංකාවේ සියලුම දේශගුණික කලාපවලම පාහේ වගාකළ හැකි බෝගයකි. මුහුදු මට්ටමේ සිට මීටර් 1500 පමණ දක්වාවූ උස් ප්‍රදේශයන්හි වසර මුලුල්ලේම මාළු මිරිස් වගාකල හැක. යල කන්නයේදී බෝගය වවන විට අතිරේක ජල සම්පාදනයකල යුතුය.

## පස

මිරිස් සඳහා හොඳින් ජලය බැස යන, ගැඹුරු සාරවත් ලෝම් පසක් අවශ්‍යවේ. අවශ්‍ය තරම් කාබනික පොහොර යෙදීමෙන් සැහැල්ලු වයනයකින් යුත් පස්වලද බෝගයෙන් සාර්ථක අස්වැන්නක් ලබාගත හැකිය. පසෙහි පී.එච්. අගය 5.5 - 6.8 අතර විය යුතුය.

## බිම් සැකසීම

භූමිය සෙන්ටි මීටර් 15-20 ක් දක්වා සීසෑමෙන් අනතුරුව දෙවරක් කැට පොඩි කිරීමෙන් පසු පාත්ති සකස්කර ගන්න. බෝගය සඳහා සාර්ථක ජලවහනයක් පසෙහි පැවතීම අත්‍යාවශ්‍ය වේ.

# නිර්දේශිත ප්‍රභේද

## හන්ගේරියන් යෙලෝ වැක්ස් (H.Y.W)

කහ පැහැති කරල්වල දිලිසෙන සුළු පෘෂ්ඨයක් ඇත. දිග සෙන්ටි මීටර් 15-20 පමණ වේ. කරල්වල හැඩය කේතු ආකාර වේ.

මෙම වර්ගය පහත රට සහ මැද රට තෙත් කලාප සඳහා නුසුදුසු වන්නේ බැක්ටීරියා හිටුමැරීමට දක්වන අධික සංවේදීතාවය නිසාය.

## සී.ඒ - 8

ලා කොල පැහැති කරලෙහි රැලි සහිත දිලිසෙන සුළු පෘෂ්ඨයක් ඇත. කරලේ අග, අලි හොඬක් මෙන් ඇතුලට නැමී ඇත. දිග සෙන්ටි මීටර් 15 - 20 ක් පමණ වේ. කරල අගක හැඩය දරයි.

# බීජ අවශ්‍යතාවය

C.A - 8 - හෙක්ටයාරයකට ග්‍රෑම් 100

H.Y.W - හෙක්ටයාරයකට ග්‍රෑම් 1750

# පැල සිටුවීමේ කාලය

මහ කන්නය - නොවැම්බර් සහ දෙසැම්බර්

යල කන්නය - අප්‍රේල් සහ මැයි

# තවාන් පිළියෙල කිරීම

තවාන් සඳහා හොඳින් ජලය බැසයන සෙවන නොමැති ස්ථානයක් තෝරා ගන්න.

පැල ක්ෂේත්‍රයේ සිටුවීමට මසකට පෙර තවානෙහි බීජ දමන්න මීටර් 3 × සෙන්ටි මීටර් 90 ප්‍රමාණයේ පාත්ති සකසන්න. මෙම පාත්ති සෙන්ටි මීටර් 15 පමණ උස්විය යුතුය.

තවාන් පාත්තියෙහි වර්ග මීටරයකට හොඳින් දිරාපත්වූ කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 3-4 බැගින් යොදා පස සමග කළවම් කරන්න.

තවානේදී පැලවලට වැලඳිය හැකි රෝග පාලනය කිරීම සඳහා බීජ තවාන් කිරීමට පෙර තවාන් පාත්ති ජීවානුහරණය කලයුතුය. මේ සඳහා පාත්ති මත පිදුරු සහ දහයියා තට්ටු කිහිපයක් අතුරා හොඳින් පුළුස්සා ගන්න. මෙහිදී රෝගකාරක ජීවීන් හා වල් පැල බීජ විනාශ වී යයි.

විනිවිද පෙනෙන තරමක් ඝනකම් පොලිතීනයක් මගින් තවාන් පාත්ති වසා සති දෙකක් පමණ හිරු රැස්වලට නිරාවරණයකර තද පස තම්බා ගැනීම මගින්ද කැප්ටාන් හෝ තිරාම් වැනි දිලීර නාශකයක් යෙදීම මගින්ද රෝග පාලනයකර ගත හැකිය.

මීට අමතරව දියමලන් කැම සහ ඇන්ත්‍රැක්නෝස් වැනි දිලීර රෝග මර්දනයකර ගැනීම සඳහා තවාන් දැමීමට පෙර කැප්ටාන් හෝ තිරාම් වැනි දිලීර නාශකයක් යොදා බීජ ප්‍රතිකාරකර ගන්න.

සකස් කරගත් පාත්තිවල වල් මර්දනය සහ පොහොර යෙදීම වැනි කටයුතු පහසු වනසේ සෙන්ටි මීටර් 10-15 පරතරයකින් පේලිය දිගේ සෙන්ටි මීටර් 01 පමණ ගැඹුරට බීජ දමා සියුම් පස් තට්ටුවකින් වසන්න. පිරිසිදු පිදුරු වැනි ද්‍රව්‍යයක් භාවිතාකර තවාන් වසුන් කරන්න.

බීජ තවාන්කර දින 05-06 කින් වසුන ඉවත් කරන්න. බීජ දමා දින 08-10 ක් ගතවන විට සියලුම බීජ පැලවී අවසන් වේ. ලපටි පැල වර්ෂාවෙන් සහ තද හිරු එළියෙන් ආරක්ෂාකර ගැනීම සඳහා විනිවිද නොපෙනෙන පොලිතීන් හෝ පොල් අතුවලින් ආවරණයකර ගන්න.

ක්ෂේත්‍රයේ සිටුවීමට පෙර පැල දැඩි කරගත යුතු හෙයින් ක්ෂේත්‍රයේ සිටුවීමට දින 10කට පමණ පෙර පැලවලට ජලය සපයනු ලබන කාලාන්තරය වැඩිකර ආවරණය ඉවත් කරන්න.

# පරතරය

දින 21 පමණ වයස් වූ පැල, ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු වේ.
H.Y.W - සෙන්ටි මීටර් 15 × සෙන්ටි මීටර් 30
C.A 8 - සෙන්ටි මීටර් 40 × සෙන්ටි මීටර් 40

# පොහොර යෙදීම

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 100 | 220 | 65 |
| සති 4 දී | 100 | - | 65 |

# ජල සම්පාදනය

දින 4-5 කට වරක් මුල් කාලයේදී ද, ඉන්පසු සතියකට පමණ වරක්වන පරිදිද ජල සම්පාදනයකල යුතුය. කෙසේ වුවද වර්ෂාපතනයේ ව්‍යාප්තිය අනුව ජල සම්පාදන කටයුතු වෙනස් වේ. පොහොර යෙදීමට පළමු හා පසු ජලසම්පාදනය අනිවාර්ය වේ.

පුෂ්ප පිපීමේදී හා ඵල හට ගැනීමේදී බෝගයට ඇතිවන ජල ඌණතාවය නිසා පුෂ්ප සහ කරල් වැටී යාමට හේතුවේ. එම නිසා ඒ අවස්ථාවේදී ප්‍රමාණවත් පාංශු තෙතමනයක් පවත්වා ගැනීම වැදගත්ය.

## වල් පැලෑටි පාලනය

සිටුවා සති 2 න් පසු ගස් මුල්වලට පස් එකතු කරමින් අතින් වල් මර්ධනය කරන්න. මේ මගින් ශාකය හොඳින් පසේ සංස්ථාපනය වේ. සති 2,4 සහ 8 කාලයේදී වල් නෙලීමකල යුතුය. රසායනික ද්‍රව්‍ය භාවිතා කරන්නේ නම් සිටුවා දින දෙකකට පසු ඇලක්ලෝර් 45% කිලෝ ග්‍රෑම් 1.4-2.4 හෙක්ටයාරයකට යෙදිය හැක.

## රෝග පාලනය

### දියමලන් කෑම

පැලවල පාදස්ථය හෝ මුල් කළුපැහැවී කුණුවී පැල මැරේ.

#### පාලනය

දිලීර නාශක යෙදීම, හොඳින් තවාන් පාලනය හා ජලවහනය හොඳින් සිදුකිරීම .

### ඇන්ත්‍රැක්නෝස් රෝගය

කරල්වලට වැලදේ. කරලේ දුඹුරු පුල්ලි ඇති වේ. පුෂ්පවෘන්ත, පුෂ්ප අංකුර හා රිකිලි දුර්වර්ණ වේ. රෝගය ශාකය පුරා පැතිරී පසුව මැරී යයි.

#### පාලනය

රෝගී ශාක කොටස් කෙෂ්ත්‍රයෙන් ඉවත්කර දිලීර නාශකයක් යොදන්න.

### හිටුමැරීම

ක්ෂණිකව ගස් මැලවේ. මුල් හා පාදස්ථ කොටස් කුනුවේ. බෝග මාරුව හා ජලවහනය දියුණු කිරීම මගින් මෙය වලකාගත හැකිය.

### කොල කොඩවීම

සුදුමැස්සා, කුඩිත්තන්, මයිටාවන්, මගින් මෙම රෝගය බෝවන නිසා ඔවුන් පාලනය සුදුසු කෘමිනාශකයක් මගින් සිදුකල යුතුය.

### පත්‍ර ලප

ඇන්ත්‍රැක්නෝස් ආකාරයටම පාලනය කල හැක.

### පිටි පුස් රෝගය

දින 7 කට හෝ 14 කට වරක් දිලීර නාශකයක් යොදන්න.

## අස්වැන්න

සිටුවා දින 75 කදී පමණ පළමු අස්වැන්න නෙලා ගත හැකිය.

H.Y.W (අස්වනු වාර 3-4)
හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 10-15

C.A - 8 තෙත් කලාපයේදී (අස්වනු වාර 8-10)
හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 6-8

වියළි කලාපයේදී (අස්වනු වාර 8-12)
හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 10-15

### අස්වනු නෙලීම

කරල් මත පිණි නොමැති, වියලි දිනයක් අස්වනු නෙලීම සඳහා යෝග්‍ය වේ. වර්ෂාව සහිත දිනයන්හිදී අස්වනු නෙලීමෙන් හැකි පමණ වලකින්න.

### පසු අස්වනු කටයුතු

අස්වැන්න නෙලා ගත් පසු හැකි ඉක්මනින් ප්‍රවාහනය සහ අලෙවියකල යුතුයි. මෙහිදී හොඳින් වාතාශ්‍රය ලැබෙන සිදුරු සහිත උර හෝ ප්ලාස්ටික් පෙට්ටි භාවිතාකල හැකිවේ.



ප්‍රවාහනයට පෙර ඉදීමට ආසන්න කරල් වෙන් කිරීමෙන් මේරූ කරල්වල ඉදීම ප්‍රමාදකල හැකි වේ. ශීත ගබඩා තුල තැන්පත් කිරීම සාර්ථකව කල් තබා ගැනීමේ ක්‍රමයකි.

# ගෝවා

**බ්‍රසිකා ඔලෙරාසියා**

*Brassica oleracea*

**කුලය - බ්‍රසිකේසී**



## දේශගුණික අවශ්‍යතා

ශීත දේශගුණයට ගෝවා බෝගය වඩාත් හොඳින් ඔරොත්තු දෙන අතර, වියළි කලාපයේද වගාකල හැකිය. නමුත් විවිධ කෘෂි පාරිසරික කලාපවලට නිර්දේශිත ප්‍රභේද වගාකළ යුතු වේ.

## පස

පී.එච්. අගය 6 - 6.5 වන පස වගාව සඳහා ඉතාමත් සුදුසුය. ආම්ලික බව වැඩි වූ විට ගෝවා බරවා රෝගයට පාත්‍රවීමේ ඉඩකඩ වැඩි වේ. කාබනික ද්‍රව්‍ය අඩංගු සාරවත් පසක් වගාව සඳහා තෝරාගන්න.

## බිම් සැකසීම

සෙන්ටි මීටර් 30 - 40 ගැඹුරට පස පෙරලා හොඳින් බිම් සකස් කරන්න. ආම්ලික පසක් නම් හෙක්ටයාරයකට ටොන් 2 ක් පමණ අළුහුණු යෙදිය යුතුය.

# නිර්දේශිත ප්‍රභේද

## උඩරට තෙත් කලාපය

### එක්සෝටික්

කොල පැහැති ගෙඩිය සාමාන්‍ය තද ගතියෙන් යුත් පැතලි රවුම් හැඩයෙන් යුක්ත වේ. දින 80 - 85 දී අස්වැන්න නෙලාගත හැක.

### හර්කියුලස්

කොලපාට ගොරෝසු පත්‍රවලින් යුත් ඉතාමත් තද ස්වභාවයක් සහිත රවුම් ගෙඩි වේ. දින 100 - 105 දී අස්වැන්න නෙලාගත හැකිය.

## මැදරට

### එක්සෝටික්

ගෙඩිය කොල පැහැ සාමාන්‍ය තද ගතියෙන් යුත් පැතලි සිට රවුම් හැඩයෙන් යුක්ත වේ.

### ඒ.එස්.ක්‍රොස්

දින 85 - 90 අස්වැන්න නෙලාගත හැකි මධ්‍යස්ථ තද ගතියෙන් යුක්ත පැතලි ගෙඩි වේ.

### කේ.වයි. ක්‍රොස්

දින 85 - 90 අස්වැන්න නෙලාගත හැකි මධ්‍යස්ථ තද ගතියෙන් යුක්ත රවුම් ගෙඩි වේ.

# බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට ග්‍රෑම් 200 - 250 කි.

# තවාන් පිළියෙල කිරීම

නිරෝගී දිරිමත් පැල ලබා ගැනීම සඳහා තවාන් පිළියෙල කිරීම වැදගත් වේ. මේ සඳහා සුදුසු ස්ථානයක් (ජල පහසුව තිබෙන, නිතර පරීක්ෂාකාරී විය හැකි, හිරුඑළිය වැටෙන, පෙරදී ගෝවා කුලයේ බෝගයක් වගා නොකල ඉඩමක් වීම) තෝරාගත යුතුවේ. ආම්ලික පසක් නොවන බිමක් වීමද ඉතාමත් වැදගත්ය.

මීටර් 1×3 ප්‍රමාණයේ පාත්තියක උස සෙන්ටි මීටර් 12 - 15 විය යුතුය.

කොම්පෝස්ට් හා මතුපිට පස් 1 : 1 වනසේ පිළියෙලකල පස් මිශ්‍රණයක්, තවාන මතුපිටට සෙන්ටි මීටර් 6 - 8 පමණ දමන්න. දියමලන්කෑම හා හානිකර රෝගකාරක ජීවීන් විනාශ කිරීම සඳහා පෝමොසොල්ෆොටේ (තිරාම්) තවාන් පාත්තිවලට යොදන්න. හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2 කි.




පේලි අතර පරතරය සෙ.මී. 10 වනසේද ගැඹුර සෙන්ටි මීටර් 1 ට නොවැඩි වනසේද පේලිවලට බීජ දමන්න. ජීවානුහරණය කරන ලද පස්වලින් බීජ වසා වසුනක් යොදන්න.

දින 4-5 දී බීජ පැලවූ විගස වසුන ඉවත්කර දිනපතා දෙවරක් බැගින් ජලය යොදන්න.

ආවරණයක් යොදා තද වැස්සෙන් සහ සතුන්ගෙන් ලපටි පැල ආරක්ෂාකර ගන්න. පැල සිටුවීමට දින 10 කට පමණ පෙර සිට පැල දැඩි කරගන්න. මේ සඳහා සූර්යාලෝකයට පැල නිරාවරණය කරනු ලබන කාලය ක්‍රමයෙන් වැඩි කරන්න. බීජ ග්‍රෑම් 1 කින් පැල 250 පමණ ලබා ගත හැකිය.

# පැල සිටුවීම

සති 3-4 පමණ වයසැති නිරෝගී දිරිමත් පැල ගලවා සවස් කාලයේදී සිටුවීම ඉතාමත් වැදගත්ය. පැල සිටුවා දිනකට දෙවරක් ජලය යොදන්න.

# පරතරය

පේලි අතර සෙන්ටි මීටර් 50 සහ පේලිය තුල සෙන්ටි මීටර් 40 ක පරතරයකින් පැල සිටුවන්න.

# පොහොර යෙදීම

- ආම්ලික පසක් නම් පැල සිටුවීමට දින 14 කට පෙර අළුහුනු යොදන්න.
- පැල සිටුවීමකට සතියකට පමණ පෙර කුකුල් පොහොර හෙක්ටයාරයකට ටොන් 10 වනසේ වලවල්වලට දමා, පස් සමග හොඳින් මිශ්‍ර කරන්න.
- පැල සිටුවීමට දින 2 පමණ පෙර මූලික පොහොර වශයෙන් නිර්දේශිත රසායනික පොහොර මිශ්‍රණය යොදන්න.

## නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | - | 275 | 75 |
| සති 2 දී | 110 | - | - |
| සති 5 දී | 110 | - | 75 |
| සති 8 දී | 110 | - | - |

## බදුල්ල හා සෙසු ප්‍රදේශ සඳහා

| යෙදිය යුතු කාලය | යූරියා කි.ග්‍රෑ./හෙක්. | ත්‍රිත්ව සුපර් පොස්පේට් කි.ග්‍රෑ./හෙක්. | මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ./හෙක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 110 | 275 | 75 |
| සති 3 දී | 110 | | |
| සති 6 දී | 110 | - | 75 |

# ජල සම්පාදනය

පැල සිටවූ මුල් දිනවල, දිනකට දෙවරක් බැගින් ජලය යොදන්න.

ඉන්පසු දිනකට එක් වරක් ජලය සැපයීම සෑහේ. එහෙත් වගාවට මාස 1 1/2 පමණ වූ අවස්ථාවේ සිට (ගෙඩි හටගැනීම සහ විශාලවන අවස්ථාවේදී) ප්‍රමාණවත් ජල සැපයුමක් ලබාදීමට වගබලා ගන්න.

# වල් පැලෑටි පාලනය

වල් මර්දනය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. මතුපිට පොහොර යෙදීමට පෙර වල්පැල ඉවත් කරන්න.

# රෝග පාලනය

## දියමලන්කෑම

තවාන් දැමීමට පෙර දිලීර නාශකයක් යෙදීම. ක්‍රමානුකූල අන්දමට වගා ක්‍රම අනුගමනය කිරීම.

## යටිපුස් රෝගය

බේකෝර් නැමති දිලීර නාශකය නිර්දේශිත ප්‍රමාණයට යොදන්න.

## කළු කුනුවීම

සැන්තොමොනාස් කම්පෙස්ට්‍රිස් නම් බැක්ටීරියාව මගින් වැලදෙන මෙම රෝගය වලක්වා ගැනීම සඳහා නියමිත වගාක්‍රම හා ශෂ්‍ය මාරු ක්‍රම අනුගමනය කිරීම සුදුසුය.

## බරවා රෝගය

පසෙහි ආම්ලිකබව වැඩි ස්ථානවල මෙම රෝගය නිසා වගාවට දරුණු හානි ඇතිවිය හැකිය. ප්ලැස්මොඩියොෆෙරා බ්‍රැසිකේ නම් දිලීරයෙන් සෑදෙන මෙම රෝගය වලක්වා ගැනීම සඳහා නියමිත වගා ක්‍රම අනුගමනය කිරීම, ශෂ්‍ය මාරු ක්‍රම අනුගමනය කිරීම වැදගත්ය.

## පත්‍ර පුල්ලි රෝගය

මයිකොස්පරෙල්ලා බ්‍රැසිකෝලා නම් දිලීරයෙන් වැලදෙන මෙම රෝගය මර්දනයට ටෙබුකොනසෝල් (පොලිකර්) මිලි ලීටර් 0.35 ජලය ලීටර් 1 ක දියකර යෙදිය යුතුවේ.

# කෘමි පාලනය

## කියත් පණුවා

පැල කුඩා කාලයේදී මෙම හානිය ඇතිවන බැවින් පැල සිටවූ විගසින් ප්‍රොෆෙනොපොස් 50% (සෙලික්‍රොන්) මිලි ලීටර් 25-28 ජලය ලීටර් 10 ක මිශ්‍රකර යෙදීම සුදුසු වේ.

## ලූපර් දලඹුවා, දියමන්ති සලබයා, කොල කන දලඹුවා සහ ගෙඩි විදින දලඹුවා

මර්දනය සඳහා එතොෆෙන්ප්‍රොක්ස් 10% (ට්‍රෙබෝන්), ක්ලෝර්ෆ්ලුවසුරෝන් (ඇටබ්‍රෝන්) නිර්දේශිත ප්‍රමාණය යෙදිය යුතුවේ.

# අස්වනු නෙලීම

ප්‍රභේදය අනුව අස්වනු නෙලීමේ කාලය වෙනස් වේ. (දින 90 - 110 අතර) ප්‍රමාණයට වඩා මේරීම නිසා ගෙඩි පුපුරන බැවින් අස්වනු නෙලීමට සුදුසු තත්ත්වයට පත් වූ විට නෙලාගත යුතුවේ.

උදේ වරුවේ අස්වනු නෙලිය යුතු අතර, තද හිරු එළිය ඇතිවිට අස්වනු නෙලීම නුසුදුසුය. ගෙඩියට හානි නොවන සේ පිටතින් ආවරණ පත්‍ර 2-3 සමග ප්‍රවේශමෙන් නෙලා ගන්න.

## අස්වැන්න

සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 40 පමණ වේ.

## අස්වැන්න සැකසීම

අස්වැන්න නෙලූ පසු පලුදු වූ ගෙඩි ඉවත් කරන්න. මනා වාතාශ්‍රයක් ලැබෙන ගෝනි වල ගොවා ඇසිරීමකළ යුතුවේ. මෙය ඉතා වැදගත්ය. හැකි ඉක්මනින් වෙළඳපල වෙතට අස්වැන්න යවන්න. මෙමගින් පසුවට සිදුවන අස්වනු හානිය වලක්වාගත හැකිය.

# එළවළු තවාන් පාලනය

ඉතා කුඩා බීජ සහිත බොහෝ එළවළු බෝග වගා කිරීමේදී, පළමුව තවානක එම බීජ වගාකර පසුව ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා යෝග්‍ය අන්දමේ පැල නිපදවා ගනු ලැබේ. මේ අන්දමට තවාන් සකසා වගා බිමෙහි සිටුවීමට සුදුසු ආකාරයේ පැල නිපදවා ගනු ලබන බෝග වන්නේ බටු, මිරිස්, මාළු මිරිස්, තක්කාලි, ගෝවා, මල් ගෝවා, ලීක්ස්, බීට්, නෝකෝල්, සලාද ආදියයි. කැරට් බීජ ද ඉතා කුඩා වුවත්, මේ අන්දමට තවාන් සකස්කර පැල නිපදවා ගැනීමක් සිදු නොවේ. කැරට් බීජ තවාන්කර පැල ගලවා ක්ෂේත්‍රයේ සිටුවීම කලහොත් මුදුන් මුලට හානි ඇතිවී කැරට් අල විකෘති වී වෙළඳ අගය අඩුවීම මෙයට හේතුවයි. මෙයට අමතරව, විශේෂ හේතූන් මත විශාල බීජ සහිත එළවළු බෝග සඳහා ද විශේෂ තවාන් ක්‍රම උපයෝගීකර පැල නිපදවාගත හැකිය.

කුඩා කාලයේදී පහසුවෙන් පැල රැකබලා ගත හැකිවීම, ශක්තිමත් හා නිරෝගී පැල වැඩි සංඛ්‍යාවක් නිපදවා ගත හැකිවීම සහ, ඉඩමේ එකවර බීජ සිටුවීම සඳහා අවශ්‍යවන බීජ ප්‍රමාණයට වඩා අඩු බීජ ප්‍රමාණයකින් අවශ්‍ය පැල සංඛ්‍යාව නිපදවා ගත හැකිවීම ආදී කරුණු, බීජ තවාන්කර පැල නිපදවා ගැනීමේ ප්‍රධාන වාසි වශයෙන් සැලකිය හැකිය.

## ප්‍රධාන එළවළු තවාන් වර්ග

එලවළු පැල නිපදවීමට යොදා ගත හැකි තවාන් වර්ග කිහිපයක් ඇත. එහෙත් ඒවා සකස් කරන ආකාරය පදනම් කරගෙන ප්‍රධාන කාණ්ඩ 2 කට බෙදා වර්ගීකල හැක.

(අ) පිහිටි බිමෙහිම සකස් කරනු ලබන තවාන්
උදා: උස් තවාන්, ගිල්වූ තවාන්

(ආ) තවාන් මිශ්‍රණයක් යොදා ගනිමින් සකස් කරනු ලබන තවාන්
උදා: නොර්දෝකෝ (කුට්ටි) තවාන, බඳුන් තවාන, පෙට්ටි තවාන, තවාන් තැටි සහ අපතේ යන ද්‍රව්‍ය (යෝගට් කෝප්ප, පොල්කටු, ටින් වැනි) වලින් සකස් කරන තවාන්.

දැනට එලවළු වගාකරුවන් බහුල ලෙසම යොදාගනු ලබන්නේ උස් තවාන්වන අතර බඳුන් තවාන්, නොර්දොකෝ තවාන් වැනි තවාන් ක්‍රම උඩරට ප්‍රදේශයේ සමහරක් වගා කරුවන් අතර ජනප්‍රිය වෙමින් පවතී. හරිතාගාර තාක්ෂණයත් සමගම හඳුන්වා දෙනු ලැබූ තවාන් ක්‍රමයක් ලෙසින් තවාන් තැටි හඳුන්වා දිය හැක.

## පිහිටි බිමෙහි සකසනු ලබන තවාන්

### සුදුසු බිමක් තෝරා ගැනීම

සිටුවීම සඳහා සුදුසු නිරෝගී හා දිරිමත් පැල වැඩි සංඛ්‍යාවක් නිපදවා ගැනීම කෙරෙහි බලපාන සාධක අතුරින් පළමුවැන්න වශයෙන් තවාන් දැමීම සඳහා සුදුසු ස්ථානයක් තෝරාගැනීම සැලකිය හැකිය.

නොකඩවා එළවළු වගී වගාකරන ලද බිමක් තවාන සඳහා කිසිවිටෙකත් තෝරා නොගත යුතුය. එසේම, එම ස්ථානයට දවසේ වැඩි කාලයක් නොකඩවා හිරුඑළිය ලැබීමත්, එහි අනවශ්‍ය අන්දමට ජලය රඳා නොපැවතීමත් බෙහෙවින් වැදගත්ය. මෙයට අමතරව පසෙහි ගල්, බොරළු ආදිය අඩුවෙන් පැවතීමද වැදගත් වේ. අපහසුවකින් තොරව ජලය ලබා ගැනීමට හැකි ස්ථානයක තවාන සැකසීමද කළ යුතුය. පාලනය කිරීමට අපහසු ඉළුක්, ඇටවරා, කලාඳුරු වැනි කරදරකාරී වල් පැලෑටි එම ස්ථානයෙහි නොපැවතීම ද වැදගත්ය.

### තවාන් බිම සැකසීම

බීජ තවාන් කිරීමට සති 3-4 කට පමණ පෙර සිට තවාන සකස් කිරීමට බලාපොරොත්තුවන ස්ථානයෙහි වල් පැලෑටි ආදිය ඉවත්කර සෙන්ටි මීටර් 20 පමණවත් ගැඹුරකට පස පෙරළිය යුතුය. මේ අන්දමට පස පෙරළීමේදී මතුවන ගල්, බොරළු ආදිය ඉවත් කරන්න. එයට අමතරව පස් පෙරලීමේදී හමුවන නොදිරූ ශාක කොටස්, පොලිතීන් වැනි දේ ඉවත් කිරීමට උනන්දුවන්න. තවද, පස් පෙරලීමත් සමග පසෙන් මතුවන කියත් පණුවන් හා සුදු පණුවන් වැනි අහිතකර පාංශු කෘමීන් ද තෝරා ඉවත් කරන්න.

පළමු පස් පෙරළීමට සතියකට පමණ පසු දෙවන වරටද එම ස්ථානයෙහි පස පෙරළා පස තෙත්කළ යුතුය. මේ අන්දමට කිහිප වරක් පස පෙරළීමෙන් එම ස්ථානයෙහි මතුවන වල් පැලෑටි විනාශ වේ. මෙයට අමතරව යටි පස හිරුඑළියට නිරාවරනය වීමෙන් පසෙහි සිටිය හැකි රෝගකාරක ජීවීන් ද පාලනය වේ.

# උස් තවාන් මගින් එලවළු පැල නිපදවීම

## උස් තවානේ පරිමිතියන්

වැසි වැඩි කාලවලදී හා මැටි වැඩි පස් සහිත ප්‍රදේශවලදී යොදා ගැනීමට සුදුසු තවාන් ක්‍රමයකි. එසේ වුවත් වැසි අඩු කාලවලදී හා වෙනත් පාංශු ලක්‍ෂණ සහිත ප්‍රදේශවලදී පවා මෙය යොදා ගැනීමට හැකිවීම මත මෙම තවාන් ක්‍රමය දිවයින පුරා සිටින එලවළු වගාකරුවන් අතර ජනප්‍රිය වී ඇත.




පාලන කටයුතුවල පහසුව උදෙසා උස් තවානේ පළල සෙන්ටි මීටර් 90 නොඉක්මවන ලෙස සකස්කල යුතු වේ. අවශ්‍යවන ප්‍රමාණයට දිග වෙනස්කර තවාන සකස්කර ගත හැක.

තවානේ සම්පූර්ණ උස සෙන්ටි මීටර් 15 ක් පමණවන අතර, එයින් පළමු සෙන්ටි මීටර් 10 තවානේ පිහිටි පස්වලින් සකස්කර ගත යුතු වේ. එම පස් තට්ටුව මතුපිටින් සෙන්ටි මීටර් 5 ක පමණ ඝනකමට පස් මිශ්‍රණයක් යෙදිය යුතුවේ. මෙය හලන ලද ගොම හා හලන ලද මතුපිට පස් 1:1 අනුපාතයට මිශ්‍රකර ගැනීමෙන් සකස්කර ගත හැක. උස් තවාන් පාත්ති එකකට වැඩි ගණනක් සකස් කරන්නේ නම් පාත්ති දෙකක් අතර අවම වශයෙන් සෙන්ටි මීටර් 30 ක පරතරයක් තබා තැබිය යුතු වේ.




# තවාන් පාත්ති ජීවානුහරණය

සකස්කර ගත් උස් තවානට බීජ යෙදීමට පෙර එහි ඇති පාංශු රෝගකාරකයින් අවමකර ගැනීම සඳහා තවාන ජීවානුහරණය කළයුතු වේ. මේ සඳහා යොදා ගත හැකි ක්‍රම කිහිපයක් ඇත.

(අ) පිළිස්සීම

(ආ) සූර්යාලෝකය ආධාරයෙන් ජීවානුහරණය

(ඇ) රසායනික ජීවානුහරණය

(ඈ) ධූමාකරණය

## (අ) පිළිස්සීම

සකස්කර ගත් තවානට ජලය එකතුකර තෙත් කරගන්න. වැඩිපුර ඇති ජලය බැසයාමට පැයක පමණ වේලාවක් තැබීමෙන් පසු එය පිලිස්සීමට යොදාගත හැක.

පිදුරු හා දහයියා තට්ටු ලෙස අතුරා තවාන සකස්කර ගන්න. ඉන්පසු සුළං හමන දිසාවට විරුද්ධ දිසාවෙන් යටින් ඇති පිදුරු තට්ටුවට ගිනි ඇවිලීමකළ යුතුය.




මෙම ක්‍රමය මගින් දිගු වේලාවක් තවාන තැම්බීම සිදුවන අතර, එමගින් දියමලන් කැමට හේතුවන රෝගකාරකයින් හා වෙනත් රෝගකාරකයින් ද වල් පැලෑටි බීජද විනාශ වේ.

## (ආ) හිරුඑළිය ආධාරයෙන් ජීවානුහරණය

සකස්කර ගත් තවාන ජලයෙන් තෙත්කර ගැනීම පළමුව කළ යුතුය. ඉන්පසු විනිවිද පෙනෙන පොලිතීන් ස්ථරයකින් තවාන සම්පූර්ණවම ආවරණය කරගන්න. තවාන වටා ඇති පොලිතින් කොටස තෙත් පස් දමා සීල්කර ගන්න. මෙලෙස සකස්කර ගත් තවාන සති 2 ක පමණ කාලයක් නොකඩවා සූර්යාලෝකයට නිරාවරණයකර තැබීම මගින් තවාන ජීවානුහරණය වේ.




## (ඇ) රසායනික ජීවානුහරණය

මීට ඉහත දී විස්තරකළ ජීවානුහරණ ක්‍රම දෙකම භාවිතා කිරීමට අපහසුවන අවස්ථාවන්හි දී දිලීර නාශක භාවිතා කරමින් තවාන ජීවානුහරණයකර ගැනීමට ද පුළුවන.
උදා: කැප්ටාන් හෝ තිරාම් වැනි දිලීර නාශකවලින් එක් වර්ගයක් (වගු අංක 1 හි) සඳහන් කරන ආකාරයට ජලයේ දියකර සාදාගත් ද්‍රාවණය මල් බාල්දියක් භාවිතා කරමින් තවාන් පස හොඳින් තෙත්වන ලෙසට යොදන්න. මෙම රසායනික ද්‍රව්‍ය භාවිතාකර දින 1-2 ක් ගතවූ පසු බීජ යෙදීම වඩාත් සුදුසුය.

වගුව 1: තවානට දිලීර නාශක යෙදීම

| දිලීර නාශක | තවානේ වර්ග මීටර 1කට |
|---|---|
| කැප්ටාන් 50% W.P. | ග්‍රෑම් 06ක් ජලය ලීටර් 05ක දියකර හෝ |
| කැප්ටාන් 80% W.P. | ග්‍රෑම් 04ක් ජලය ලීටර් 05ක දියකර හෝ |
| තිරාම් 80% W.P. | ග්‍රෑම් 07ක් ජලය ලීටර් 05ක දියකර |
| ක්ලොරොතැලොනිල් 500 ග්‍රෑම්/ලීටර් SC | මිලි ලී. 15 ක් ජලය ලීටර්. 05 ක දියකර |
| තයෝෆනේට් මීතයිල් 75%WP | ග්‍රෑම් 03 ක් ජලය ලීටර් 05 ක දියකර |
| තයෝෆනේට් මීතයිල් 50% + තිරාම් 30% WP | ග්‍රෑම් 05 ක් ජලය ලීටර් 05 ක දියකර |
| තයාබෙන්ඩසෝල් 45% DF | ග්‍රෑම් 01 ක් ජලය ලීටර් 05 ක දියකර |
| ෆ්ලුටැලොනිල් 50% WP | ග්‍රෑම් 03 ක් ජලය ලීටර් 05 ක දියකර |

## (ඈ) ධූමාකරණය

දුම්කොළ තවාන්කරුවන් විසින් යොදාගනු ලබන ජනප්‍රිය ජීවානුහරණ ක්‍රමයක් වන මෙය මගින් පාංශු රෝගකාරකයින්ට අමතරව වල් පැලෑටි බීජ ද වටපනුවන්ද පාලනය වේ.

මේ සඳහා ඩැසොමේට් 98% GR ග්‍රෑම් 20-30 ක් තවානේ වර්ග මීටර් 1 කට යෙදිය හැක. තවානට ඩැසොමේට් යෙදිය යුත්තේ බීජ සිටුවීමට අඩු වශයෙන් දින 14 කට වත් කලිනි. ප්‍රතිකාරය යොද දින 4-8 කට පසු පස් ලිහිල්කර වැඩියෙන් ඇති ධූමකාරකය ඉවත් වීමට ඉඩ හල යුතුවේ.

# බීජ ප්‍රතිකාර කිරීම

ආනයනය කරනු ලබන එළවළු බීජ වර්ග බොහෝ විට රසායනික හෝ වෙනත් උපක්‍රම යොදා ප්‍රතිකාර කිරීමෙන් පසු වෙළඳ පොළට නිකුත්කර ඇත. දේශියව නිපදවන බීජ සඳහා බීජ ප්‍රතිකාරකර අලෙවි කිරීම බොහෝවිට සිදු නොවේ. දේශීයව නිපදවා ගන්නා බීජ තවාන් කිරීමට ප්‍රථම දිලීර නාශකය සමග හොඳින් කලවම්කර සිටුවීම කළයුතු වේ.

බීජ මගින් පැතිරෙන රෝග කාරකයින් හේතුකර ගෙන තවානේදීම බීජ පැලවලට රෝග ඇති කිරීමට ඇති අවදානම අඩු කිරීමට බීජ ප්‍රතිකාර කිරීම ඉවහල් වේ.

වගුව 2: බීජ ප්‍රතිකාර සඳහා දිලීර නාශක භාවිතය

| දිලීර නාශකය | බීජ විශාලත්වය | නිර්දේශිත ප්‍රමාණය බීජ කි.ග්‍රෑම් 1කට |
|---|---|---|
| කැප්ටාන් 50% W.P. | කුඩා බීජ | ග්‍රෑම් 06 |
| | විශාල බීජ | ග්‍රෑම් 03 |
| කැප්ටාන් 80% W.P. | කුඩා බීජ | ග්‍රෑම් 3.75 |
| | විශාල බීජ | ග්‍රෑම් 02 |
| තිරාම් 80% W.P. | කුඩා බීජ | ග්‍රෑම් 4.5 |
| | විශාල බීජ | ග්‍රෑම් 02 |
| තයෝෆනේට් මීතයිල් 50% + තිරාම් 30% W.P. | කුඩා බීජ | ග්‍රෑම් 04 |
| | විශාල බීජ | ග්‍රෑම් 02 |

# බීජ යෙදීම

පලමුව තවාන මතුපිට ඇති පස් මිශ්‍රණය ලෑලි පටියක් ආධාරයෙන් හොඳින් තදකර මට්ටම්කර ගැනීම අවශ්‍ය වේ. මෙම ක්‍රියාව වඩාත් සාර්ථක වන්නේ තවානේ ප්‍රශස්ථ තෙතමන තත්ත්වයන් පැවතුනහොත් පමණි. ඉන්පසු කුඩා රීප්ප පටියක් ආධාරයෙන් බෝගයට ගැලපෙන පරතරයන් ඇතිවන ලෙස හා නොගැඹුරින් කුඩා ඇලි සකසා ගන්න.

| බීජවල විශාලත්වය | පේලි අතර පරතරය | පේලියක ගැඹුර |
| --- | --- | --- |
| කුඩා බීජ | සෙ.මී. 10 (අගල් 4) | මි.මී. 6 (අගල් 1/4) |
| විශාල බීජ | සෙ.මී. 12 (අගල් 6) | මි.මී. 12 (අගල් 1/2) |

මෙම ඇලි දිගේ පේලියට ඒකාකාරීව හා තුනීව වැටෙන ලෙසට බීජ යෙදීම කලයුතු වේ. පේලිවලට යෙදූ බීජ වසා දැමීමට වඩාත් යෝග්‍ය වන්නේ ජීවානුහරණය කරගත් තවාන් පාත්තියකින් ලබාගත් පස් වේ. මේ නිසා තවාන ජීවානුහරණය කරගත් පසු තවානේ මතුපිටින් පස් ටිකක් මේ සඳහා වෙන්කර තබා ගැනීම වඩාත් යෝග්‍ය උපක්‍රමය වේ. බීජ යෙදූ පසු එය වැසෙන ලෙස පේලිවලට මෙම පස් මිශ්‍රණය යොදා නැවත ලෑල්ලකින් තදකර ගැනීම කලයුතු වේ.

## වසුන් යෙදීම

තවානට බීජ දැමූ පසු එය හොඳින් පැලවීමටත්, බීජවල ආරක්‍ෂාව සඳහාත්, තවාන මතුපිට ආවරණයක් යෙදීම අවශ්‍ය වේ.




මෙම ආවරණය වසුන ලෙසින් හැඳින්වෙන අතර, ඒ සඳහා ගෝනි හෝ දිරාපත් නොවූ පිදුරු හෝ යොදාගත හැකිය. පිදුරු යොදාගන්නේ නම් ඒ සඳහා අළුත් පිදුරු යොදාගැනීම වඩාත් උචිත වේ. වරක් භාවිතාකල ගෝනි යොදා ගන්නේ නම් ඒවා හොඳින් සෝදා පිරිසිදුකර තද අව්වේ වියලා ගැනීම වඩාත් සුදුසුය.

## ආවරණ සැපයීම

වසුන ඉවත්කල පසුව තද වර්ෂාව මගින් ලපටි බීජ පැලවලට හානි ඇතිවිය හැක. එය වලකා ගැනීමට නැමෙන සුළු කෝටුවලින් හෝ උණ ගස්වලින් පලාගත් උණ පටිවලින් හෝ සකසා ගත් ආරුක්කුවක ආධාරයෙන් විනිවිද පෙනෙන, පොලිතීන් ආවරණයක් සකස්කර ගත යුතුය.



වර්ෂාව හා පින්න පවතින අවස්ථාවලදී පොලිතීන් ආවරණයෙන් තවාන වසා තිබිය යුතුවේ. වර්ෂාව නොමැතිවිට ආවරණය ඉවත් කරන්න.

## ජලය සැපයීම

තවානේ මුල් අවස්ථාවේ දී මල් බාල්දි මගින් ජලය සැපයීම වඩාත්ම උචිත ක්‍රමය වේ. වාරි ජලයෙන් තවාන ගිල්වා ජලය සැපයීම කිසිදුවිටක නොකල යුතුය.

පවතින කාලගුණ තත්ව මත දිනකට වාර 1-2 පමණ ජලය සැපයීමකළ යුතුය. එහෙත් ජලය වැඩිපුර යෙදීමෙන් රෝග හානි වැඩිවන හෙයින් ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.

## පලිබෝධ නාශක භාවිතය

රෝගවලින් තවාන ආරක්‍ෂාකර ගැනීමට නිර්දේශිත දිලීර නාශක භාවිතා කලයුතු වේ. මීට අමතරව තවාන් පසේ සිටින කියත් පණුවන්, සුදු පනුවන්, වේයන් හා කුහුඹුවන් වැනි සතුන්ගෙන් බීජ හා පැලවලට හානි ඇතිවිය හැක. එය වලකාලීමට වසුන යෙදූ අවස්ථාවේ දී කෘමිනාශක පසට යෙදීම අවශ්‍ය විය හැක.

## පැල දැඩි කිරීම

පැල ගැලවීමට දින කිහිපයකට පෙර සිට තවානට ජලය යොදන වාර ගණන අඩු කිරීම (ජලය යොදන කාල අන්තරය වැඩි කිරීම) මගින් ක්ෂේත්‍ර තත්ත්ව වලට ඔරොත්තු දෙන තත්ත්වයට තවාන් පැල සකසා ගත හැකිය. මෙමගින් පැල සිටවූ පසුව පාලූ ඇතිවීම අවම වේ.

## පැල ගැලවීම

තවානේ ඇති පැල සිටුවීමට වඩා සුදුසුම අවස්ථාව බෝග වර්ග අනුව වෙනස් වේ. එම අවස්ථාවට පත්වූ ශක්තිමත් හා නිරෝගී පැල සකසාගත් බිමෙහි සිටුවීම ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුය. වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා මෙය බෙහෙවින් වැදගත් වේ.

පැල ගැලවීමට පෙර තවාන් පස හොඳින් තෙත් කිරීම වැදගත්ය. පැල ගැලවීමට භාවිතා කරන අත් මුල්ලුව මගින් පේලි අතර, පස් බුරුල් කරමින් පස් සමග මුල් නොකැඩෙන ලෙස පැල ගලවා ගන්න.

ගලවන ලද පැලවල මුල් නොකැඩෙන ලෙස පස් සමග සිටුවීමට බලාපොරොත්තුවන ස්ථානය වෙත ගෙනයා යුතුය.

## තවාන් මිශ්‍රණයක් (මාධ්‍යයක්) යොදා ගනිමින් සකසනු ලබන තවාන්

වගාකරුවන් අතර බෙහෙවින් ජනප්‍රිය වී ඇති සම්ප්‍රදායික එළවළු තවාන්වලින් මෙම තවාන් වර්ගය වෙනස් වන්නේ එළවළු බීජ පැලකර ගන්නේ විශේෂයෙන් සකස්කර ගත් තවාන් මාධ්‍යයක නිසාත්, පිහිටි පොළව සහ තවාන් පැල අතර සෘජු සම්බන්ධයක් නැති නිසාත් වේ. මෙයට අමතරව මෙම තවාන්වල දී පැලවල වර්ධනය සාර්ථක කරගැනීම සඳහා අවශ්‍යවන තත්ත්වයන් බොහොමයක් වගාකරුවා හට එතරම් අපහසුවකින් තොරව පාලනය කරගත හැකි වීමද වාසියකි. මෙවැනි තවාන්වල නිපදවනු ලබන පැල නැවත වගා බිමෙහි සිටුවීමේදී ඒවායේ මුල්වලට සිදුවන හානිය ඉතා අවම වේ. එනිසා පැලවල වැඩීම බාල නොවේ. සිටුවීමෙන් පසුව මිය යන පැල සංඛ්‍යාවද බෙහෙවින් අඩුය. එසේම ක්ෂේත්‍රයේ සිටුවීමකල පසු වගාවේ ඒකාකාරී වර්ධනයක් ද දැකගත හැකිය.

මෙයට අමතරව මෙවැනි පැල සිටුවන ලද වගාවක අස්වැන්න නෙලීම, සාමාන්‍ය තවානකින් ලබාගත් පැල සිටුවන ලද වගාවකට වඩා සති 1-2 පමණ කාලයකට පෙර සිට ආරම්භ කළ හැකිවීම තවත් වාසියකි.

## කුට්ටි තවාන් (නොරිදෝකෝ තවාන්)

මෙය, ජපානයේ ගොවීන් විසින් එළවළු පැල නිපදවීම සඳහා යොදාගන්නා ලද එක් තවාන් ක්‍රමයකි. මෙහිදී හලන ලද ගොම සහ සරු මතුපිට පස් 1 : 1 අනුපාතයට මිශ්‍රකර, ජලය අවශ්‍ය පමණට යොද කුට්ටිවලට කපා ගත යුතුය. එම කුට්ටි මත බීජ හෝ පැල සිටුවීම මෙහිදී සිදුකරනු ලැබේ. තක්කාලි, බටු, ගෝවා, මිරිස් වැනි කුඩා බීජ සහිත එළවළු වර්ග පමණක් නොව අවශ්‍ය අවස්ථාවලදී තරමක් විශාල බීජ සහිත වට්ටක්කා, කරවිල වැනි බෝගයන්හි පැල නිපදවීමට ද මෙම තවාන් ක්‍රමය උපයෝගී කරගත හැකිය.

## අවශ්‍ය ද්‍රව්‍ය

- සැලකිය යුතු කාලයක් වගා නොකරන ලද ඉඩමකින් ලබාගත් සරුබවින් යුත් මතුපිට පස්
- හොඳින් හලාගත් දිරාපත් වූ ගොම
- කර කරගත් දහයියා ස්වල්පයක්
- තවානේ පිටත දාරයට යෙදීම සඳහා ලී රාමුවක් හෝ ඒ සඳහා යොදාගත හැකි ලී පටි හෝ ගඩොල්.

නිසරු පස් හෝ මැටි ස්වභාවයෙන් වැඩි හෝ පස් යොදා ගතහොත් තවාන අසාර්ථක විය හැකිය. ලී රාමුවක් සකසා ගන්නේනම්, ඒ සඳහා සෙන්ටි මීටර් 06ක පටි යොදාගන්න. රාමුවේ පළල සෙන්ටි මීටර් 90 නොඉක්මවිය යුතුය. ඉඩකඩ ඇති ප්‍රමාණය අනුව එහි දිග වෙනස් කරගත හැකිය.




## තවාන සැකසීම

- හොඳින් හිරු එළිය වැටෙන සමතලා ස්ථානයක් තවාන සඳහා තෝරාගන්න. ඉන්පසු එම ස්ථානයෙහි වල්පැලෑටි උදළු ගා ඉවත් කරන්න.

- අවශ්‍ය කුට්ටි ප්‍රමාණය අනුව සෙන්ටි මීටර් 90ක් පළලට සහ පහසු දිගක් සහිත රාමු කුංඤ මගින් පොළවට සවි කරන්න. ලී රාමු වෙනුවට සෙන්ටි මීටර් 06ක් උස ලී පටි හෝ ගඩොල් ආධාරයෙන් ද වටේ දාරය සකස්කර ගත හැකිය. තවානෙහි පලල සෙන්ටි මීටර් 90ට වඩා වැඩි වූ විට පොලිතින්වලින් තවාන නිසි ලෙස ආවරණය කිරීම සහ අනෙකුත් පාලන ක්‍රියාවන්ද අපහසු වේ.

- මෙයට පසුව රාමුව ඇතුලත බිම මත, කර කරගන්නා ලද දහයියා හෝ සිහින් වැලි තට්ටුවක් හෝ අතුරන්න. පසු අවස්ථාවකදී තවාන් කුට්ටි පොළවෙන් ඉවත්කර ගැනීමට මෙය උපකාර වේ.

- සරු පස් හා දිරාපත් වූ ගොම, සල්ලඩයක් ආධාරයෙන් වෙන වෙනම හලා ගන්න. මේ අන්දමට හලාගත් ගොම හා පස් සම අනුපාතයකින් (1 : 1) එකිනෙක සමග හොඳින් මිශ්‍රකර ගන්න. පසුව ජලය යොදමින් මැටි බදාමයක් ලෙස අනාගන්න. මේ අන්දමට සකස් කරගත් මිශ්‍රණය රාමුව තුල අතුරා අතින් තදකර මට්ටම් කරගන්න.

- මේ ආකාරයට අතුරා සකසාගත් මිශ්‍රණය තෙත් ගෝනි හෝ පිදුරුවලින් වසා පැය 3-4 පමණ කාලයක් පදම්වීමට ඉඩ හරින්න. මේ අන්දමට පදම්කර නොගතහොත් කුට්ටි කැපීම අපහසු වේ. එසේම හිරු එළියට නිරාවරනය කළවිට කුට්ටි ඉරි තැලී කැඩී යයි.

● තවාන් මිශ්‍රණය හොඳින් පදම් කරගත් පසුව, අවශ්‍ය ප්‍රමාණයට කුට්ටි කපාගත හැකිය. කුට්ටිවල විශාලත්වය තවාන් කිරීමට බලාපොරොත්තුවන බෝග වර්ගය අනුව තීරණය කරන්න. සාමාන්‍යයෙන් මෙවැනි තවාන් කුට්ටියක විශාලත්වය අගල් 1 1/2 × 1 1/2 × 1 1/2 හෝ අගල් 2 × 2 × 2 පමණ දක්වා වෙනස් විය හැකිය.




● පරණ පිහියක් සහ අවශ්‍ය තරම් පළලට සකසාගත් ලී පටියක ආධාරයෙන් කුට්ටි කපාගත හැකිය. තවාන් මිශ්‍රණය මත ලී පටිය තබා ඇතුලටම කැපී යන පරිදි පිහියේ ආධාරයෙන් කුට්ටිය කපා ගන්න. පිහියෙහි පස් ඇලී, කුට්ටි කැඩීයාම වළකා ගැනීම සඳහා වරින්වර පිහිය ජලය බඳුනක ගිල්වා තෙත්කර කැපීමට යොද ගන්න.

● මේ අන්දමට කපා ගන්නා ලද සෑම තවාන් කුට්ටියකම හරි මැදින් සිදුරක් සකසා ගන්න. ඉවත දමන බෝල් පොයින්ට් පෑනක පසු පස කොටස ආධාරයෙන් සිදුර සකසා ගැනීමෙන් ඒකාකාරී ගැඹුරකින් මෙම සිදුරු ඇතිකරගත හැකිය. මේ අන්දමට කුට්ටිවල සකසාගත් සිදුරුවල තවාන් කිරීමට අවශ්‍ය බීජ කෙලින්ම දැමීම හෝ වෙනත් ප්‍රාථමික තවානක සකසාගත් බීජ පැල ගලවා ගෙනැවිත් සිටුවීම හෝ කළ හැකිය.

## එකවරම බීජ සිටුවීම

● කුට්ටි තවාන්වල එකවරම බීජ සිටුවන්නේ නම් තවාන් කුට්ටිය මත සකසාගන්නා සිදුරු එතරම් ගැඹුරකට සකසා නොගත යුතුය. එහි ගැඹුර අගල් 1/4 පමණවීම සෑහේ. මෙම සිදුරු තුලට බීජ 2-3 පමණ දමා ගොම හා මතුපිට පස් සමව මිශ්‍රකර සාදාගත් මිශ්‍රණයෙන්ම බීජ වසා හොඳින් තදකර ගන්න.

● මේ අන්දමට බීජ යොදා තවාන මත තෙත ගෝනි හෝ තෙත පිදුරු අතුරන්න. වෙනත් තවාන්වල මෙන් නොව මෙහිදී තවානට බීජ යෙදූ විගස ජලය යෙදීම නොකරන්න. ජලය යෙදුවහොත් බීජ කුණුවීම වැඩිවිය හැකිය.

● බීජ පැලවූ විගස වසුන ඉවත් කරන්න. බීජ පැලවලට දින 10 පමණ ගතවූ පසුව එක් තවාන් කුට්ටියක එක් නීරෝගී පැලයක් පමණක් ඉතිරිකර සෙසු පැල ගලවා ඉවත් කරන්න.

## තවාන් කුට්ටි වල පැල සිටුවීම

● මේ සඳහා කුට්ටි තවාන සැකසීමට පෙර වෙනත් ස්ථානයක සාමාන්‍ය ආකාරයේ තවානක් සකසා එහි බීජ වපුරා පැල නිපදවා ගන්න. මෙය ප්‍රාථමික තවාන ලෙස හැඳින්වේ.

● මෙම ප්‍රාථමික තවානෙහි බීජ පැලවල පත්‍ර දෙකක් සහිත අවස්ථාවේදී ගලවා කුට්ටි තවාන්වල සිටුවිය යුතුය. මේ අන්දමට බීජ පැල සිටුවීමේදී තවාන් කුට්ටියේ සකස්කර ගන්නා සිදුරෙහි ගැඹුර සිටුවන පැලයේ මූල මණ්ඩලයේ ගැඹුර අනුව වෙනස් කරගන්න.

● ප්‍රාථමික තවානෙන් පැල ගැලවීමට ප්‍රථම එය හොඳින් තෙත්කර, මූල මණ්ඩලයට හානි නොවන පරිදි පැල ගලවා ගන්න. සිටුවීමේදී පැලවල පත්‍රවලින් පමණක් අල්ලා සිටුවන්න. කඳෙන් අල්ලා පැල ගැලවීම උචිත නොවේ.

● කුට්ටි තවාන්වල මෙවැනි කුඩා බීජ පැල සිටුවීමෙන් පසුව පැලවල මූල මණ්ඩලය හා තෙත පස එකිනෙක සමග හොඳින් සම්බන්ධවන පරිදි පස් මිශ්‍රණයෙන් ස්වල්පයක් යොදා මදක් අතින් තද කරන්න. ඉන්පසුව තවාන මදක් තෙත්වන පරිදි මල් බාල්දියකින් ජලය යොදන්න.

## තවාන නඩත්තුව

● තවාන ආවරණයකර ගැනීම සඳහා ආරුක්කුවක ආකාරයට කුඩා උණ පතුරු නවා එකිනෙකට සෙන්ටි මීටර් 45 ක පරතරයකින් තවාන මත සිටුවා ගන්න. ඉන්පසුව සෙන්ටි මීටර් 75 ක් පළල පොලිතීනයක් දෙකඩකර මෙලෙස සකසාගත් උණ පතුරු මත තවාන වැසෙන පරිදි අතුරා ගන්න. පාත්තිය දෙපස සවිකරගත් කුංඤවලට මෙම පොලිතීනය ගැට ගසන්න.

● පින්න සහිත රාත්‍රී කාලයේදී සහ වර්ෂාව ඇතිවිටදී පොලිතීනයෙන් තවාන වසා තබන්න. දිවා කාලයේදී පොලිතීනය ඉවත් කරන්න.



● තවාන් කුට්ටිවල තෙතමනය නිසි මට්ටමක පවත්වා ගත හැකිවන පරිදි කුඩා සිදුරු සහිත මල් බාල්දියකින් ජලය යොදන්න. තවානට සති 3 පමණ ගතවූ පසුව එහි වල් පැල තිබේනම් අතින් ගලවා ඉවත් කරන්න.

• පැලවල වැඩීම දුර්වල නම් වෙළඳ පොලෙහි ඇති දියර පොහොරක් තවානට ඉසින්න. එසේ නොමැති නම් යූරියා අවුන්සයක් ජලය ගැළුම් 2 මිශ්‍රකරගත් දියරය පැලවලට යොදන්න.

• තවාන් පැලවලට රෝග හා කෘමි හානි නිසා හානි පැමිණේදැයි නිතර පරීක්ෂාකාරී වන්න.

## පැල සිටුවීම

• තවානට සති 3-4 පමණ ගතවූ පසුව හෝ එක් එක් බෝග වර්ගය අනුව තවානෙහි පැල වැඩීමට ඉඩ හැරිය යුතු කාලය අවසන් වූ පසු කුට්ටි තවාන් පැල වගා බිමෙහි සිටුවීම සඳහා යොදා ගන්න. මේ සඳහා පළමුවෙන්ම කුට්ටි තවානෙහි රාමුව ඉවත් කරන්න.

• ඉන්පසුව තවාන් කුට්ටි කැපීම සඳහා යොදාගත් පිහිය මගින්ම කුට්ටි නැවත එකිනෙකින් වෙන්කර ගන්න. පිහි තලය කුට්ටිය යටින් දමා ඉස්සීමෙන් එය පහසුවෙන් ගැලවේ. මේ අන්දමට වෙන්කර ගත් තවාන් කුට්ටි සිටුවීම සඳහා වගා බිමට ගෙනයාමට සකසා ගත් තැටි භාවිතා කිරීම වඩා සුදුසුය.

• පැල සිටුවීමට ටික වේලාවකට පෙර, සකසාගත් වලවල්වලට ජලය යොදන්න. පැලය සහිත පස් කුට්ටිය වලේ සිටවූ පසු එය වැසෙන සේ පස්වලින් ආවරණය කරන්න.

## බඳුන් තවාන්

එළවළු වගා කිරීම සඳහා නිරෝගී වැඩි දිරියකින් යුතු පැල නිපදවාගත හැකි තවාන් ක්‍රමයකි. මේ අන්දමට නිපදවා ගන්නා පැලවල හොඳින් වැඩුන ශක්තිමත් මුල මණ්ඩලයක් ඇත. බඳුනේ ඇති තවාන් මාධ්‍යය සමගම වගා බිමෙහි පැල සිටුවන නිසා පැලවල වැඩීම බාල නොවේ. පැල සිටුවීමේදී මුල්වලට හානි නොවන නිසා පැල මියයාමක් හෝ තුවාල වූ මුල් හරහා රෝග කාරකයන් පැලයට ඇතුල්වීමක් හෝ සිදු නොවේ. සිටුවීමට යොදා ගන්නා බීජවලින් වැඩි පැල සංඛ්‍යාවක් ලබාගත හැකි නිසා, මෙම ක්‍රමය මිළ අධික දෙමුහුම් ප්‍රභේදවල බීජ තවාන් කිරීම සඳහා බහුල වශයෙන් යොදා ගනු ලැබේ. මෙය ගෝවා, බටු, තක්කාලි, මිරිස් වැනි කුඩා බීජ සහිත බෝග සඳහා වඩාත් සුදුසු තවාන් ක්‍රමයකි.



## බඳුන් සැකසීම

• විෂ්කම්භය සෙන්ටි මීටර් 13 සහ උස සෙන්ටි මීටර් 17 වූ කුඩා ප්‍රමාණයේ 'සෙලෝ පොලිතින් බඳුන් මේ සඳහා සාර්ථකව යොදාගත හැකිය. සාමාන්‍යයෙන් 'ග්‍රොසරි බෑග්ස්' යනුවෙන් හඳුන්වනු ලබන මෙම බඳුන් යොදා ගැනීම වඩා ලාභදායක ද වේ.

• පැල වැඩෙන විට බඳුන තුල එක් රැස්වන වැඩි ජලය ඉවත්ව යාම සඳහා බෑගයේ පහළ ප්‍රදේශයෙහි කුඩා සිදුරු 6-8 පමණ සකසා ගන්න.

• එසේම බඳුන් මිශ්‍රණය පුරවා ගැනීමට පෙර බෑගයේ විවෘත පැත්තේ දාරය අඟල් 1 1/2 පමණ ඇතුලට නවා ගන්න. එමගින් එහි වැනෙන සුළු බව අඩුකර ගත හැකිය.

• මෙම බඳුන් සඳහා තවාන් මිශ්‍රණය ලෙස සරු මතුපිට පස් සහ දිරාපත් වූ ගොම පොහොර වෙන වෙනම සල්ලඩකර, සම ප්‍රමාණවලින් මිශ්‍ර කරගන්න. මෙම මිශ්‍රණය තරමක් තෙත්කර ගැනීමෙන් බඳුන්වලට පුරවා ගැනීම වඩාත් පහසු වේ.

• මේ අන්දමට පස් මිශ්‍රණය පුරවාගත් බඳුන් එකිනෙකට ආසන්නව සිටින සේ තවාන සඳහා සකස් කරගත් ස්ථානයෙහි අසුරාගන්න. මෙසේ අසුරාගන්නා විටදී සෙන්ටි මීටර් 90 ට නොවැඩි පළලක් සහිතව බඳුන් අසුරා ගැනීමෙන් රැක බලාගැනීම වඩා පහසුවේ.

• මෙවැනි සෙලෝපොලිතින් බඳුන් වෙනුවට, කඩදාසිවලින් සැකසූ බඳුන් වුවද භාවිතාකළ හැකිය. මෙයට අමතරව විවිධ ප්‍රමාණයේ තවාන් තැටි ද වෙළඳ පොලෙන් මිලදී ගත හැකිය. එවැනි බඳුන් වාර ගණනාවක් පාවිච්චි කිරීමේ හැකියාව ද තිබේ



විවිධ ආකාරයේ තවාන් තැටි

## බදුන් මිශ්‍රණය ජීවාණුහරණය

බදුන්වලට පුරවාගත් තවාන් මිශ්‍රණයෙහි විවිධ රෝග කාරකයින් සිටියහොත් කුඩා එළවළු පැලවලට විශාල වශයෙන් හානි ඇතිවේ. මෙය වලකා ගැනීම සඳහා බීජ සිටුවීමට දින 1-2 පමණ පෙර සුදුසු දිලීර නාශකයක් යොදා බදුන් මිශ්‍රණය ජීවානුහරණය කරගන්න. මේ සඳහා කැප්ටාන් නැමති දිලීර නාශකයෙන් ග්‍රෑම් 15-20 ජලය ලීටර් 10 මිශ්‍රකර සාදාගත් දියරය මල් බාල්දියකින් බදුන්වලට යොදා තවාන් මිශ්‍රණය හොඳින් තෙත් කරගන්න.

## බීජ ප්‍රතිකාර කිරීම

බීජ සමග පැවතිය හැකි රෝග කාරක විනාශකර ගැනීම සඳහා සිටුවීමට පෙර සුදුසු දිලීර නාශකයක් බීජ සමග මිශ්‍රකර ගන්න. (නිර්දේශිත ප්‍රමාණ වගු අංක 02හි සඳහන්කර ඇත.)

## බීජ සිටුවීම

එක් බදුනක තිබිය යුතු පැල ගණන, බෝග වර්ගය හා වගා ක්‍රමය අනුව වෙනස්කල යුතුය. ඒ අනුව බීජ සිටුවීම සඳහා එක් බදුනක ඇතිකළ යුතු සිදුරු සංඛ්‍යාව එකක් හෝ දෙකක් හෝ විය හැකිය. මෙවැනි සිදුරක ගැඹුර අඟල් 1/4-1/2 අතර වීමට පිළිවන.

උදාහරණයක් ලෙස එක් බදුනක ගෝවා එක් පැලයක් ද තක්කාලි නම් පැල දෙකක් බැගින් ද පවත්වාගත හැක. සෑම බදුනකම බීජ සිටුවිය යුත්තේ එක සමාන ගැඹුරකිනි. එසේ නොවුනහොත් බීජ පැලවීම ද ඒකාකාරීව සිදු නොවේ. මේ සඳහා සරල උපකරණයක් සාදාගත හැකි අතර, එය බදුන් මිශ්‍රණය පිරවූ බදුන මත තබා තද කිරීමෙන් සෑම බදුනකම සම ගැඹුරකින් සිදුරු සකසාගත හැකිවේ. ඉන්පසුව සිදුරු තුලට බීජ දමා ජීවානුහරණය කරගත් බදුන් මිශ්‍රණයම යොදා වසා දැමිය යුතුය.

## වසුන් කිරීම

- මෙලෙස බීජ යෙදූ බදුන්වල බීජ පැලවන තෙක් මතුපිටින් වසුනක් යෙදීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා අඟල් 2 ක් පමණ ඝනකම පිදුරු තට්ටුවක් හෝ තෙත ගෝනි හෝ යොදාගත හැකිය.

- කුඹි හා වේයන්ගේ හානි සහිත ප්‍රදේශවලදී නම් ඒ සඳහා සුදුසු කෘමි නාශකයක් ජලයේ දියකර (වසුන යෙදූ පසු) වසුන ද තෙත්වන ලෙසට බදුන් මතට යොදන්න.

- දිනපතා බදුන්වල තෙතමනය පරීක්ෂාකර බලා අවශ්‍ය පරිදි ජල සම්පාදනය කරන්න. බීජ පැල පසෙන් මතුවූ විගසම වසුන ඉවත් කරන්න. බීජ පැල පසෙන් මතුවූ මුල් දින කිහිපයේ දී ඒවා ඉතා මෘදුවන හෙයින් වර්ෂාවෙන් ආරක්ෂා කරගැනීම අවශ්‍ය වේ. මේ සඳහා පොලිතීන් ආවරණයක්, බදුන්වලට ඉහලින් අර්ධ කවාකාරව සිටින ලෙස යොදාගන්න.

- බීජ පැල පත්‍ර දෙක සහිත අවස්ථාවට පත් වූ විට (බීජ සිටුවා දින 7-10 දී) බදුන්වල ඇති වැඩි පැල ඉවත් කරන්න. එලෙස ඉවත් කරන පැල නැවත, පළමුව සඳහන් කළ අයුරින් සකසා ගත් බදුන්වල සිටුවීමෙන්, පැල අපතේ යාම වලකී.

- බදුන් මාධ්‍යයේ තෙතමනය නිසි ලෙස පවත්වා ගෙන යාම සඳහා ක්‍රමවත්ව ජල සම්පාදනය කරන්න. පැල ක්‍රමයෙන් වර්ධනයවන විටදී පැල දැඩි කිරීම සඳහා හිරු එළිය ලබාදෙන කාලසීමාව ක්‍රම ක්‍රමයෙන් වැඩි කරන්න.

- කෘමි රෝග හානි පිළිබඳව නිතරම පරීක්ෂාකාරී වීම ඉතා වැදගත්වන අතර, අවශ්‍යවන්නේ නම් පමණක් සුදුසු පළිබෝධ නාශකයක් ඉසින්න.

## පැල සිටුවීම

- නියමිත කාල සීමාව තුලදී පැල සිටුවන්න. වඩා වැඩි කාලයක් බදුනේම පැල තබාගත් විට ගැඹුරට වැඩෙන මුල්, බදුන පතුලේ දී ගැට ගැසේ. එය අහිතකර තත්ත්වයකි.

- තවානේ සිට ක්ෂේත්‍රයට ගෙනයාමේ දී, පැලවලට හා බදුන්වලට හානි සිදුවීම වලකා ගැනීම සඳහා පැතලි පතුලක් සහිත භාජනයක අසුරාගෙන බදුන් ක්ෂේත්‍රයට ගෙන යන්න.

- බදුනේ සිරස් කැපුමක් යොදා බැගය ඉවත් කරමින්, පස් කුට්ටිය සමග පැල සිටුවන්න. පැල සිටුවීමේදී ඉවත්කරන සෙලෝපොලිතීන් බෑග් එක් තැනකට එකතුකර විනාශ කරන්න.

- මෙලෙස සැකසූ බදුන් පැල ගෙවතු වගා කරන්නන් හට අලෙවි කිරීම මගින් ආදායම් උපදවන මාර්ගයක් සකස්කර ගත හැකිය. තවද, ක්ෂේත්‍රයේ සිටුවන තෙක් පැලවලට හානි නොවන ලෙස තබා ගැනීම පහසු බැවින් එය වගාකරුවනට ද පහසුවක් වේ.

# කාබනික හා රසායනික පොහොර භාවිතයේ වැදගත්කම

බොහෝ එළවළු බෝග කෙටි මුල මණ්ඩලයකින් යුක්තය. මේ නිසා මෙම බෝග වර්ගවල ශාක පෝෂක අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා මුල මණ්ඩලය අවට කුඩා ප්‍රදේශයක සැලකිය යුතු ශාක පෝෂක ප්‍රමාණයක් තිබිය යුතුය.

මීට අමතරව මාස 3-4 ක් වැනි කෙටි කාලසීමාවකදී බොහෝ එළවළු බෝගවල ජීවිත කාලය අවසන් වේ. වෙනත් බෝග හා සසඳා බලන කල, එළවළු බෝගවල අස්වනු වශයෙන් ප්‍රයෝජනයට ගන්නා කොටස්වල සැලකිය යුතු ශාක පෝෂක ප්‍රමාණයක් අන්තර්ගත වේ. එනිසා එළවළු අස්වැන්න සමග අධික ශාක පෝෂක ප්‍රමාණයක් වගා බිමෙන් ඉවත් වේ. මෙයට අමතරව බොහෝ එලවළු බෝගවල ආහාරයට නොගන්නා දඬු හා කොළ වැනි කොටස්වලද සැලකිය යුතු ප්‍රමාණයක ශාක පෝෂක අඩංගු වේ. අස්වනු නෙලීමෙන් පසු මෙවැනි බෝග අවශේෂද වගා බිමෙන් ඉවත්කර, විනාශකර දැමීම නිසා ද සැලකිය යුතු ශාක පෝෂක ප්‍රමාණයක් පසට අහිමි වේ.



මින් හැඟි යන්නේ එළවළු බෝග වගා කරනු ලබන බිමෙන් නිරන්තරයෙන් ශාක පෝෂක විශාල ප්‍රමාණයක් ඉවත්වන බවයි. මේ නිසා, එළවළු වගාවේ සාර්ථක අස්වැන්නක් සඳහා මනා ශාක පෝෂක කලමණාකරනයක් අනිවාර්යෙන්ම තිබිය යුතුය. එසේ නොකලහොත් වෙනත් බෝග වර්ග මෙන් නොව, එළවළු බෝගවල අස්වැන්නෙහි පැහැදිලි අඩුවීමක් සිදුවන බව පර්යේෂණ මගින් මනාව ඔප්පු කර තිබේ.

## ශාක පෝෂක කළමණාකරනයක්

මෙසේ පසෙන් ඉවත්වන ශාක පෝෂක වර්ග මූලික, ද්විතියික හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය යන කාණ්ඩ තුනටම අයත් වේ. එනිසා එම සියළුම ශාක පෝෂක වර්ග නැවත පසට ලබාදීමේ ක්‍රියාමාර්ග එළවළු බෝග වගාවේ වැදගත් තැනක් ගනී. මේ නිසා ප්‍රධාන ශාක පෝෂක සපයන එන්.පී.කේ. (N.P.K) රසායනික පොහොරවලට අමතරව ද්විතියික හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය සපයන කාබනික පොහොර ද එළවළු වගාවට යෙදිය යුතුය. විවිධ එළවළු බෝග අතුරෙන් වුවද, දිගු කාලීන බෝග මගින්, කෙටි කාලීන බෝගවලට වඩා වැඩි ශාක පෝෂක ප්‍රමාණයක් උරා ගනී. මේ නිසා දිගු කාලීන මෙන්ම වැඩි අස්වනු ලබාදෙන එළවළු බෝග සඳහා සාර්ථක ශාක පෝෂක කළමනාකරණයක් විශේෂයෙන් තිබිය යුතුය. එනිසා එවැනි බෝග සඳහා කාබනික හා රසායනික පොහොර දෙවර්ගයම නිවැරදි ආකාරයට යෙදීමෙන්, සාර්ථක මෙන්ම ආර්ථික වාසිදායක අස්වැන්නක් ද ලබාගත හැකිය.

## රසායනික පොහොර

### මූලික ශාක පෝෂක

වෙනත් බෝග වර්ග සඳහා මෙන්ම එළවළු බෝග සඳහා ද, වැඩි ප්‍රමාණයකින් අවශ්‍යවන නිසා මූලික ශාක පෝෂක ලෙස සලකනු ලබන නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් සැපයීම රසායනික පොහොර මගින් කළ යුතුය.

මෙය විශේෂයෙන් වැදගත් වන්නේ එළවළු බෝග වර්ගවලින් වැඩි අස්වැන්නක් ලබාගැනීම සඳහා වැඩි ශාක පෝෂක ප්‍රමාණයක් අවශ්‍යවන නිසාය. එම අවශ්‍යතාවය සපුරාලීම වඩා පහසුවෙන් කලහැකි වන්නේ වැඩි ශාක පෝෂක ප්‍රමාණයක් අඩංගුවන රසායනික පොහොර යෙදීම මගිනි.

රසායනික පොහොර පහසුවෙන් දියවෙන සුළු නිසා පසට යෙදීමෙන් පසු ඉතා සුළු කාලයක් තුලදී බෝගයට ලබාගත හැකිය. එනිසා රසායනික පොහොර යෙදීමෙන් බෝගයේ වැඩීමට හා අස්වැන්නට ඉක්මන් බලපෑමක් ඇතිකළ හැකිය. මෙයට අමතරව වැඩි අවශ්‍යතාවයක් පවතින මෙම ශාක පෝෂක තුන් වර්ගය රසායනික පොහොර ලෙස ලබාදීම, වඩාත් ප්‍රතිඵලදායක මෙන්ම ආර්ථිකව ද වාසිදායකය. එළවළු ගොවීන් විසින් රසායනික පොහොර භාවිතා කිරීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වන්නේ මේ නිසාය.

එළවළු බෝග සඳහා රසායනික පොහොර යෙදීමේදී වෙනත් කෙටිකාලීන බෝගවලට මෙන්, සම්පූර්ණ පොස්පරස් අවශ්‍යතාවය මූලික පොහොර ලෙස යෙදිය යුතුය. ඒ සමගම බෝගයේ නයිට්‍රජන් සහ පොටෑසියම් අවශ්‍යතාවයෙන් කොටසක් ද බීජ හෝ පැල සිටුවීමට පෙර මූලික පොහොර ලෙස, සකසාගත් පාත්තිවලට හෝ වලවල්වලට යොදා පස සමග කළවම් කරගත යුතුය. බෝගයට අවශ්‍යවන ඉතිරි නයිට්‍රජන් හා පොටෑසියම් පොහොර ප්‍රමාණය නිර්දේශිත අන්දමට එක් වරකදී හෝ වාර කිහිපයකදී හෝ බෝගයට යොදා පසට කළවම්කළ යුතුය. විශාල බිම් ප්‍රමාණයකට පොහොර යොදන අවස්ථාවලදී කුඩා කොටස් වශයෙන් වගාවට පොහොර යොදා පසට කළවම් කරන්න. යොදන ලද පොහොර වැඩි වේලාවක් තද හිරු එළියට නිරාවරණය වී විනාශ වීම මෙයින් වලකී. යූරියා අඩංගු පොහොර සඳහා මෙය විශේෂයෙන් වැදගත් වේ. එසේ පොහොර යොදා පසට කලවම් කිරීමෙන්, බෝගයට මෙම පොහොරවල අඩංගු ශාක පෝෂක වඩා පහසුවෙන් ලබා ගැනීමට හැකි වේ. එසේම, අපතේ යන පොහොර ප්‍රමාණය ද අඩු කරගත හැකිය.

**මේ ආකාරයට බෝගය සිටුවීමෙන් පසු පොහොර යෙදීම සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ, "මතුපිට පොහොර යෙදීම" වශයෙනි. කෙසේ නමුත් මෙම පොහොර, මතුපිට විසිරුවා හැරීමකල යුතුයැයි මෙයින් අදහස් කරනු නොලැබේ. එනිසා මතුපිට පොහොර යෙදූ පසුව එම පොහොර අනිවාර්යයෙන්ම පසට කලවම්කළ යුතුය.**

## ත්‍රිත්ව සුපර් පොස්පේට්

මූලික පොහොරක් ලෙස පමණක් යොදනු ලබන පොස්පරස් ශාක පෝෂකය. එළවළු බෝග වගාවන් සඳහා ලබාදිය යුත්තේ ත්‍රිත්ව සුපර් පොස්පේට් ආකාරයට පමණකි. මේ සඳහා විවිධ වර්ගවල රොක් පොස්පේට් පොහොර භාවිතා නොකළ යුතුය. ත්‍රිත්ව සුපර් පොස්පේට් මෙන් නොව, රොක් පොස්පේට්වල ක්‍රියාකාරීත්වය අඩුය. එනිසා වැඩි පොස්පරස් අවශ්‍යතාවයක් ඇති එළවළු බෝග වර්ග සඳහා රොක් පොස්පේට් යෙදීම සුදුසු නැත. මෙයට අමතරව, දිගු කාලයක් තුලදී සුළු ප්‍රමාණවලින් පසට නිදහස්වන රොක් පොස්පේට්වල අඩංගු පොස්පරස් ශාක පෝෂකය, කෙටි වර්ධන කාලයක් ඇති එළවළු බෝගවලට අවශ්‍ය අවස්ථාවලදී, අවශ්‍ය ප්‍රමාණවලින් ලබා ගැනීම අපහසුය. එනිසා රොක් පොස්පේට් නිර්දේශ කරනු ලබන්නේ බහුවාර්ෂික බෝග සඳහා පමණකි.

මේ හේතුව නිසා එළවළු බෝග සඳහා පොහොර මිශ්‍රණ භාවිතා කිරීමේදී, වෙනත් බහුවාර්ෂික බෝග සඳහා සකස්කර ඇති පොහොර මිශ්‍රණ යොදා නොගත යුතුය. (උදා: පොල්, රබර්, තේ පොහොර) මක්නිසාදයත් මෙවැනි බොහෝ පොහොර මිශ්‍රණවල පොස්පරස් පොහොර ලෙස අඩංගු වන්නේ රොක් පොස්පේට් නිසාය.

රසායනික පොහොර පහසුවෙන් ජලයේ දියවෙන සුළුය. එනිසා බෝගයට ඉක්මණින් ලබාගත හැකිවාක් මෙන්ම, පහසුවෙන් පසෙන් සේදියාම සහ බෝගයට ලබාගත නොහැකි ගැඹුරක් දක්වා කාන්දුවීමට ද ඉඩ තිබේ. දිගින් දිගටම විශාල ප්‍රමාණවලින් රසායනික පොහොර පසට යෙදීම නිසා, පසෙහි ඇති වෙනත් ශාක පෝෂක වර්ග සමග නොයෙක් අන්තර් ක්‍රියාවලින් ද ඇතිවිය හැකිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බෝගයෙහි නොයෙක් පෝෂක ඌණතා ඇතිවීමට ඉඩතිබේ. මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ අස්වැන්න අඩුවීමයි.

උදාහරණයක් වශයෙන් පොටෑසියම් අඩංගු රසායනික පොහොර විශාල ප්‍රමාණවලින් පසට යෙදූවිට මැග්නීසියම් නැමති ශාක පෝෂකය උරා ගැනීමට බාධාවේ .

පොස්පරස් අඩංගු පොහොර පසෙහි වැඩි වූ විට බෝගයට තුත්තනාගම් (සින්ක්) මූලද්‍රව්‍ය උරාගැනීමට අපහසු වේ. මෙයට අමතරව නොකඩවා අධික ප්‍රමාණවලින් රසායනික පොහොර වගාවන් සඳහා යොදනු ලබන ප්‍රදේශවල, බිමට ගන්නා ජලය දූෂණය වීමද විශාල පරිසර හා සෞඛ්‍ය ප්‍රශ්ණයක් වී තිබේ. එසේම මේ අන්දමට රසායනික පොහොර යෙදීම නිසා පස ආම්ලිකවීම නිසා වගාවන් අසාර්ථක වීමද බහුලව ඇතිවන ගැටළුවකි.

## උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා

රසායනික පොහොර යෙදීමෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම සඳහා නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණය නිර්දේශිත අවස්ථාවේදී යෙදිය යුතුය. යොදනු ලබන රසායනික පොහොර හැමවිටම පසට කලවම් කළයුතුය. එසේම නයිට්‍රජන් අඩංගු රසායනික පොහොර යොදනු ලබන අවස්ථාවලදී වැඩි වාර ගණනකින් බෝගයට ලබාදීම මගින් අපතේ යන පොහොර ප්‍රමාණය අඩුකර ගත හැකිය. මෙයට අමතරව රසායනික පොහොර යොදන අවස්ථාවේදී පසෙහි තෙතමනය පැවතීම වැදගත්ය. එසේ නැතහොත් පොහොර යෙදීමෙන් පසු ජලය සැපයීම අනිවාර්යෙන්ම කළයුතුය. වියලි පසට රසායනික පොහොර යෙදීමෙන් බෝගයට ප්‍රයෝජනයක් ලබාගත නොහැකිය. මෙයට අමතරව රසායනික පොහොර යෙදීමට පෙර වගාවේ වල්පැලෑටි පාලනය කිරීම ද බෙහෙවින් වැදගත් වේ.

# කාබනික පොහොර

කාබනික පොහොර වර්ග පසට යොදා එළවළු වගාකළ පසු පසේ අන්තර්ගත මූලික, ද්විතියික හා අංශු මාත්‍ර යන කාණ්ඩ තුනටම අයත්වන මූලද්‍රව්‍ය ප්‍රමාණය වැඩි වී ඇතිබව පර්යේෂණ මගින් සනාථකර ඇත. සාමාන්‍ය එළවළු වගා ක්‍රමවලදී රසායනික පොහොර ලෙස ද්විතියික හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය පසට ලබාදීම සිදු නොකරන බැවින් **රසායනික පොහොරවලට අමතරව** කාබනික පොහොර යෙදීම ද ඉතා වැදගත්ය.

# වාසි මොනවාද?

කාබනික පොහොර යෙදීම මගින් බෝගවලට යොදනු ලබන රසායනික පොහොර සේදීයාම අඩුවී, එම රසායනික පොහොරවල කාර්යක්ෂමතාවය වැඩි කරනු ලැබේ. මෙය වෙනත් බෝග සඳහා මෙන්ම එළවළු වගාවේදී ද වැදගත්ය. මේ නිසා එළවළු වගාවට යොදනු ලබන රසායනික පොහොරවල උපරිම ප්‍රයෝජන ලබාගැනීමට කාබනික පොහොර යෙදීම ද අත්‍යාවශ්‍ය වේ.

- තෙත් කලාපයේ මෙන්ම, අතර මැද කලාපවල ද එළවළු වගා කරනු ලබන පස්, ආම්ලික බවකින් යුක්තය. එසේම නොකඩවා රසායනික පොහොර යෙදීම නිසා ද පසේ ආම්ලික බව වැඩි වේ. මේ ආකාරයට පස ආම්ලිකවීමේ හේතුවෙන් බෝගවලට සමහර ශාක පෝෂක උරා ගැනීමට බාධා ඇති වේ. කෙසේ නමුත් පසක කාබනික ද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් ඇත්නම්, පසේ ස්වාරක්ෂක බව වැඩිවන අතර, එමගින් රසායනික පොහොර යෙදීමේ හේතුවෙන් ආම්ලිකවීමට ප්‍රතිරෝධීව ක්‍රියා කිරීමේ වැඩි හැකියාවක් පසට ලැබේ.

එසේම කාබනික පොහොර ලෙස කුකුල් පොහොර යෙදීම මගින් එහි අන්තර්ගත කැල්සියම් සංඝටක නිසා පසේ ආම්ලික බව අඩුවේ. මෙය කුකුල් පොහොරවල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයකි. එනිසා එළවළු බෝග වගා කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට ද එය හේතුවක් වේ. එනිසා කුකුල් පොහොර යොදා එළවළු වගාකරනු ලබන අවස්ථාවලදී ඩොලමයිට් හෝ අළුහුණු යෙදීම අවශ්‍ය නොවේ.

- බොහෝ එළවළු බෝගවල ඇත්තේ දුර්වල මෙන්ම කුඩා මුල් පද්ධතියකි. මෙම මුල් පද්ධතිය හොඳින් වර්ධනයකර ගැනීම සඳහා පසෙහි ව්‍යුහය ඊ සඳහා හිතකර ආකාරයට පැවතිය යුතුය. පසේ ව්‍යුහය දියුණුකර ගැනීම, රසායනික පොහොර පමණක් යෙදීමෙන් කළ නොහැකිය. ඊ සඳහා කාබනික පොහොර යෙදීම අනිවාර්ය වේ. මේ අන්දමට කාබනික පොහොර යෙදීමෙන් පසේ සිදුවන ලිහිල් බව හේතුවෙන් බෝගයේ මුල් පද්ධතිය හොඳින් වැඩීමට හිතකර තත්ත්වයක් ඇතිවන නිසා, එය එළවළු වගාවේ සාර්ථක අස්වැන්නකට හේතු වේ.

- එළවළු වගාවට වැලි අධික පසක් මෙන්ම මැටි අධික පසක් ද යෝග්‍ය නැත. වැලි අධික පසේ අඩු ශාක පෝෂක ප්‍රමාණයක් අන්තර්ගතවන අතර, ශාක පෝෂක ඉක්මණින් සේදීයාමද සිදුවේ. එසේම පසේ සාරවත් බව තීරණය කරනු ලබන වෙනත් බොහෝ සාධක ද වැලි පසේ අඩුය. එසේම මැටි පසේ අධික මැටි බව හා මැටි අංශු අධික ලෙස එකිනෙක සමග තදවීම, බෝගවල මුල් හොඳින් විහිදී යාමට බාධාවකි. එසේම වියලි කාලයේ මැටි පසේ දක්නට ලැබෙන ඉරි තැලීම් නිසා බෝගවල මුල් පද්ධතියට පවා හානි පැමිණේ.

මේ නිසා වැලි හා මැටි පස් දෙවර්ගයේම, බෝග වගාවට වඩා හිතකර ලක්ෂණ දියුණු කිරීම සඳහා කාබනික පොහොර යෙදීම වැදගත්ය. මෙවැනි තත්ත්ව ඉක්මණින් දියුණු කිරීම අපහසු වුවත්, නොකඩවා දිගුකාලීනව පසට කාබනික පොහොර යෙදීම ප්‍රයෝජනවත්ය. දිගුකාලීනව කාබනික පොහොර යෙදීමෙන් පසේ තත්වය දියුණු වී ඇති බව නුවරඑළිය ප්‍රදේශයේ එළවළු වගා කරන පස අධ්‍යයනය කිරීමෙන් හොඳින් පෙනී යනු ඇත.

- කාබනික පොහොර යෙදීම නිසා පසේ තෙතමනය බෝගවලට අවශ්‍ය මට්ටමකින් පවත්වා ගැනීමට උපකාර වේ. එළවළු බෝගවල දක්නට ලැබෙන වේගවත් වර්ධනය සඳහා පසේ තෙතමනය වැදගත්වන අතර, එය ශාක පෝෂක උරා ගැනීමට හා වෙනත් පාංශු ප්‍රතික්‍රියා සඳහා ද ප්‍රයෝජනවත් වේ. එසේම පසේ ජීවත්වන ගැඩවිලුන් හා වෙනත් ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරකම් සඳහා ද නිවැරදි මට්ටමින් පසේ තෙතමනය පැවතීම අත්‍යාවශ්‍යය. මෙලෙස පසේ තෙතමනය රඳවා ගැනීමට රසායනික පොහොර පමණක් ප්‍රයෝජනවත් නොවන අතර, ඊ සඳහා කාබනික පොහොර යෙදීම ද අනිවාර්යයෙන්ම කළයුතුය.

- කාබනික පොහොර යෙදීමෙන් පසේ ව්‍යුහය දියුණුවීම නිසා පසේ අන්තර්ගත වාත ප්‍රමාණය වැඩිවේ. පසෙහි අඩංගුවන වාත ප්‍රමාණය දියුණු කරගැනීම විශේෂයෙන් වැදගත් වන්නේ වැඩි වශයෙන් මැටි අඩංගු පස් සඳහාය. පසේ සිදුවන නොයෙක් ප්‍රතික්‍රියා සඳහා මෙන්ම පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වයට ද පාංශු වාතය බෙහෙවින් වැදගත්ය. මෙය රසායනික පොහොර යෙදීමෙන් සිදුකල නොහැකි අතර, මේ සඳහා දායක වන්නේ කාබනික පොහොර පමණි.



- කාබනික පොහොර පසේ ජීවත්වන බොහෝ පාංශු ජීවීන්ට වැදගත්වන අතර, ඔවුන්ගේ ජීවිකාව පවත්වා ගෙන යාමට පසේ කාබනික ද්‍රව්‍ය අන්තර්ගත වීම අත්‍යාවශ්‍යය. සාර්ථක බෝග වගාවක් සඳහා පසෙහි සිදුවිය යුතු නොයෙක් ප්‍රතික්‍රියා නිසි අන්දමට සිදුවීම පිණිස ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය බෙහෙවින් වැදගත්ය

- කාබනික පොහොර යෙදීමෙන් එළවළු වගාවේ දක්නට ලැබෙන වටපනු හානිය අවම කරගත හැකිය. මුල ගැටිති වටපනු හානිය, විශේෂයෙන් සොලනේසි කුලයේ එළවළු බෝගවන තක්කාලි, මාලු මිරිස්, වම්බටු හා අර්තාපල් යනාදියේ සුලබව දැකිය හැකිය. මෙම හානිය කාබනික පොහොර යෙදීමෙන් අඩුකර ගත හැකි අතර, ඒ සඳහා කුකුල් පොහොර යෙදීම වඩාත් සාර්ථක ප්‍රතිකර්මයකි.



කාබනික පොහොර නොයෙදූ වගාවල මූල ගැටිති වටපනු හානිය නිසා අධික ලෙස අස්වැන්න අඩුවන බව එළවළු වගා කරනු ලබන බොහෝ ප්‍රදේශවලින් වාර්තා වී ඇත. මෙම හානිය වලකාලීම සඳහා කුකුල් පොහොරවල දායකත්වය පිළිබඳව අප රටේ පමණක් නොව විදේශ රටවල සිදුකල පර්යේෂණ ගණනාවක් මගින් ද පෙන්වා දී ඇත.

## පර්යේෂණ ප්‍රතිඵල

එළවළු බෝග ආශ්‍රිතව සිදු කරනු ලැබූ පර්යේෂණ විශාල සංඛ්‍යාවක් මගින් පැහැදිලි වී ඇති කරුණක් නම්, එළවළු බෝගවල අස්වැන්න වැඩි කිරීමට (වගු අංක 1) මෙන්ම එළවළු වගාවෙන් ආර්ථික වාසියක් ලැබීමට (වගු අංක 2) රසායනික පොහොර පමණක් නොව කාබනික පොහොරද යෙදිය යුතු බවයි. එසේම මෙම දෙවර්ගයටම අයත් පොහොර යෙදීම මගින් පසේ දිගුකාලීන සාරවත්බව රැක ගැනීමට ද ඉඩ ලැබේ.

දෙවන වගුවේ සඳහන් වන්නේ වැදගත් එළවළු බෝග තුනකින් ලබාගත හැකි ශුද්ධ ආදායම, යොදන ලද විවිධ පොහොර වර්ග සමග වෙනස් වී ඇති අන්දමයි. හෙක්ටයාරයකට ටොන් 10 (අක්කරයට ටොන් 4) කුකුල් පොහොර යොදා, ඒ සමග නිර්දේශිත රසායනික පොහොර යෙදීමෙන් වැඩිම ආදායමක් මෙම බෝග වගාකර ලබා ගත හැකි බව මෙයින් පැහැදිලි වේ.

ආදායම් වියදම් ගණනය කිරීම පිණිස මෙයට වසර කිහිපයකට පෙර පැවති රසායනික හා කාබනික පොහොර මිල ද, එකී එළවළු වර්ග සඳහා වගාකරුවන් ලබාගත් සාමාන්‍ය මිලද භාවිතාකර තිබේ. කෙසේ වුවද මෙම දත්ත සඳහා වර්තමාන අගයන් භාවිතාකල ද විවිධ පොහොර යෙදීමේ ක්‍රම අනුව ලබාගත හැකි ශුද්ධ ලාභය ඉහත පිළිවෙල අනුවම නොවෙනස්ව පවතිනු ඇත.

### කාබනික හා රසායනික පොහොර යෙදීම මගින් ප්‍රධාන එළවළු බෝග තුනක අස්වැන්නට සිදුවූ බලපෑම

වගුව 1 :

| | අස්වැන්න හෙක්/මෙ:ටොන් | | |
|---|---|---|---|
| | ගෝවා | තක්කාලි | පඳුරු බෝංචි |
| පොහොර යොදා නැති | 10.4 | 2.2 | 5.1 |
| නිර්දේශිත පොහොර පමණක් යෙදූ විට | 55.0 | 7.2 | 10.7 |
| ගොම ටොන් 10 පමණක් යෙදූ විට | 32.4 | 5.1 | 6.6 |
| කොම්පෝස්ට් ටොන් 10 පමණක් යෙදූ විට | 33.8 | 6.9 | 8.2 |
| කුකුල් පොහොර ටොන් 10 පමණක් යෙදූ විට | 58.0 | 18.4 | 11.1 |
| ගොම ටොන් 10 + නිර්දේශිත රසායනික පොහොර | 55.3 | 9.3 | 9.3 |
| කොම්පෝස්ට් ටොන් 10 + නිර්දේශිත රසායනික පොහොර | 57.9 | 8.4 | 11.4 |
| කුකුල් පොහොර ටොන් 10 + නිර්දේශිත රසායනික පොහොර | 88.1 | 24.6 | 15.8 |

## කාබනික හා රසායනික පොහොර විවිධ අන්දමට යෙදීමෙන් පසු ප්‍රධාන එළවළු බෝග කිහිපයක් මගින් කන්න කිහිපයකදී ලබාගත හැකි වී ඇති ආදායම (හෙක්ටයාරයකට රුපියල්)

වගුව 2:

| පොහොර යෙදූ ආකාරය | වැල් බෝංචි 92 යල | තක්කාලි 92/93 මහ | ගෝවා 93 යල | වැල්බෝංචි 94 යල | තක්කාලි 94/95 මහ | ගෝවා 95 යල |
|---|---|---|---|---|---|---|
| කුකුල් පොහොර (හෙක්./ටොන්.10) | 31,600.00 | 5,73,200.00 | 6,06,200.00 | 1,73,100.00 | 8,28,400.00 | 4,35,500.00 |
| ගොම පොහොර (හෙක්./ටොන්.10) | 8,300.00 | 152,800.00 | 262,900.00 | 43,000.00 | 71,400.00 | 101,900.00 |
| ගොම පොහොර + කුකුල් පොහොර (හෙක්-ටොන් 5 බැගින්) | 25,100.00 | 3,02,800.00 | 5,56,600.00 | 1,48,900.00 | 4,28,400.00 | 4,64,000.00 |
| නිර්දේශිත රසායනික පොහොර පමණක් | 18,800.00 | 2,79,200.00 | 5,43,900.00 | 1,21,500.00 | 2,40,300.00 | 3,30,900.00 |
| කුකුල් පොහොර (හෙක්./ටො.10) + නිර්දේශිත රසායනික පොහොර | 63,200.00 | 647,800.00 | 814,500.00 | 230,200.00 | 11,70,600.00 | 8,34,700.00 |
| ගොම පොහොර (හෙක්./ටොන් 10) + නිර්දේශිත රසායනික පොහොර | 39,900.00 | 4,41,900.00 | 5,19,500.00 | 1,59,300.00 | 3,94,000.00 | 3,12,600.00 |
| ගොම පොහොර සහ කුකුල් පොහොර (හෙක්./ටොන් 5 බැගින්) + නිර්දේශිත රසායනික පොහොර | 51,600.00 | 6,24,200.00 | 714,900.00 | 1,67,800.00 | 7,78,400.00 | 5,97,800.00 |

# කාබනික පොහොර වර්ග

කාබනික පොහොර යෙදීමේදී, යොදනු ලබන කාබනික පොහොර වර්ග සහ ප්‍රමාණ පිළිබඳව පමණක් නොව ප්‍රදේශයේ පහසුවෙන් සපයාගත හැකි පොහොර පිලිබඳව ද සැලකිලිමත් වීම වැදගත්ය. විශේෂයෙන් එළවළු වගාවේදී සත්ව පොහොර සඳහා ලැබෙන්නේ සුවිශේෂ ස්ථානයකි. සත්ව පොහොරවල බොහෝ විට දක්නට ලැබෙන වැඩි ශාක පෝෂක ප්‍රමාණය හා වෙනත් කරුණු මේ සඳහා හේතු වී ඇත. එසේම බොහෝ ප්‍රදේශවල සත්ව පොහොර පහසුවෙන් සොයා ගැනීමට හැකිවීමද මේ සඳහා බලපා තිබේ.

සත්ව පොහොර ලෙස කුකුල් පොහොර, ගොම පොහොර, බ්‍රොයිලර් පොහොර, එළු පොහොර, ඌරු පොහොර හා වවුල් පොහොර ආදිය සාර්ථකව භාවිතාකල හැකි බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇත. නමුත් ගොම හා කුකුල් පොහොර, එළවළු වගාවන් සඳහා වැඩි වශයෙන් භාවිතා කරනු ලබන කාබනික පොහොර වර්ග දෙකකි.

සත්ව පොහොරවලට අමතරව, කාබනික පොහොර ලෙස කොම්පෝස්ට් පොහොර වුවද සාර්ථකව භාවිතා කරනු ලබන අවස්ථා එමටය.



එසේම සමහර ප්‍රදේශවල එළවළු වගාව සඳහා වසුනක් ලෙස පිදුරු යොදා ගන්නා අවස්ථා ද දක්නට ලැබේ. ගෙවතුවල එළවළු වගා කිරීමේදී කොළ පොහොර භාවිතාකලද වාණිජ මට්ටමින් එළවළු වගාකරන අවස්ථාවලදී එය එතරම් ප්‍රායෝගික නොවේ.

## යෙදිය යුතු ප්‍රමාණ

"උඩරට එළවළු බෝග" සඳහා කුකුල් පොහොර, බ්‍රොයිලර් පොහොර, එළු පොහොර, ඌරු පොහොර, වවුල් පොහොර හා වියලි ගොම යනාදිය අක්කරයකට ටොන් 4 ක් පමණ එක් කන්නයකදී යෙදිම සෑහේ. මෙය දළ වශයෙන් පොහොර මළු 150-200 ක් පමණ සංඛ්‍යාවක අඩංගු ප්‍රමාණයක් ලෙස සැලකිය හැකිය. උඩරට එළවළු බෝග සඳහා වරකට දෝතකින් ගතහැකි ප්‍රමාණයක් බැගින් යෙදීමෙන් එම ප්‍රමාණය ලබාදිය හැක. බොහෝ විට තෙත ගොම හා ගොම සමඟ වෙනත් තණකොළ රොඩු ආදිය මිශ්‍ර වී ඇතිවිට අක්කරයකට ටොන් 8-10 ක් පමණ වුවද භාවිතාකළ හැකිය. එය දළ වශයෙන් සාමාන්‍ය ට්‍රැක්ටර් ලෝඩ් 4-5 ක් පමණ පුරවා ගත්විට ලැබෙන ප්‍රමාණයක් ලෙස සැලකිය හැකිය.

පහතරට එළවළු බෝග වර්ගවන වැටකොළු, පතෝල, බණ්ඩක්කා වැනි දෑ සඳහා වුවද ඉහත සඳහන්කල කාබනික පොහොර භාවිතා කල හැකිය. කෙසේ නමුත්, අස්වැන්න සඳහා ලැබෙන මිළ, බෝග මගින් උරාගන්නා පෝෂක ප්‍රමාණය හා අස්වනු ප්‍රමාණය සැලකිල්ලට ගැනීමේදී උඩරට එළවළු බෝගවලට යෙදූ ප්‍රමාණයෙන් අඩක පමණ ප්‍රමාණයක් එනම්, අක්කරයකට ටොන් 2 ක් පමණ යෙදීම ප්‍රායෝගික මෙන්ම ආර්ථිකවද වාසිදායකය. මෙය පොහොර මලු වශයෙන් සැලකීමේදී පොහොර මලු 80-100 ක් පමණ වේ. අමු ගොම යොදන අවස්ථාවේදී ට්‍රැක්ටර් ලෝඩ් 2 - 2 1/2 ක් පමණ වේ. පහතරට එළවළු බෝග වර්ගවන වැටකොළු, පතෝල හා කරවිල ආදිය වැඩි පරතරයකින් සිටුවන බැවින් එක් වලකට දළ වශයෙන් කිලෝ 1 ක් හෝ දෝතවල් 4 ක් පමණ යෙදීම කළයුතු වේ.

## යෙදිය යුතු අවස්ථාව

එළවළු වගාවන් සඳහා කුකුල් පොහොර භාවිතාකරන විට බෝග සිටුවීමට දින 3-4 කට පෙර වලවල්වලට නියමිත ප්‍රමාණය යොදා පස සමග කලවම් කරන්න. වර්ෂාව නොමැති නම් දින 2-3 ක් පමණ ජලය යොදන්න.'

එමගින් එළවළු බීජවලට හෝ සිටවූ කුඩා පැලවලට හෝ කුකුල් පොහොර මගින් සිදුවන හානිය සම්පූර්ණයෙන්ම වලකා ගත හැකිය. එළවළු බෝගවලට කුකුල් පොහොර යෙදීමේදී අලුහුණු පසට යෙදීම අවශ්‍ය නොවේ. මෙය අර්තාපල් වගාවේදී ඉතාම වැදගත්ය. එනම් අර්තාපල් වගාවට කුකුල් පොහොර යෙදූවිට අලුහුණු යෙදීම සිදු නොකල යුතුය. එසේ නොකළ හොත්, අර්තාපල් අල 'ස්කැබ්' රෝගයට පාත්‍රවිය හැකිය. මෙසේ කුකුල් පොහොර යෙදීම නිසා අළු හුණු සඳහා වැයවන මුදල සම්පූර්ණයෙන්ම ඉතිරිකරගත හැකිවන අතර, මෙය කුකුල් පොහොර යෙදීමෙන් ලබාගත හැකි අතිරේක වාසියක් ලෙස සැලකිය හැකිය.

## දියර පොහොර

දියර පොහොර යනු පෝෂ්‍ය පදාර්ථ ද්‍රාවණයක් ලෙස පත්‍ර මතට ඉසීමෙන් ලබාදෙනු ලබන පොහොර වර්ග වේ. එළවළු වගා සඳහා දියර පොහොර භාවිතය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශකර නැතත්, අද එය ගොවින් අතර ජනප්‍රිය පිළිවෙතක් වී ඇත.

මේ අන්දමට බෝගයකට ලබාදිය හැකි ශාක පෝෂක ප්‍රමාණය ඉතාමත් අල්පය. නමුත් බොහෝවිට දියර පොහොරවල මූලික, ද්විතික හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ගණනාවක් අන්තර්ගතවන අවස්ථා තිබේ. කාබනික හා රසායනික පොහොර දෙවර්ගයම යොදා සිදුකල ක්‍රමානුකූල වගාවකට, නැවත දියර පොහොර යෙදීමෙන් අතිරේක වාසියක් ලබාගත නොහැකි බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇත.

නමුත් විශේෂයෙන් කොල පරිභෝජනයට ගන්නා එළවළු බෝග සඳහා, දියර පොහොර යෙදීමෙන් අස්වැන්නේ පැහැපත් බව වැඩිවීම නිසා මිලදී ගැනීමේදී පාරිභෝගිකයා හට වැඩි ප්‍රියමනාප බවක් ඇතිවේ.

රසායනික හා කාබනික පොහොර දෙවර්ගයම ක්‍රමානුකූලව භාවිතාකල එළවළු වගාවකට දියර පොහොර යෙදීම අනවශ්‍ය වුවද, යම් අවස්ථාවක කාබනික පොහොර පමණක් හෝ රසායනික පොහොර පමණක් හෝ යොදා එළවළු වගාකර ඇති අවස්ථාවලදී දියර පොහොර යෙදීම ප්‍රයෝජනවත් විය හැකිය. කෙසේ වුවද, එමගින් කාබනික හා රසායනික පොහොර දෙවර්ගයම යෙදීමෙන් ලබාගන්නා අස්වැන්න කිසියේත්ම ලබාගත නොහැකි බව විශේෂයෙන් සඳහන්කල යුතුය.

# එළවළු අපතේ යාම වලකා ගැනීම

ගොවීන් විසින් නිෂ්පාදනය කරනු ලබන එළවළු දුර බැහැර ප්‍රදේශවල සිටින පාරිභෝගිකයින් අතට පත්වන විට, ඒවායේ තත්වය බොහෝ සෙයින් දුර්වල වීම අප රටේ බහුල වශයෙන් සිදුවන දෙයකි. එපමණක් නොව මෙසේ නිපදවන එළවළු වලින් 20%-30% දක්වා ප්‍රමාණයක් අපතේ යයි.

මෙලෙස අස්වනු නෙලූ අවස්ථාවේ සිට පාරිභෝගිකයා අතට පත්වන තුරු සිදුවන හානි සියල්ල පසු අස්වනු හානි ලෙස හඳුන්වනු ලැබේ.

මේ නිසා ගොවියා හට ඉතා අඩු මුදලකට තම නිෂ්පාදිතයන් අලෙවි කිරීමට සිදුවන අතර, පාරිභෝගිකයා හට විශාල මිළක් ගෙවා අවශ්‍ය එළවළු මිලදී ගැනිමට සිදුවේ.

විශාල වශයෙන් සිදුවන පසු අස්වනු හානියට ප්‍රධාන වශයෙන් හේතුවන සාධක කීපයකි. ජලය පිටවීම නිසා බර අඩුවීම, මේරීම, තැලීම් හා සීරීම් සිදුවීම, කුණුවීම යනාදිය මේ අතුරින් ප්‍රධාන තැනක් ගනී. කෙසේ වෙතත් මෙසේ පසු අස්වනු හානිය නිසා අපතේ යන ප්‍රමාණය කෙරෙහි පෙර අස්වනු සාධක ද බොහෝ විට බලපෑමක් ඇති කරයි.

පෙර අස්වනු සාධක ලෙස හඳුන්වනු ලබන්නේ අස්වනු නෙලීමට පෙර ක්ෂේත්‍රයේදී පැවැති තත්වයන්ය. අක්‍රමවත් පොහොර භාවිතය, අඩු ජලසම්පාදනය, අධික ආර්ද්‍රතාවය සහ වෙනත් අයහපත් වගා පාලන ක්‍රම අස්වැන්නෙහි තත්වය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරයි. පෙර අස්වනු සාධක මනා ලෙස පාලනයකර, උසස් පසු අස්වනු තාක්ෂණ ක්‍රම අනුගමනය කිරීමෙන් අපතේ යන එළවළු ප්‍රමාණය බොහෝ දුරට අඩුකර ගත හැකිය.

## අස්වනු නෙලිය යුතු අවස්ථා

- තක්කාලි අස්වනු නෙලීමට වඩාත් සුදුසු අවස්ථාව වන්නේ ගෙඩියෙහි රතු පැහැය අවම වශයෙන් 50% ක් වත් දක්නට ලැබෙන විටය. අස්වනු නෙලීමේදී නටුව ගෙඩියට සවිව් තිබෙන පරිදි නෙලීමකල යුතුය. නටුව වෙන් වුවහොත් ඇතිවන තුවාලය නිසා එම ස්ථානයෙන් කුණුවීමට ඉඩ තිබේ. නටුව සමග නෙලූ තක්කාලි නොගැඹුරු ලී පෙට්ටි හෝ ප්ලාස්ටික් කූඩාවල ඇසිරීම කල යුතුයි. නෙලා ගැනීමෙන් පසුව හැකිතාක් දුරට පරිහරණය කරන වාර ගණන අඩු කිරීමෙන් තක්කාලිවල පසු අස්වනු හානිය අඩුකර ගත හැකිය.

- මෑ, බෝංචි වැනි එළවළු බොහෝ විට නාස්ති වන්නේ මේරීම සිදුවන නිසාය. ළපටි අවස්ථාවේදී නෙලීමෙන් මේරීම සිදුවන වේගය අඩුකර ගත හැකිය. එබැවින් මෙම එළවළු වර්‍ග දෙක කරලේ දිග උපරිම මට්ටමට පත් වූ වහාම අස්වනු නෙලීම සුදුසුය. කරල පිරෙන තුරු සිටියහොත් ඉක්මණින් මේරීම සිදුවන බැවින් අපතේ යන ප්‍රමාණය වැඩිවේ.



ළපටිව නෙලාගත් විට, වැඩි කරල් ගණනක් සෑදෙන බැවින් ගොවියාට තම වගාවෙන් ලැබෙන මුළු අස්වැන්න වැඩිකර ගත හැකිය.

- බණ්ඩක්කා කරල්, උපරිම දිගට පැමිණීමට දින දෙකකට පමණ පෙර නෙලා ගැනීමෙන් මේරීම නිසා අපතේ යන ප්‍රමාණය අඩුකර ගත හැකිය. ළපටිව අස්වනු නෙලූ විට දින දෙකකට වරක් බැගින් අස්වනු නෙලිය හැකි අතර, එවිට ඉඩමෙන් ලැබෙන මුළු අස්වනු ප්‍රමාණය වැඩි වේ.

- වැටකොළු, පතෝල, කරවිල යන එළවළු අස්වනු නෙලීමට වඩා සුදුසු වන්නේ එම ඵල (කරල්) උපරිම දිගට පත්වන අවස්ථාවේ දීය. ඵල පිරීමේ අවස්ථාව දක්වා නෙලීම පමා කලහොත් වැටකොළුවල මේරීම ද, පතෝල, කරවිලවල ඉදීම ද ඉක්මන් වීම නිසා වෙළඳ අගය අඩුවීම සහ ආහාරයට නුසුදුසු තත්වයට පත්වීම සිදුවේ. වැටකොළු සහ කරවිල ප්ලාස්ටික් බඳුන්වල ඇසිරිය හැකි අතර, පතෝලවල මැද කුහරයක් ඇති බැවින් තැලීම සිදුවුවහොත් පහසුවෙන් පිපිරීමට ඉඩ තිබේ. එබැවින් කූඩා ප්‍රමාණයේ මිටි වශයෙන් ඇසිරීම කල හැකිය.

- වම්බටුවල ඵලයෙහි උපරිම දිගට පත් වූ විට, එය නෙලීමට වඩාත් සුදුසු අවස්ථාව වේ. ඵල පිරීම දක්වා සිටියහොත් මේරීම සිදුවන නිසා තත්වය පහළ යයි. ළපටි අවස්ථාවේ අස්වනු නෙලූ විට දිගුකාලීනව ඉඩමෙන් ලැබෙන අස්වැන්න වැඩිවීම ගොවියාට වඩා වාසිදායක වේ. මෙසේ නෙලන ලද ඵල ප්ලාස්ටික් අසුරනවල අසුරා ප්‍රවාහනයකල හැකිය.

- සලාද සඳහා පිපිඤ්ඤා යොදා ගැනිමට බලාපොරොත්තු වන්නේ නම්, ඉතා ලපටි අවස්ථාවේදී අස්වැන්න නෙලා ගත යුතුය. මේ සඳහා ඵලය සම්පූර්ණ වීමට පෙර නෙලා ගත යුතුය. පිසීම සඳහා භාවිතා කරන්නේ නම් තරමක් මේරූ අවස්ථාව වඩා සුදුසුය. කෙසේ වුවද පිට පොත්ත දුඹුරු පැහැ ගැන්වීමට ප්‍රථම අස්වනු නෙලීම වැදගත්ය.

- බීට්, නෝකෝල්, රාබු වැනි එළවළු නියමිත දින ගණනට පසු එනම්, නිසි පරිදි මෝරා ඇතිවිට අස්වනු නෙලීමෙන් ගුණාත්මක බවින් වැඩි සහ උසස් තත්වයෙන් යුත් අස්වැන්නක් ලබාගත හැකිය. මෙම එළවළු වර්ගයන්හි අස්වනු නෙලන විට, ශාකවල පත්‍ර නොකැඩෙන පරිදි ගලවා ගත යුතුය. මඩ ඉවත් කිරීම සඳහා "අල" පමණක් ජලයෙන් සේදීම වඩාත් සුදුසුය. පත්‍ර නොතැලෙන පරිදි ඇසිරීම මගින් මෙම එළවළුවල උසස් තත්වය දින කිපයක් ආරක්ෂා කරගත හැකිය.

- ගෝවාවල ගෙඩිය හොඳින් වැඩී ඇතිවිට අස්වැන්න නෙලීමකල යුතුය. වටේට පිහිටි පත්‍ර කිපයක් සමග ප්‍රවාහනය කිරීමෙන් ගෙඩියට සිදුවන යාන්ත්‍රික හානි බොහෝ දුරට අඩුකර ගත හැකිය.

- ලීක්ස් ශාකය හොඳින් වර්ධනය වූ විට, පත්‍ර නොකැඩෙන පරිදි ගලවා මුල් කොටස පමණක් ජලයෙන් සෝදා මඩ ඉවත්කල හැකිය. තදකර මිටි බැඳීම නොකළ යුතුයි.

- මාළු මිරිස් කරල වර්ධනය වූ විට අස්වැන්න නෙලිය යුතුය. මේරීම වැඩි වූ විට ඉක්මණින් ඉදෙන බැවින් නියමිත අවස්ථාවේදී අස්වැන්න නෙලීම වැදගත්ය.

- මුකුණුවැන්න, කංකුං, ගොටුකොළ වැනි කොළ එළවළු මේරීමට ප්‍රථම අස්වැන්න නෙලිය යුතුය. නෙලූ කොළ ක්ෂේත්‍රයේදීම මිටි බැඳ තෙතමනය ඉවත්නොවන සේ තැබිය යුතුය.

## නෙලන අවස්ථාවේදී සැලකිලිමත් වීම

සෑම එළවළුවක්ම උදයේ පිණි හිඳුනු පසු අස්වනු නෙලීම වඩාත්ම උචිතය. කොළ එළවළු ක්ෂේත්‍රයේදී තරමක් "හේබාන" තෙක් සිට නෙලුවහොත් ඇසිරීමේදී සහ ප්‍රවාහනයේදී ඇතිවන හානිය අඩුකර ගත හැකිය. කිසිම අවස්ථාවකදී නෙලන ලද එළවළු, ක්ෂේත්‍රයේ පස් සමග ගැටීමට සැලැස්වීම සුදුසු නැත. පස් තැවුරුණු විට ඒ සමග නොයෙකුත් දිලීර හා බැක්ටීරියා රෝගකාරක ජීවීන් ඇතුල්වීමට පුළුවන.

අස්වනු නෙලීමේදී රළු ලෙස එළවළු පරිහරණය නොකරන්න. හැකි ඉක්මණින් නෙලන ලද එළවළු සෙවන සහිත ස්ථානයකට රැගෙන යන්න.

### ශ්‍රේණි කිරීම

තේරීම සහ වර්ග කිරීම ක්ෂේත්‍රයේදී අනිවාර්යයෙන්ම කල යුතුය. පළමුවැනි සහ දෙවැනි පන්තිය වශයෙන් මතුපිට පෙනුම අනුව වර්ගකල හැකියි. වර්ගකර විකිණීමෙන් වැඩිපුර ආදායමක් ලබාගත හැකිවනවා මෙන්ම, ප්‍රවාහන හානි සහ ලෙඩ රෝග නිසා සිදුවන හානි ද අවම කරගත හැකිය.

### ඇසිරීම

සෑම එළවළුවක්ම සිදුරු සහිත ප්ලාස්ටික් කූඩාවල හෝ ලෑලිවලින් තනන ලද පෙට්ටිවල හෝ අසුරන්න. එමගින් එළවළුවල තත්වය ආරක්ෂා කරගත හැකිය. ඇසිරීමේදී රළු ලෙස එළවළු පරිහරණය නොකළ යුතු අතර, අනවශ්‍ය ලෙස තදකර භාජනයක ඇසිරීම නොකල යුතුයි. ප්ලාස්ටික් බඳුන් නිතර පිරිසිදු කල යුතු අතර, ඇසුරුම් කිසි විටෙකත් අව්වට හෝ වැස්සට නිරාවරණය නොකළ යුතුය.



### ඉදෙන පළතුරු සමග තැබීම

එළවළුවලට එතිලීන් වායුවේ බලපෑම ඉතාමත්ම අහිතකර වේ. ඉදෙන තක්කාලි, කෙසෙල්, අඹ, අලිපේරවලින් මෙම වායුව පිටවේ. තාවකාලික ගබඩා ස්ථානයක හෝ මෙම පළතුරු, එළවළු සමග තැබීමෙන් පළතුරුවලින් පිටවන එතිලීන් වායුවට එළවළු නිරාවරණය වේ. එසේවුවහොත් මේරීම ඉක්මන්වීම, කොළ කහපැහැ වීම, ඉදීම සහ එළවළු විනාශවී යෑමට ද ඉහළ ප්‍රවණතාවයක් ඇත. එබැවින් ප්‍රවාහනයේදී පවා එළවළු පළතුරු සමග මිශ්‍ර කොට ප්‍රවාහනය කිරීමෙන් වැළකීම වඩාත් උචිතය.

### යාන්ත්‍රික හානි

නිවැරදි මේරීමේ අවස්ථාවේදී, ප්‍රවේශමෙන් යුතුව නිසි තත්ව පාලනයක් යටතේ අස්වැන්න නෙලන ලද එළවළු වර්ග සඳහා ලෙඩ රෝග වැළඳීමේ හැකියාව ඉතා අඩුය. කෙසේ වෙතත් අස්වනු නෙලීමේදී, ඇසිරීමේදී සහ ප්‍රවාහනයේදී සිදුවන තැලීම්, සීරීම් වැනි යාන්ත්‍රික හානි නිසා ලෙඩ රෝග වැළඳීම සිදුවේ. එනිසා ලෙඩ රෝග මර්දනය සඳහා අනිවාර්යෙන්ම යාන්ත්‍රික හානි සිදුවීම වැළැක්විය යුතුය.

එළවළු ප්‍රවාහනය කිරීමේදී ප්‍රවේශමෙන් ඇසිරීමකල යුතුය. රාත්‍රී කාලයේදී හෝ උදය කාලයේදී ප්‍රවාහනය කිරීමෙන් අධික ලෙස උෂ්ණත්වය ඉහළයෑම වලක්වා ගත හැකියි. තවද ප්‍රවාහනයේදී අව්වෙන් සහ වැස්සෙන් ආරක්ෂා කරගත යුතුය. වාහනය සුමට ලෙස පැදවීමෙන් ප්‍රවාහනයේදී ඇතිවන හානි අඩුකර ගත හැකිය. එසේම බෑමද ප්‍රවේශමෙන්කල යුතුය.

අප රටෙහි එළවළු නිෂ්පාදනය අවුරුද්ද මුළුල්ලේම සිදුවන බැවින් ශීත කාමරවල දිගු කලක් ගබඩාකර තබා ගැනීම අනවශ්‍යය. බොහොමයක් එළවළු සති 2 ක් හෝ 3 කට වැඩි කාලයක් ගබඩාකර තබාගත නොහැකිය. එසේ ගබඩා කලද දැරීමට සිදුවන අමතර වියදම නිසා ආර්ථික වාසිදායක තත්වයක් ගෙන නොදේ. වඩාත්ම සුදුසු විකල්පය වන්නේ අවාරයේ නිෂ්පාදනය කිරීමට සැලසුම් කිරීමයි.

# නිර්දේශිත එළවළු ප්‍රභේද

**මෙම ප්‍රකාශනයෙහි ඇතුලත් වී නැති කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වගාව සඳහා නිර්දේශිත එළවළු ප්‍රභේදයන්හි** වැදගත් **ලක්ෂණ පහත දක්වා තිබේ.**

## වම්බටු

### අංජලී

දේශීයව නිපදවා ඇති දෙමුහුන් ප්‍රභේදයකි. අධික ලෙස මල් හටගන්නා මෙම ප්‍රභේදයේ ඵලය දිගටි හැඩැතිය. දම් පාටය. දිලිසෙන ස්වභාවයෙන් යුක්තය. බැක්ටීරියා හිටුමැරීමේ රෝගයට මධ්‍යස්ථව ප්‍රතිරෝධී වේ. බටු වගා කරනු ලබන සියළුම ප්‍රදේශවල සාර්ථකව වගා කළ හැකිය. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙ.ටො. 30-40 පමණ වේ.

### අමන්ද

දේශීයව නිපදවා ඇති දෙමුහුන් ප්‍රභේදයක් වන මෙහි ඵලය ලා දම් පැහැතිය. මධ්‍යම ප්‍රමාණයේ විශාලත්වයක් සහිතය. හැඩයෙන් සිලින්ඩරාකාරය. බැක්ටීරියා හිටු මැරීමේ රෝගයට ප්‍රතිරෝධී වේ. බටු වගා කරනු ලබන සියළුම ප්‍රභේදවල සාර්ථකව වගා කල හැකිය. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙ.ටො. 30-40 පමණ වේ.

## කරවිල

### මාතලේ ග්‍රීන්

තද කොළ පැහැති කරල්, දර සහිතය. සෙ.මී. 15-20 පමණ දිගය. කරලක බර ග්‍රෑම් 90-100 පමණ වේ. කරලේ තිත්ත ස්වභාවය තරමක් වැඩිය.

## පිපිඤ්ඤා

### වැම්ප්

ඵලය තද කොළ පැහැතිය. මධ්‍යම ප්‍රමාණයේ විශාලත්වයක් සහිතය. ඉක්මණින් මල් හටගනී. වැල්වල, පාර්ශ්වික ශාඛා හටගැනීමේ ස්වභාවය අඩුය. සලාද ලෙස ආහාරයට ගැනීම සඳහා වඩා සුදුසුය.

### කල්පිටිය වයිට්

ක්‍රීම් පැහැති දිගටි හැඩයෙන් යුත් ඵලයකි. වැල් වලින් පාර්ශ්වික ශාඛා වැඩි සංඛ්‍යාවක් හට ගනී. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙ.ටො. 30 පමණ වේ.

## බෝංචි

### සංජය

පඳුරු බෝංචි ප්‍රභේදයකි. කොළ පැහැති කරල් වල දිග සෙ.මී. 17 පමණ වේ. කරලක බර ග්‍රෑම් 6 පමණ වේ.

## මාළු මිරිස්

### ලංකා යෙලෝ වැක්ස්

දිලිසෙන සුළු කහ පැහැති කරල, ආරම්භයේදී තරමක සෘජුව පිහිටන අතර පසුව ක්‍රමයෙන් පහළට නැමේ. බැක්ටීරියා හිටු මැරීමේ රෝගයට ඔරොත්තු දේ.

## දඹල

### ක්‍රිෂ්ණා

වසර පුරාම වගා කළ හැකි දම් පැහැති කරල් හටගන්නා ප්‍රභේදයකි. සිටුවා දින 50 - 55 පමණ කාලයකදී මල් පිපීම ආරම්භ වේ. භෝගයේ ආර්ථික ජීවිත කාලය දින 125 පමණ වේ. විභව අස්වැන්න හෙක්ටයාරයකට මෙ.ටො. 25 පමණ වේ.

## තක්කාලි

### ලංකා සවර්

දේශීය ආහාර සැකසීමේ රටාවට ගැලපෙන ආකාරයේ වැඩි ඇඹුල් රසකින් යුතු පඳුරක් ලෙස වැඩෙන "ගොරකා" තක්කාලි ප්‍රභේදයකි. බැක්ටීරියා හිටුමැරීමේ රෝගයට ප්‍රතිරෝධීය. ඉදුණු ගෙඩි තැඹිලි-රතු පැහැතිය, ග්‍රෑම් 122 පමණ බරය. හෙක්ටයාරයකට මෙ.ටො. 29 පමණ අස්වනු විභවයක් සහිතය.

### ටී-245

පඳුරක් ලෙස වැඩෙන බැක්ටීරියා සිටු මැරීමේ රෝගයට ඔරොත්තු දෙන ප්‍රභේදයකි. ගෙඩි ඉදෙන විට තැඹිලි රතු පැහැතිය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 85 පමණ වේ. තරමක් තද පොත්තක් සහිත නිසා ගෙඩි පැලීම හා ප්‍රවාහනයේදී සිදුවන හානි අඩුය. හෙක්ටයාරයකට මෙ.ටො. 20 පමණ අස්වැන්නක් ලබා දේ.

### මහේෂි

දේශීයව නිපදවා ඇති දෙමුහුන් තක්කාලි ප්‍රභේදයකි. ඉදුණු ගෙඩි රතු පැහැතිය. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 125 පමණ වේ. ගෙඩිවල පොත්ත තද නිසා ප්‍රවාහනයේදී සිදුවන හානි අඩුය. හෙක්ටයාරයකට මෙ.ටො. 55 පමණ අස්වැන්නක් ලබාගත හැකිය.

### භාතිය

දේශීයව නිපදවා ඇති දෙමුහුන් තක්කාලි ප්‍රභේදයකි. බැක්ටීරියා හිටු මැරීමට ඔරොත්තු දේ. ඉදුණු ගෙඩි රතු පැහැතිය. පොත්ත ඝනකමය. දිලිසෙන සුළුය. ප්‍රවාහනයේදී සිදුවන හානි අඩුය. හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 60 පමණ අස්වනු විභවයක් සහිතය.

### කේ.සී. 1

වැඩි පරිසර උෂ්ණත්වයක් පවතින වියළි කලාපයේ වසර පුරා සාර්ථකව වගා කළ හැකි ප්‍රභේදයකි. ග්‍රෑම් 55 පමණ බර ගෙඩි, ඉදෙන විට තැඹිලි රතු පැහැතිය. පඳුරක් ලෙස වැඩෙන අතර, ශාකය උසින් අඩු නිසා ආධාරක සිටුවීම අවශ්‍ය නොවේ. හෙක්ටයාරයකට මෙ.ටො. 25 පමණ සාමාන්‍ය අස්වැන්නක් ලබාගත හැකිය.

## National Digitization Project

***National Science Foundation***

Institute : Department of Agriculture

1. Place of Scanning : Department of Agriculture, Peradeniya
2. Date Scanned : 2018-01-25
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : G.E.P. Dilshan

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief Librarian

Name : Saumya Upamalika

Signature : ..........

Date : 2018-01-25

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*